ක්ෂණ භංග දැකීම, ථේරවාදය හා විපස්සනාව

සම්පාදක

පූජ්‍ය බෙල්ලන්විල ධම්මානන්ද හිමි

ක්ෂණ භංග දැකීම, ථෙරවාදය හා විපස්සනාව

බෙල්ලන්විල ධම්මානන්ද හිමි

ක්ෂණ භංග දැකීම, ථේරවාදය හා විපස්සනාව

© බෙල්ලන්විල ධම්මානන්ද හිමි

ප්‍රථම මුද්‍රණය : 2023

ISBN 978-624-93161-0-2

කතු හිමියන්ගේ වෙනත් කෘති

- සම්මා සතිය නිරවුල්ව
- අභිධර්මය නොවන අභිධර්මය
- මුල් බුදු සමය සොයාගත්තෙමි
- වේදනානුපස්සනාව

වළගම්බා සෙනසුන
ඒරියාව
අඹන්පොළ
කුරුණෑගල

දුරකථන : - 0713808220 valagamba.net

මුද්‍රණය

SRIDEVI

ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් 27 , පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන : 0112716709

පිදුම

සද්ධර්මය ත්‍රිපිටකය පුරා විසිර පවත්නේය. ග්‍රන්ථාරූඪව කොතරම් ධර්මය තිබුණත්, භාෂාව දැනගත් පමණින් කෙනෙකුට දහමේ එන ගැඹුරු කාරණා අවබෝධ කරගැනීම පහසු නැත. සමහර දහම් කාරණා කෙනෙකුට වැදගත් වනුයේ භාවනා කරන විටදීය. සමහරක් මුලදීම සිතට ගැනීම අවශ්‍යය. සමහර දහම් සිද්ධාන්ත කෙනෙකුට අදාල නොවන අවස්ථාද ඇත. සමහර දහම් කාරණා සියල්ලන්ටම අදාලය.

කෙටියෙන් දක්වා ඇති සමහර සූත්‍රයක එන කරුණක් තේරුම් ගැනීමට වෙනත් සූත්‍ර ගණනාවක දැනුම අවශ්‍යය. කෙනෙකුට බුද්ධිමය හැකියාව තිබුණත්, භාෂාවේ පරිචයක් නැති බැවින්, වටහා ගැනීමට අසීරු වන අවස්ථාද ඇත. කල්‍යාණමිත්‍ර සම්පත්තියේ වටිනාකම, ආචර්යවරයෙකුගේ මඟ පෙන්වීමක අවශ්‍යතාවය, මේ නිසා වඩාත් මතුවේ. බුදු සසුනේ පහළ වූ නොයෙක් ආචාර්යවරු, පුරාණ තෙරුන් වහන්සේලා, අන් අයගේ පහසුව තකා ත්‍රිපිටක ධර්මය විවිධ අයුරින් සංග්‍රහ කළෝය. සංෂිප්ත කළෝය. තවදුරටත් විස්තර කළහ. පාලි භාෂාවේ වචනයන්ට සරළ අර්ථ විග්‍රහයන් ඉදිරිපත් කළහ.

මේ අකාරයට ත්‍රිපිටකයට අර්ථකථා බිහිවිය. එම අර්ථකථාවල වැදගත්කම දුටු පසුකාලීන තෙරවරු ඒවාට ටීකා ලියූහ. එම ටීකාචාර්යවරු අතර අභිධර්මයට මූලටීකා ලියූ ආනන්ද තෙරුන් වහන්සේ විශේෂත්වයක් ගනී. එම තෙරුන් ලියූ ටීකාවල ගැඹුරු විවරණ ඔස්සේ උන්වහන්සේගේ ඥාණ කෞෂල්‍ය ගැන අදහසක් ගත හැක.

ථේරවාද භික්‍ෂු පරපුරේ හිමිනමක් සැටියට ථේරවාද දහම් සිද්ධාන්ත වලට යම් පමණකට සීමාවී අර්ථ විවරණ සැපයීමට උන්වහන්සේට සිදුවූවත්, විටෙක එම සීමාවන්හි උපරිමයකට යමින් ථේරවාද මූලික ධාරාවට එහා ගිය කරුණු දැක්වීමට උන්වහන්සේ එඩිතරවූ බවක් පෙනේ.

මේ බව පිළිබිඹු වන එක්තරා සුවිශේෂී අර්ථ විවරණයක් ධම්මසංගණි මූලටීකාවේදී හමුවේ. එතැනදී පඤ්ඤත්ති යන වචනයට අර්ථ දෙයාකාරයක් දැක්වීම දෝෂ සහගත බව උන්වහන්සේ පෙන්වා දෙයි.

අද කාලයේ අභිධර්මය හදාරන්නන් මුලින්ම ඉගෙනගන්නේ පරමාර්ථ සම්මුති කථාවයි. එය අභිධර්ම පිටකය ආරම්භයේදී ඍජුව සඳහන් නොවූවකි. අභිධර්ම කරුණු, මූලික සිද්ධාන්ත තේරුම් ගත් ආකාරය අනුව පුරාණ ආචාර්යවරු ගොඩනැගූ ක්‍රම වේදයකි. ධර්ම කරුණු ගොනු කරගන්නා ආකෘතියකි. එහි සම්මුති යන්නට ථේරවාද අභිධර්මයේ දුන් වචනය "පඤ්ඤත්ති" යන්නයි.

පඤ්ඤත්ති යන්නෙන් අභිධර්ම පිටකය තුල නිර්වචනය වූයේ වාග් ව්‍යවහාර, නාමකරණය සම්බන්ධවය. නමුත් ථේරවාද අභිධර්ම ව්‍යාප්තිය තුල, විශේෂයෙන් අර්ථකථාවලට පසු යුගයේ, සැබෑවට විද්‍යාමාන නොවන, හුදු සංකල්පමීය දේවල් හෝ පරමාර්ථ නොවන ධර්ම සඳහා එම වචනය භාවිතා වීමට පටන් ගැණින. මෙසේ අර්ථ පඤ්ඤත්ති, නාම පඤ්ඤත්ති, ලෙස දෙයාකාරව එම වචනය නිරූපණය වීම නිසා පසුකාලීන ටීකා තුල අවුල් ජාලයක් පැන නැගුණි. එම දෙයාකාරයේ අර්ථ එකිනෙකට පටලවා ගැනිමක් සිද්ධ වුණා. සංකර වීමක් සිද්ධ වුණා.

අනාගතයේ සිදුවන්නට යන අවුල් ජාලය දුටු නිසාදෝ මූලටීකා ආචාර්යයන් වහන්සේ ධම්මසංගණී මූලටීකාවේ පිටු ගණනක විස්තරයක්, එලෙස දැක්වීමේ දෝෂ දක්වමින් ලියා තිබෙනවා. නමුත් එය ථේරවාද අභිධර්ම මූලික ධාරාවේ එතරම් ගණන් ගැනුණු බවක් පෙනෙන්නට නැහැ.

අවසානයේ සිදුවූයේ අද ථේරවාද සිංහල අභිධර්ම කෘතිවල තිබෙන, අවුල් සහගත පරමාර්ථ සම්මුති කථාවකට තුඩු දීමයි.

මෙම කෘතිය විශේෂයෙන් අභිධර්ම මූලටීකා ආචාර්යයන් වහන්සේ වන ආනන්ද තෙරුන් වහන්සේට උපහාරයක් වේවා! එම තෙරුන් වහන්සේගේ ඤාණ කෞශල්‍යයට තුති පඬුරක් වේවා!

පිං පැමිණවීම

මෙම කෘතිය සකස් කළේ 2023 වස්සාන සමයේ දීය. වළගම්බා සෙනසුනේදීය. කෘතියට අදාළ සටහන් තබමින් කෘතියේ අවසානය දක්වාම ඉතා උනන්දුවෙන් සහය වූ රාජාංගනේ කෝලිත හිමියන් සහ සෝහිත හිමියන් විශේෂයෙන් සිහිපත් කෙරෙනවා. ඔවුන්ට නිවන් පිණිසම මේ කුසලය හේතු වේවා!

නවවන උපන්දිනය සමරන **සුහස් සස්මිත** පුතණුවන්ට දිගාසිරි පතා **සුපුන් පෙරේරා** හා **අනෝජා හසන්ති** දෙපල විශේෂයෙන් මෙම කෘතිය මුද්‍රණයට දායක විය.

වසර 17කට පෙර මියපරලොව ගිය **නිමල් කිත්සිරි** පියතුමන්ට පිං පැමිණවීමද විශේෂයෙන් ඔවුන්ගේ අරමුණ විය.

එම සියළු සම්‍යක් ප්‍රාර්ථනා සඵල වේවා! නිවන් පිණිසම හේතු වේවා!

තවද **අමිල ජයසේකර, ඩබ්. එම්. පුංචි බණ්ඩා, මහේන්ද්‍ර අමුණුගම, නිහාල් ලියනගේ, චතුර වික්‍රමරත්න, ලසිත මලලසේකර** යන මහත්වරුන්ද **පතිරාජ පවුලේ සියලු දෙනාත්** මෙම කෘතිය මුද්‍රණයෙහිලා දායකත්වය දැරීය. විදර්ශනා ඥාන දියුණු කරගෙන උතුම් අවබෝධය වෙත ලංවීමට එම සියළු දෙනාට මෙම ධර්ම දානමය පිංකම හේතු වාසනා වේවා!

මෙය මුද්‍රණය කරදුන් **ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් ආයතනයටත්** යතුරු ලියනයෙන් හා පොත නිමාවට සහය වූ එම ආයතනයේ කාර්යමණ්ඩලයටත් විශේෂ ස්තුතිය පිරිනැමෙනවා.

මෙම මුද්‍රණයේ බහුතර පිටපත් ප්‍රමාණයක් ධර්ම දානයක් ලෙසින් පිරිනැමෙන අතර සීමිත පිටපත් ප්‍රමාණයක් පොත්හල් වලින් ලබාගැනීමට සලස්වා ඇත.

පෙරවදන

නිවන් මාර්ගයේ ගමන් කිරීමට උත්සාහවත් වන ශ්‍රාවකයෙකු, තමාට දැනගන්නට ලැබෙන දහම් කරුණු සම්බන්ධයෙන් වටහා ගතයුතු වැදගත් කරුණක් ඇත. එනම් භාග්‍යවතුන් වහන්සේ පෙන්වාදෙන යම් ධර්මතාවයක් වේද, එය මාර්ගඵල ලැබීම උදෙසා කෙදිනක හෝ තමන් විසින් ප්‍රත්‍යක්ෂ කළ යුතු කරුණක් ද, නැතිනම් විශ්වාස කොට මතකයේ රඳවාගෙන ඊට අනුගතව කටයුතු සිදුකිරීම පමණක් ප්‍රමාණවත් වන දහම් කරුණක්ද යන්නය.

උදාහරණයක් ලෙස මව මැරීම, පියා මැරීම ආදී ආනන්තරිය පාපකර්මයක් යමෙක් කරන්නේද, ඒකාන්තයෙන්ම ඔහු ඊළඟ භවයේ අපාගත වන බව බුද්ධ දේශනාවේ සඳහන් වේ. එය ශ්‍රාවකයෙකුට ප්‍රත්‍යක්ෂ කළ නොහැකි කාරණයකි. ප්‍රත්‍යක්ෂ කළද නිවන් මාර්ගය සඳහා එම ඥාණයේ අනිවාර්ය බවක් නැත. අවශ්‍යතාවයක් නැත. නමුත් ශ්‍රාවකයා එය විශ්වාස කොට, තමා අතින් එවන් පාපකර්මයක් සිදු නොවීමට වගබලා ගත යුතුය.

ප්‍රතිග්‍රාහකයාගේ ගුණවත් බව අනුව දානයේ ආනිසංස වැඩිවන බව දේශිතය. එයද ශ්‍රාවකයෙකුට ප්‍රත්‍යක්ෂ කළ නොහැක. විශ්වාස කොට තමා කරන පුණ්‍ය කටයුතු මහත් ඵල වීම සඳහා, යොදාගත යුතු ධර්මතාවයකි.

සංස්කාරයන්ගේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවය ගැන භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ආකාරයෙන් දේශනා කොට ඇත. ත්‍රිලක්ෂණය නොදුටු කිසිවෙක් මාර්ගඵල ලැබුවේ නැත. අනිත්‍යතාවය සම්බන්ධයෙන් ගත්කළ නොයෙකුත් දේශනා ත්‍රිපිටකය පුරාවට නොයෙකුත් ආකාරයෙන් විවිධ පැතිකඩ ඔස්සේ භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට ඇත. පසුකාලීනව බිහිවූ නොයෙක් ආචාර්යවරුද ඒ සම්බන්ධව නොයෙක් කරුණු දක්වා ඇත.

එම කරුණු අතරින් තමන් කවදා හෝ ප්‍රත්‍යක්ෂ කළයුත්තේ කුමක්ද? සෛද්ධාන්තික දැනුමක් පමණක් ලබාගතයුත්තේ කුමන කරුණු ගැනද, උපමාරූපකව තෙරුම් ගැනීමෙන් ප්‍රමාණවත් වන්නේ මොනවාද යැයි බුද්ධිමත් ශ්‍රාවකයා දැනගත යුතුය.

මෙම මහා පෘථිවිය දිනෙක කපුරු බෝලයක් දැවී ගියාක් මෙන් ඉතිරි නැතිව විනාශ වන බව අනාගතංස ඤාණයෙන් දැන දැක බුදුරජුන් වදාළේය. ධර්මතාවයන්හි අනිත්‍යතාවය දැකීම ශ්‍රාවකයෙකු අවශ්‍යයෙන්ම සපුරාලිය යුතු කරුණක් වුවත්, එම අනිත්‍යතාවය ගැන බුදුරජුන් වදාළ කරුණ, ශ්‍රාවකයෙකු විසින් ඒ අයුරින් ප්‍රත්‍යක්ෂ කළ යුතු නොවේ. වෙනත් ධර්ම න්‍යායක් තුලින් මහ පොළොවේ අනිත්‍යතාවය දැකගත යුතු බව නම් සැබෑය.

එම නිසා ධර්මයන්ගේ ක්ෂණ භංගුරත්වය ගැන, අනිත්‍යතාවය ගැන අසන්නට ලැබෙන කරුණු වලින්, කුමක් තමන් ප්‍රත්‍යක්ෂ කළ යුතුද? (මග ඵල ලැබීමට) කුමක් වඩාත් සිත යොමු කළ යුතුද, කුමක් ඇදහිය යුතුද, කුමක් උපමාරූපකව දැනට තේරුම් ගැනීමෙන් ප්‍රමාණවත් දැයි, ඤාණය සොයා යන ශ්‍රාවකයා දැන ගත යුතුය.

ඊට අත්වැලක් මෙම කෘතිය තුලින් ලැබෙනු ඇතැයි අපගේ විශ්වාසයයි.

සැළකිය යුතුයි

2024 සැප්තැම්බර් මස නැවත ශංසෝදනය කොට අර්ථය ලිහිල් වන සේ කිසිතැනක කරුණු එකතු කරන ලදී.

පටුන

1.	ථේරවාද අභිධර්මය	01
2.	පද සෝදන වාරය	07
3.	උත්පාදක්ෂණය හා භංගක්ෂණය	08
4.	යමක පාලිය	14
5.	ඛණය හෙවත් ක්ෂණය	17
6.	ඨිතිය හා ඨිතික්ෂණය	20
7.	ඨිතික්ෂණය පැනවුණු අයුරු	21
8.	සංඛත ලක්ෂණ තුන	27
9.	උප්පාදය	35
10.	වය	36
11.	හේතුඵල දහම හා අනිත්‍යතාවය	38
12.	කාලය	40
13.	ඨිතස්ස අඤ්ඤතත්තං	49
14.	චිත්තසමුට්ඨාන රූපයක පැවැත්ම	51
15.	සන්තති ඨිතිය	58
16.	නාම ධර්ම හා කර්මජ රූපවලට සීමාවූ ආයුෂය	61
17.	ජරතාව	67
18.	අනිත්‍යතාවය හා වෙනස්වීම	69
19.	උදය වය ඤාණය	71
20.	විපරිණාමය	74
21.	භංගානුපස්සනා ඤාණය	76
22.	සන්තතියක අනිත්‍යතාවය	80
23.	ථේරවාදයේ ධර්ම ඇදුතුව	83
24.	අවිනිශ්චිත කරුණු	87
25.	යෝජනා	89
26.	අධෝලිපි	91

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

මෙම කෘතියෙන් විස්තර කිරීමට බලාපොරොත්තු වන්නේ ථේරවාද අභිධර්මය තුල දක්නට ලැබෙන එක්තරා ගැටළුකාරි තත්වයක් ගැනයි. පටලැවිල්ලක් මෙන් දිස්වන කරුණක් ගැනය. සමහරක් විදර්ශනා ඥාණ කෙරෙහි අතිශයින් බලපාන කාරණයක් ගැනය.

සාමාන්‍යයෙන් පුරාණ ථේරවාද ආචාර්යවරු යම් ධර්ම කාරණයකට අර්ථ විවරණයක් ඉදිරිපත් කරන විට බොහෝ කරුණු සහිතවය, පදනමක් ඇතුවය, එසේ කරන්නේ. ත්‍රිපිටකයේ කරුණු වලට පරස්පරයක් නොවන විධියට, පූර්ව ආචාර්යවරුන්ගේ අදහස් වලට විරුද්ධ නොවන විදියටයි.

අද කාලයේ බොහෝ දෙනා ථේරවාද දහම් න්‍යායන්ට විරුද්ධව විවේචන කරන්නේ සීමිත කරුණු කිහිපයක් මතයි. බොහෝ කරුණු නොසලකා හරිමින්ය එසේ කරන්නේ. ඒවා බොහෝ විට ආවාට ගියාට කරන විවේචන. සමහර අය අභිධර්මය හදාරා නැති නිසා හෝ එය පිළිගන්නේ නැති නිසා හෝ ඒ ගැන සැකයෙන් බලන නිසයි තේරුමක් නැති විවේචන කරන්නේ. ථේරවාද ආචාර්යවරු අභිධර්ම දහම් පදනමක ඉඳලයි බොහෝ කරුණු ප්‍රකාෂ කරන්නේ.

ථේරවාද අභිධර්මය

නමුත් අභිධර්මයෙයි, ථේරවාද අභිධර්මයෙයි වෙනසක් තියෙනවා. වැඩිදුර කරුණු කියන්නට කලින් ථේරවාද අභිධර්මය හා අභිධර්මය යනුවෙන් අප කුමක් අදහස් කරන්නේ දැයි යම් පැහැදිලි කිරීමක් කළ යුතුව තිබේ. බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂ කිහිපයක් ඇතුළතම සඟ පරපුර බොහෝ නිකායන්ට බෙදී ගියේය. මෙම නිකායන් අතරින් සමහරක, ත්‍රිපිටකයේ කොටස් ගිලිහුණු අතර විටෙක බුද්ධ භාෂිත ලෙසින් අමතර සූත්‍රද එකතු වීම සිද්ධ විය. සමහර

විටෙක ත්‍රිපිටකයේ කොටස් ගිලිහුණු නිසාම නිකාය භේද ඇතිවිය. කුමක් නිසාද යත්, යම් දහම් කරුණකට අර්ථ විවරණ දීමේදී, ඒ ඒ ආචාර්යවරු තමන් වෙත ඇති ත්‍රිපිටකය හෝ එහි යම් කොටස් මත, එම තොරතුරු මත පදනම්වී ධර්ම විවරණයන් සිදුකරන බැවිනි. අදහස් දක්වන බැවිනි.

මෙම නිකායන් අතරින් ලංකාවේ අනුරාධපුර යුගයේ මහාවිහාරය මුල්කරගත් සඟ පරපුරේ ආචාර්ය මතයන් වඩාත් සුවිශේෂී බවක් පෙන්වයි. ඒ මුල් ධර්ම සංගායනා ත්‍රිත්වය තුලින් ගොනු වුණු බුද්ධ වචන ඇතුලත් ත්‍රිපිටකයම ඔවුන් සතුව ආරක්ෂා වීමත් බොහෝ පුරාණයේ සිට පැවත එන හෙළ අටුවා තුලින් පෝෂණය වූ දැනුම් සම්භාරයක් ඔවුන් සතුව තිබීමත් නිසාය. එම ත්‍රිපිටකය තුල සඳහන් නොයෙකුත් ධර්ම කරුණු හා ඒවා සමග සබැඳුණු නොයෙකුත් සිද්ධාන්ත හා න්‍යායන් විවරණය කළ එක්තරා සුවිශේෂී ආකාරයකට ථේරවාදය යැයි කියනු ලැබේ.

ථේර යනු බුදු සසුන තුල ස්ථිරභාවයට, ස්ථාවර භාවයට පැමිණි යන අදහසයි. දහම ගැන නිශ්චිත අදහසක්, පැලපදියම් වූ ආකල්පයක් ගොඩනැගුණු බවයි. එවන් අයගේ අදහස කියාපාන වචනය හෙවත් වාදය යන අරුතින් ථේරවාදය යැයි කියනු ලැබේ.

බුද්ධඝෝෂ හිමියන් විසින් හෙළ අටුවා මුල් කරගෙන සම්පාදනය කළ අර්ථකථාත් ඊට සමකාලීන යුගයේ වෙනත් තෙරුණ් වහන්සේලා ත්‍රිපිටකයේ අනෙකුත් කෘතිවලට සකස් කළ අර්ථකථාත්, එම අටුවා මුල් කරගෙන බිහිවූ ටීකා, අනුටීකා හා නොයෙකුත් සන්න යනාදිය තුලින් ථේරවාද මතය ඉදිරිපත් වේ.

එම තෙරවරු අභිධර්ම පිටකයේ සෘජුව සඳහන් නොවන යම් ධර්ම සිද්ධාන්තයක් හෝ එයින් ව්‍යුත්පන්න වූ න්‍යායක්, අභිධර්ම පිටකය විවරණය කිරීමේදී ඉදිරිපත්කොට

ඇත්ද, ඒවාට මෙම කෘතිය තුල ථේරවාද අභිධර්මය යැයි කියනු ලැබේ.

අද ලංකාවේ උපසපන් ස්වාමීන් වහන්සේලා බහුතරයකට ඇත්තේ ථේරවාද සඟපරපුරේ උපසම්පදාව වුවද ථේරවාද අභිධර්මය ගැඹුරින් හදාරමින්, එම න්‍යායන් මත සිට විදර්ශනා භාවනාව ගොඩනැඟීමට උත්සුක වන්නේ සුළු පිරිසකි.

ථේරවාද අභිධර්මය සිංහලෙන් බොහෝ දෙනා දැනගෙන ඇත්තේ රේරුකානේ චන්දවිමල මහ නාහිමියන්ගේ "අභිධර්මයේ මූලික කරුණු" හා "අභිධර්ම මාර්ගය" නැමැති කෘතිවලිනි. එම කෘතීන්වල සැකැස්ම ගොඩනැගී ඇත්තේ ථේරවාද අභිධර්මයේ ප්‍රචලිතව ඇති අභිධර්මාර්ථ සංග්‍රහය නැමැති කෘතිය මුල්කරගෙනය. අභිධර්ම පිටකයේ සඳහන් නැති ථේරවාද අභිධර්මය තුල පමණක් දක්නට ලැබෙන කාරණා කිහිපයක් මෙසේය.

- සෑම චිත්තයකම ආයුකාලය සමාන ලෙස දැක්වීම.
- සෑම රූපයකම ආයුකාලය සමාන ලෙස දැක්වීම.
- රූපයක ආයුකාලය චිත්තක්ෂණ 17 ලෙස දැක්වීම.
- නාම-රූප ධර්මවලට වෙන්වූ ඨිතික්ෂණයක් දැක්වීම.
- රූප කලාපයක ඨිතියට පැමිණි තේජෝ ධාතුවෙන් යාබද රූප කලාප ගොඩනගන බව.
- චිත්ත වීථි සම්බන්දයෙන් ගත් කළ ජවන වාර 7ක් ඇතිබව.
- පරමාර්ථ හා සම්මුති (පඤ්ඤත්ති) ලෙස ධර්මයන් දෙකොටසකට බෙදා දැක්වීම.
- පඤ්ඤත්ති යන්නට අර්ථ පඤ්ඤත්ති, නාම පඤ්ඤත්ති ලෙස දෙයාකාරයක් දැක්වීම.

සමහර කෙනෙක් හිතන්න පුළුවන් අටුවා ටීකාවල තියෙන්නේ අභිඤ්ඤාලාභී රහතන් වහන්සේලා බුදු හිමියන්ගේ අධ්‍යාශය දැන කියූ කරුණුවල එකතුවක් කියලා. ඇත්තෙන්ම අටුවාචාරීන් වහන්සේවත් එහෙම අදහසක ඉඳලා නැහැ. උන්වහන්සේ අටුවා ලිවීමට පාදක කරගත්තේ හෙළ අටුවාවන්ය. එම හෙළ අටුවාවල සමහර කරුණු, ත්‍රිපිටක පාලියේ උද්ධෘත අරගෙන, බුදුගොස් හිමියන් විසින් ප්‍රතික්ෂේප කරපු අවස්ථා විටෙක දකින්නට ලැබෙනවා. හෙළ අටුවාවල වචනයක් වචනයක් පාසා තිබෙන්නේ බුද්ධ වචන කියලා හිතන කෙනෙක් එහෙම කරන්නේනෑ. සමහර විවරණ ඉදිරිපත් කරද්දී උන්වහන්සේ "පැරැන්නෝ " මෙහෙම කීවා කියලා දක්වලා තිබෙනව. බුද්ධඝෝෂ හිමියන් බුදුරජාණන් වහන්සේට "පැරැන්නෝ " කියලා ආමන්ත්‍රණය කරයි කියලා හිතන්න අමාරුයි.

කෙසේ හෝ ථේරවාද ආචාර්ය පරම්පරාවක පිළිගත් කාරණා නිසාත්, ඒවා විදර්ශනාවේ ගැඹුරට විහිදීයන කාරණා නිසාත්, ඒවා විවරණය කරද්දී, ත්‍රිපිටකයේ විශේෂයෙන් අභිධර්ම පිටකයේ බොහෝ මූලාශ්‍ර සහිතව විග්‍රහ කරගත යුතු වෙනවා. සමහර යමක පාලියේ එන උද්ධෘත කාරණා කෙනෙකුට තේරුම් ගන්න අමාරුවෙන්න පුළුවන්. නමුත් ඔහුට ඒවායේ නිගමන පමණක් හිතට අරගෙන කෘතියේ ඉදිරියට යා හැකියි.

ථේරවාද අභිධර්මය තුළ නාම රූප ධර්මවල සියුම්ව අනිත්‍යතාවය සැලකීමේදී ඊට සම්බන්ධව උප්පාදක්ඛණ, ඨීතික්ඛණ, භංගක්ඛණ යන කාරණය සම්බන්ධවන ආකාරයත් එම කරුණු පිළිබඳ විග්‍රහය ඔස්සේ විපස්සනාවට ඉතාමත් වැදගත් වන ධර්මතා කිහිපයක් එළිදැක්වීමට ඉදිරියේදී බලාපොරොත්තු වනවා.

ත්‍රිපිටක අභිධර්මය තුළ නාම-රූප ධර්ම සම්බන්ධව මෙලෙස ක්ෂණ තුනකින් විස්තර කිරීමක් සෘජුව සඳහන් නොවන බැවින්, ඒ සම්බන්ධව ථේරවාදය තුළම ප්‍රධාන වශයෙන් මත දෙකක් ඇති බව ගැඹුරින් ථේරවාද අභිධර්ම න්‍යායන් හැදෑරූ අය දනිති. මෙහි පළමු මතය වනුයේ,

01. බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ හා ඊට අනුගත වූ ටීකා ආචාර්යයන් වහන්සේලා නාම හා රූප සම්බන්ධව දැක්වූ, ඒවායේ ආයු කාලය කොටස් තුනකට බෙදා එනම් උප්පාද, ඨිති, භංග ලෙසින් ඉදිරිපත් කළ ආකෘතියයි.

02. අභිධර්ම මූලටීකා ආචාර්ය ආනන්ද තෙරුන් වහන්සේ විසින් නාමරූපවලින් නාමධර්ම සම්බන්ධව උප්පාදක්ෂණය හා භංගක්ෂණය පමණක් සැලකිය යුතු යැයි ද, රූප ධර්ම සම්බන්ධව ඊට අමතරව ඨිතික්ෂණයද ඇති බව පිළිගන්නා දෙවන ආකෘතියයි.

මෙම මත දෙක අතරින් ථේරවාද මූලික ධාරාවට අනුව අද වඩාත් සඳහන් වනුයේ පළමු මතයයි. ථේරවාදය තුල පිහිටි මූලටීකා ආචාර්යයන් වහන්සේ බුදුගොස් තෙරුන් වහන්සේගේ මතය දැන දැනත් එම මතය බිහිවීමට පුරාණ හෙළ අටුවා සම්බන්ධ බව දැන දැනත්, ඊට වෙනස් මතයක් දැරූයේ නිකරුණේ නොව යමකප්පකරණයේ ඇති කාරණා මුල් කරගෙනය. විශේෂයෙන් සංඛාරයමකයේ සහ චිත්ත යමකයේ සෘජුවම පෙනෙන කාරණා මුල් කරගෙනය.

මෙම මත දෙකට පසුබිම් වූ කාරණා මෙම කෘතියෙන් විග්‍රහ කිරීමට අප බලාපොරොත්තු වන නමුත් ඊට පෙරාතුව උත්පාද, ක්‍ෂණ භංග ආදී කරුණු විපස්සනාවට භාවනාවට කොතරම් වැදගත් දැයි, කොතරම් සම්බන්ධ දැයි පළමුවෙන්ම තේරුම් ගත යුතුය. එනම් මෙය සෛද්ධාන්තික හැදෑරීමකට

එහා ගිය ප්‍රායෝගික විපස්සනා භාවනාමය අර්ථයක් ඇතියක් බව වටහා ගත යුතුය.

සිතකට පවතිනුයේ ක්‍ෂණ 02ක්ද නැතිනම් 03ක්ද යන්න ඔප්පු කරනවාට වඩා, එම මත 02 කට පසුබිම් වන කරුණු පිළිබඳ විග්‍රහය ඔස්සේ විපස්සනාවට ඉතාමත් වැදගත් වන ධර්මතා කිහිපයක් දිගහැරීමට අප බලාපොරොත්තු වනවා.

විපස්සනාවේ පසුබිම අනිත්‍යසංඥාව මත අනිත්‍යතාව පිළිබඳ හැඟීම මත පිහිටා ඇත. ධර්මයන්ගේ අනිත්‍යතාවය සමග නාම - රූපයන්ගේ උප්පාද වය ආදී ලක්ෂණ සෘජුවම සම්බන්ධය. ඒ නිසාය අප මෙම කෘතිය සැකසීමට විශේෂයෙන් උනන්දු වූයේ. එනම් මෙම කරුණු කාරණා හරියාකාරව තේරුම් ගැනීම යෝගාවචරයෙකුට විපස්සනාවේ අඩිතාලම් මනාව දමා ගැනීමට අතිශයින්ම වැදගත්ය. අනිත්‍යතාව නොදුටු කිසිවෙක් මගඵල ලැබුවේ නැත.

පංචස්කන්ධය යමෙක් අනිත්‍ය ලෙස දකීනම් ඔහු සම්මත්ත නියාමයට හෙවත් සෝවාන් මාර්ගයට බැස ගන්නා බව දහමෙහි සඳහන් වෙයි. ලොව සත්‍ය වශයෙන් ඇත්තේ, හටගන්නේ, නාමරූප ධර්මයන් නිසා, යම් අනිත්‍යයතාවයක් වේද එය නාම රූප තුලන් පිළිබිඹු විය යුතුය. නාමරූපවල ක්ෂණ භංග, අනිත්‍යතාව පිළිබඳ හැඟීම සමග සම්බන්ධ වන ආකාරය ඉදිරියේදී ක්‍රමයෙන් පැහැදිලි කිරීමට බලාපොරොත්තු වෙමි.

ක්ෂණ භංග ගැන විවරණය කිරීමේදී බොහෝ අවිනිශ්චිත තොරතුරු සමුදායක් ඉදිරිපත් කිරීමට සිදුවේ. සමහර දෑ කීමට සිදුවනුයේ අවිනිශ්චිත උපකල්පන මතය. මෙම කෘතියේ මුල් පරිච්ඡේද වලින් අවිනිශ්චිත තොරතුරු ඉදිරිපත් කරනුයේ අවසානයේ නිශ්චිත පිළිතුරක් අපට ඉදිරිපත් කළ හැකි යැයි විශ්වාසය මතය.

පද සෝදන වාරය

ඉදිරියේ එන කරුණු තේරුම් ගැනීම සඳහා සමහර පාලි වචනයන්හි අර්ථයන් පිළිබඳ නිශ්චිත දැනුමක් ලබා තිබීම වඩාත් උපකාරී වන බැවින් පද සෝදන වාරයක් කෙටියෙන් දක්වනු ලැබේ. ඉදිරියට හමුවන සමහර වචන සමීප අර්ථ සහිත නිසාය.

1. **නාම-රූප** - නාම යන්නෙන් සියළු මානසික ධර්ම, එනම් චිත්ත-චෛතසික ධර්ම මෙම කෘතිය තුල අදහස් කෙරේ. ඵස්ස, වේදනා, චේතනා, සංඥා, මනසිකාර යන 5ට පමණක් එය සීමා නොවේ. රූප යන්නෙන් සතර මහාභූතත්, සියළු උපාදාය රූපත් අදහස් කෙරේ.
2. **උප්පජ්ජති** - ගොඩනැගෙමින්, හටගනිමින්, වැඩෙමින් යන අර්ථයි
3. **නිරුජ්ඣති** - දුර්වල වෙමින්, හීනවෙමින් යන අර්ථයි
4. **උප්පාදෝ** - හේතු සමාවායෙන් පෙර නොතිබුණු ධර්මයක විද්‍යාමාන වීම, හටගැනීම
5. **වයෝ** - හේතු නැතිවීමෙන් විද්‍යාමාන නොවීම. නොපැවැත්ම (ථේරවාදය තුල නැසීම, නැතිවී යාම, විනාශය වැනි අර්ථ දේ)
6. **සමුදය** - හේතු සහයෝගයෙන් උදාපත්වීම
7. **උප්පාදක්ඛණ** - උත්පාදක්ෂණය - නාම-රූප ධර්මයන් හටගනිමින්, වැඩෙමින් පවතින අවස්ථාව
8. **භංගක්ඛණ** - භංගක්ෂණය-නාම-රූප ධර්මයන් හීනවෙමින්, දුර්වල වෙමින් පවතින අවස්ථාව
9. **ඨිතස්ස අඤ්ඤතත්තං** - සිටියහුගේ අන්‍යාකාරයක්
10. **ඨිති** - සිටීම, පවත්නා බව
11. **උප්පන්න** - නාම-රූප ධර්මයක් හටගෙන නොනැසී

පවතනා බව. වර්තමානයේ විද්‍යමාන වන බව.

12. **පච්චුප්පන්න** - ප්‍රත්‍ය සහයෝගයෙන් එසේ උප්පන්න බව

13. **ඛණය** - ක්ෂණය - අවස්ථාව - හේතු මනාව පිහිටි බැවින් යම් ධර්මයක මතුව ඒමට හෝ ගොඩනැගීමට සුදුසුම අවස්ථාව (පසුකාලීනව ඉතා කුඩා ක්ෂණ මාත්‍ර කාලයක් මින් අදහස් විය)

14. **සංඛත** - හේතුන්ගෙන් සකස් වූ

15. **පඤ්ඤායති** - පැනවෙයි, විද්‍යමාන වෙයි

16 **ඨිතික්ෂණය** - අර්ථකථා තුලදී අදහස් කළ ක්ෂණත්‍රයෙන්, උප්පාද හා භංගක්ෂණ අතරෙහි පිහිටි ඒවායෙන් ස්වායත්ත වූ කොටස.

උත්පාදක්ෂණය හා භංගක්ෂණය

දැන් උප්පාද ඨිති හා භංගක්ෂණ ලෙසින් අටුවාචාරීන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේගේ අදහස යැයි හගිමින් සිත සම්බන්ධව ඉදිරිපත් කළ ආකෘතිය මුලින්ම සලකා බලමු. සිංහල පොත් වලින් අභිධර්මය හදාරා ඇතියෙකුට ඉහත කියමන තරමක් පටලැවිලි සහගත විය හැක. එසේ විය හැක්කේ එම චිත්තයක ආයුෂය බෙදී යන ආකාරය පිළිබඳ විග්‍රහය ඍජුවම පෙළ දහමෙහි එනම් විශේෂයෙන් අභිධර්ම පිටකයෙහි සඳහන් වූ බුද්ධ වචනයක් ලෙස සිතා සිටියා නම්ය.

එසේ නොවන නිසාමය ථේරවාදය තුලම, ථේරවාද න්‍යායන්ට අනුගත වූ ආචාර්යවරුන්ට අනුව පෙර සඳහන් කළ පරිදි මත දෙකක් ඉදිරිපත් වූයේ.

මුලින්ම බුදුගොස් තෙරුන්ගේ මතය සැලකූවිට, එනම් නාමරූප ධර්මයන්ගේ ආයුෂය කොටස් තුනකට බෙදා තේරුම් ගැනීම සලකා බලමු. එම මතයට අනුව, ඕනෑම චිත්ත

චෛතසික ධර්මයක මුලින්ම හට ගැනීමේ අවස්ථාවක් එනම් උප්පාදක්ෂණයක්, අවසානයේ නැතිවී යන අවස්ථාවක් එනම් භංගක්ෂණයක්, ඒ දෙක අතර කාලය ඨිතික්ෂණයක්, ලෙසත් සඳහන්වේ. ඨිති අවස්ථාව ලෙස සාමාන්‍යයෙන් අටුවා යුගයේ දී අදහස් කළේ, ධර්මයක් හට ගැනීමෙන් අනතුරුව යම් මට්ටමක ස්ථාවරව නමුත් ජරාවට හෙවත් පරිපාකයට යමින් පවත්නා කාල වකවානුව ය. මෙම කාල වකවානු තුනම නාම ධර්ම සම්බන්ධයෙන් ගත්කල සමාන ලෙසත් දක්වා ඇත. පහත ප්‍රස්ථාරයෙන් තවදුරටත් මෙය පැහැදිලි වනු ඇත.



ඉහත ප්‍රස්ථාරයේ නාමධර්ම යන්නෙන් ඕනෑම චිත්ත චෛතසිකයක් නිරූපණය කළ හැකිය. පෙර නොතිබුණා වූ මානසික ධර්මයක් ක්‍රමයෙන් හටගෙන කාලානුරූපව එය නැති වී යන ආකාරය මෙම ප්‍රස්ථාරයෙන් දැක්වේ. උදාහරණයක් ලෙස නාම ධර්මයක් ලෙස දුක්ඛ වේදනාව ගතහොත් මෙම ප්‍රස්ථාරයේ උච්චතම අවස්ථාව වන එ ලක්ෂයෙන් දුක්ඛ වේදනාවේ උපරිම මට්ටම දක්වනු ලැබේ.

එනම් යම් සත්වයෙකුට දුක් වේදනාවක් හටගෙන නැතිවී යන කාල පරාසය තුළ එය උපරිම ලෙස වින්ද බව දැක්වෙනුයේ එම ලක්ෂයෙනි. අටුවාචාරීන් වහන්සේලාගේ මතයට අනුව මෙහි තිරස් අක්ෂයෙන් කාලය ගතවීම දැක්වෙන නමුත් එසේ දක්වා ඇත්තේ තේරුම් ගැනීමේ

පහසුව තකාය. අනෙක් අතට අටුවාචාරීන් වහන්සේ අදහස් කළ සිතක ආයුෂ සම්බන්ධ ආකෘතියට අනුයාත වන ලෙසය. ඇත්තෙන්ම මේ සඳහා කාලය නොව වෙනත් ධර්මතාවක් සුදුසු බව පසුව එන විග්‍රහයන්හිදී දක්වන්නෙමි. අටුවාචාරීන් වහන්සේ ඇතුළු බොහෝ ථේරවාද ආචාර්යවරු අදහස් කළේ කුමක්දැයි සංයුක්ත නිකායේ ඛන්ධ වග්ගයේ පඨම ආනන්ද සූත්‍රයට අදාල අට්ඨකථා කොටසින් හැදෑරිය හැක.

රූප ධර්මයන් සඳහා මෙම ප්‍රස්ථාරයේ ආකාරය තරමක් වෙනස් වේ. අටුවාචාරීන් වහන්සේ රූපයක ආයු කාලය චිත්තක්ෂණ දාහතක් වන බව සඳහන් කොට ඇත. එය අභිධර්ම පිටකයෙහි සඳහන් නොවන කරුණකි. උන්වහන්සේ අටුවා ලිවීමට පාදක කරගත් හෙළ අටුවා තුලින් භාග්‍යවතුන් වහන්සේගේ අදහස ලෙස ඉදිරිපත් වූ කරුණකි.

රූපයක ආයු කාලය චිත්තක්ෂණ (17) ක් යැයි පවසන විට එයින් ගම්‍ය වන කරුණු දෙකක් ඇත. එකක් නම් සෑම සිතක්ම සමාන ආයු කාලයක් පැවත නැතිවී යන බවයි. කුසල, අකුසල, අබ්‍යාකත වශයෙන් ප්‍රභේද වන, නොයෙක් විට හටගන්නා සෑම සිතක් ම සමාන ආයු කාලයක් පැවතී බිඳී යා යුතුය. ථීනමිද්ධයට බරවූ දුර්වල අකුසල සිතක් වේවා ධ්‍යාන මට්ටමේ ප්‍රබල සමාධියකදී පවතින බලවත් කුසල සිතක් වේවා සමාන ආයු කාලයකින් බිඳී යා යුතුය. බලවත් වර්ණ රූපාරම්මණයක හටගන්නා චක්ඛු විඤ්ඤාණයක්, අඳුරු අවස්ථාවක හටගන්නා, එනම් දුර්වල ආරම්මණයක් ඔස්සේ හටගන්නා චක්ඛුවිඤ්ඤාණයක් සමඟ සම ආයුෂ තිබිය යුතුය.

මෙසේ නොවන්නට රූපයක ආයු කාලය චිත්තක්ෂණ දාහතක් යැයි කීම ගණිතමය දෝෂයක් මතු කරනු ඇත. දෙවනුව ගම්‍ය වන කරුණ වනුයේ සෑම රූපයක ආයු කාලය ද සමාන විය යුතු බවයි. ප්‍රබල හේතුන්ගෙන් හටගත් රූපයක් හෝ දුර්වල හේතුන්ගෙන් හටගත් රූපයක් හෝ වේවා, කර්මජ,

ඍතුජ හෝ ආහාරජ රූපයක් වේවා සමාන කාලයක් ඇතුලත බිඳී යා යුතු බවයි.

ඉහත කරුණු දෙක එක විට සැලකූ විට නාම හා රූපවල ආයු කාලය නිශ්චිත බවක් පෙන්නුම් කරයි. වෙනත් අයුරකින් කිවහොත් අතීත, අනාගත, වර්තමාන ඕනෑම නාමරූප ධර්මයක ආයු කාලය සම්බන්ධයෙන් ගත් විට පොදු විශ්වීය ධර්මතාවයකට යටත් බවයි.

මේ අනුව රූප සම්බන්ධ ප්‍රස්ථාරය මෙසේ විය යුතුයි.



රූපයක ඨිතික්ෂණය චිත්තක්ෂණ (16)[1] පමණය. මේ අනුව රූපයක උප්පාද හා භංගක්ෂණයට වඩා ඨිතික්ෂණය දිගුය. මූලටීකා ආචාර්යයන් වහන්සේට අනුව චිත්ත චෛතසික හෙවත් නාම ධර්ම සඳහා උප්පාද හා භංගක්ෂණය සරලව මෙසේ ප්‍රස්ථාරයකින් නිරූපණය කළ හැකිය.



[1] . අධෝ ලිපි බලන්න

ඉහත ඨිතික්‍ෂණයක් දක්වා නැත.

පෙර සදහන්කළ ඨිතික්‍ෂණයත් සමග අවස්ථා 3 කින් දැක්වීමේදී අදහස් කරනුයේ ධර්මයක් උප්පාදක්‍ෂණයේදී හරියට ගොඩනැගී නැති බවකි. එහි ආකාරය මනාව සැකසී නොමැති බවකි. එසේම භංගක්ෂණයේදී කැඩී බිඳී යන බවකි. විශාලනය කරනලද උදාහරණයකින් දැක්වුවහොත් මවුකුසක අඟපසඟ මනාව නොවැඩුණු ගොඩනැගෙමින් පවතින කළල අවස්ථාව උප්පාදක්‍ෂණය මෙනි. මරණයට ඉතා ආසන්නව ශරීරයේ වේගයෙන් සිදුවන විකෘතිය, බිඳීයාම භංගක්ෂණය මෙනි. අතර කාලය ඨිතික්‍ෂණය මෙනි.

නමුත් ක්‍ෂණ දෙකකින් ධර්මතාවයක පැවැත්ම සැළකීමේදි, එහි උප්පාදක්ෂණයේ මුලසිටම ගොඩනැගී ඇති ලෙසට සැළකිය හැකිනමුත් වෙනසකට ඇත්තේ මුලදී දුර්වල මට්ටමක පවත්නේ යැයි සැළකීමය.

නාම හෝ රූප ධර්මයක ආයු කාලය අවස්ථා 3 කින් උත්පාද ඨිති භංග ලෙසින් නිරූපණය විය යුතු යැයි බැලූ බැල්මට හැඟෙන අතිශයින් වැදගත් සූත්‍ර දේශනාවක් ඇත. සංයුක්ත නිකායේ ඛන්ධ වග්ගයේ එන ප්‍රථම ආනන්ද සූත්‍රයේ මෙසේ සඳහන් වේ.

භාග්‍යවතුන් වහන්සේ එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්වාමීන් වහන්සේට මෙසේ වදාළ සේක. ඉදින් ආනන්දය ඔබගෙන් මෙසේ අසන්නේ නම් "ඇවැත්නි ආනන්දය කවර ධර්ම කෙනෙකුන්ගේ උත්පාදය පැනවේද? (උප්පාදෝ පඤ්ඤායති) වය පැනවේද? (වයෝ පඤ්ඤායති) සිටියහුගේ අන්‍යාකාරයක පැන වේදැයි? (ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති)" ආනන්දය මෙසේ විමසන ලදුව ඔබ කුමක් කියන්නෙහිද?.

ඉදින් ස්වාමීනී මගෙන් මෙසේ අසන ලද්දේ නම්, ඇවැත්නි ආනන්දයෙනි කවර ධර්ම කෙනෙකුන්ගේ ඉපදීම

පැනවේද, වය පැනවේද, සිටියහුගේ අන්‍යාකාරයක පැන වේදැයි, ස්වාමීනි එසේ විමසන ලදුව මම මෙසේ කියන්නෙමි. "ඇවැත්නි රූපයාගේ උත්පාදයක් පැනවෙයි, වය පැනවෙයි, සිටියහුගේ අන්‍යාකාරයක් පැනවේ. වේදනාවගේ උත්පාදයක් .... සංඥාවේ ...... සංස්කාරයන්ගේ ..... විඤ්ඤාණයාගේ උත්පාදය පැනවෙයි, වය පැනවෙයි , සිටියහුගේ අන්‍යාකාරයක පැනවෙයි. ඇවැත්නි මේ ධර්මයන්ගේ උත්පාදය පැනවෙයි, වය පැනවෙයි, සිටියහුගේ අන්‍යාකාරයක පැනවෙයි."

ස්වාමීනි, එසේ විචාරන ලදුව මම මෙලෙස ප්‍රකාශ කරන්නෙමි.

"මැනවි මැනවි ආනන්ද, රූපයාගේ ආනන්ද උත්පාදය පැනවේ, වය පැනවේ, සිටියහුගේ අන්‍යාකාරයක පැනවේ, වේදනාවේ ... සංඥාවේ ..... සංස්කාරයන්ගේ .... විඤ්ඤාණයාගේ උප්පාදය පැනවේ, වය පැනවේ, සිටියහුගේ අන්‍යාකාරයක පැනවේ. ආනන්දය එසේ විචාරන ලදුව ඔබ මෙලෙසින් කියන්නාහුය. "

ඉහත සූත්‍රයේ සඳහන් කළ අර්ථයම සංෂිප්තව ඉදිරිපත්වන තවත් වටිනා සූත්‍රයක් අංගුත්තර නිකායේ තික නිපාතයේදී හමුවේ. එනම් එහි චූලවර්ගයේ එන සත්වැනි සංඛත ලක්ෂණ සූත්‍රයේදීයි. එය මෙසේය,

"තීණීමානි භික්ඛවේ සංඛතස්ස සංඛත ලක්ඛණානි. කතමානි තීණි : උප්පාදො පඤ්ඤායති , වයෝ පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති. ඉමානි ඛො භික්ඛවේ සංඛතස්ස සංඛත ලක්ඛණානි.

මහණෙනි, ප්‍රත්‍යයෙන් සකස් වූ දෙයෙහි මෙම සංඛත ලක්ෂණ තුනෙකි. (සකස් වීමේ ලක්ෂණ තුනකි). කවර තුනක්ද යත් : උත්පාදය පැනවේ, වය පැනවේ, සිටියහුගේ

අන්‍යාකාරයක පැනවේ. මහණෙනි ප්‍රත්‍යයෙන් සකස් වූ දෙයෙහි මෙම සංඛත ලක්ෂණ තුනයි."

බැලූ බැල්මට ඉහත සූත්‍ර දෙකෙන් අටුවාචාරීන් වහන්සේ අදහස් කළ උප්පාද ඨිති භංග යන ක්ෂණත්‍රය නාමරූප ධර්මයන්ට අදාලව පිළිබිඹු වන්නාක් මෙන් දිස්වේ.

නමුත් මෙතැනදී විමසා බැලිය යුතු කාරණය වනුයේ උප්පාද යන පාලි වචනයෙන් උප්පාදක්ඛණය හෙවත් උත්පාදක්ෂණය නිරූපණය වන්නේද යන වගත්, වයෝ යන පාලි වචනයෙන් භංගක්ෂණය නිරූපණය වන්නේ ද යන වගත්, 'ඨිතස්ස අඤ්ඤතත්තං' යන්නෙන් ඨිතික්ෂණය නිරූපණය වන්නේ ද යන වගත්ය. "උප්පාදෝ පඤ්ඤායති" හා 'උප්පාදක්ඛණේ' යන පාලි වචනවල උප්පාදෝ හා උප්පාද ලෙසින් සමානත්වයක් දිස්වන නිසා කෙනෙකුට ඒවා එකම අර්ථයක් ගෙන දෙන වචන දෙකක් මෙන් වැටහීම සාධාරණය.

යමක පාලිය

සිතක් සම්බන්ධව ගත් විට උප්පාදක්ඛණ භංගක්ඛණ යන වචන භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙන්ම දේශනාවන තැන හමුවනුයේ අභිධර්ම පිටකයේ යමකප්ප්‍රකරණයේදීය. යමක යන වචනයෙහි තේරුම යුගල යන්නයි. නොයෙකුත් නාමරූප ධර්මතා යුගල් වශයෙන් ගෙන ඒවායේ හට හටගැනීම නැති වී යන ආකාරය, එම හටගැනීම් හෝ නැතවීම් සමපාත හෝ සමපාත නොවන අවස්ථා යමකප්ප්‍රකරණයෙදී විස්තර වේ. ධර්මයන්ගේ අනිත්‍යතාව, වෙනස් වන බව ඉස්මතුකරවන ප්‍රකටකරවන සිහිපත් කරවන ප්‍රකරණයකි එය. මෙය අභිධර්ම පිටකය තුළ සංග්‍රහ වන කෘතියකි.

චිත්ත යමකයේ බුදුරදුන් මෙසේ විචාරයි.

"යං චිත්තං උප්පජ්ජති තං චිත්තං උප්පන්නන්ති : ආමන්තා"

ඉහත විචාරණයෙන් අදහස් කරනුයේ "යම් සිතක් ඉපදෙමින් නම් එම සිත උප්පන්න යැයි කිව යුතුදැයි?" එයට පිළිතුරු වශයෙන් "එසේ යැයි" සඳහන් වේ.

මීළඟට එම පෙළෙහිම බුදුරජුන් මෙසේ විචාරයි.

"යං වා පන චිත්තං උප්පන්නං තං චිත්තං උප්පජ්ජතීති : භංගක්ඛණේ චිත්තං උප්පන්නං, නො ච තං චිත්තං උප්පජ්ජති, උප්පාදක්ඛණේ චිත්ත උප්පන්නං චේව උප්පජ්ජති ච."

යමක - 2 - බු.ජ. - 646 - පිට

මෙහි සරල අදහස නම් "යම් හෝ සිතක් උප්පන්න අවස්ථාවේ පවතී ද එම සිත උපදිමින් (ගොඩනැගෙමින්, වැඩෙමින්) පවතින්නේ ද යත් " පිළිතුර ලෙසින් "

භංගක්ෂණයේ හෙවත් භංගවන අවස්ථාවේ සිත උප්පන්න හෙවත් සිත ඉපදුන අවස්ථාවේ පවතී. එවිට එම සිත නොම උපදී. උපදින අවස්ථාවේ සිත උප්පන්න වන්නාසේම උපදී "

ඉහත පාලියට අනුව සිතක අවස්ථා දෙකක් පමණක් සඳහන් කොට ඇත. ඨිති අවස්ථාවක් සඳහන් නොවේ. ඉපදෙමින් ගොඩනැගෙමින් හටගනිමින් පවත්නා අවස්ථාව උප්පාදක්ඛණ යන පාලි වචනයෙන් නිරූපණය වේ. නැසෙමින් බිඳෙමින් පවතින අවස්ථාව භංගක්ඛණ යන වචනයෙන් නිරූපණය වේ. මෙම අවස්ථා දෙකටම පොදුවේ 'උප්පන්න' යන වචනය යොදා ඇත.

'උප්පන්න' යන්නෙන් අදහස් වනුයේ සිතක් සම්බන්ධයෙන් ගත් විට ඉපදෙමින් හෝ නැසෙමින් වුවත් එය පවතින අවස්ථාවයි. සිතක් නැසෙමින් පවත්නා අවස්ථාවේදීත් එය තවමත් නැති වී නැති බැවින්, එය ජීවමානව පවතී.

ගොඩනැගෙමින් පවතින අවස්ථාවේදීත් එය ජීවමානව පවතී. එම නිසා 'උප්පන්නං' යන්නෙන් ධර්මයක වර්තමාන වශයෙන් ඇති බව ප්‍රත්‍යයෙන් හටගෙන ඇති බව පෙන්නුම් කරයි.

ධර්මසංගණිප්ප්‍රකරණයේ නික්ෂේප කාණ්ඩයේ ඡේද අංක (1045) යටතේ මෙසේ සඳහන් වේ.

"කතමේ ධම්මා පච්චුප්පන්නා :- යේ ධම්මා ජාතා, භූතා, සඤ්ජාතා, නිබ්බත්තා, අභිනිබ්බත්තා, පාතුභූතා, උප්පන්නා, සමුප්පන්නා, උට්ඨිතා, සමුට්ඨිතා, පච්චුප්පන්නා, පච්චුප්පන්නංසේන සංගහිතා, රූපා, වේදනා, සංඥා, සංඛාරා, විඤ්ඤාණං, ඉමේ ධම්මා පච්චුප්පන්නා "*

*** ධර්මසංගණී - බු.ජ -398 පිට**

"ප්‍රත්‍ය සහයෝගයෙන් උපන් ධර්මයෝ කවරේද යත් :"

ලෙසින් ඉහත බුදුරජුන් වර්තමානයේ පවතින ධර්මයන් විස්තර කොට ඇත. මීටම යාබද ඡේදවල කවර ධර්මයෝ අතීත අනාගත වේදැයි අර්ථ දක්වා ඇත. එම නිසා ඉහත අර්ථ දැක්වීමෙන් පෙන්නුම් කරනුයේ දැන් පවතින, වර්තමානයේ පවතින, ජීවමානවන ධර්මයන් ගැනය. ඉහත 'ජාතා, භූතා, සඤ්ජාතා' යන පදවලින් ඉපිද ඇති, හටගෙන ඇති, හේතූන්ගෙන් හට ගෙන ඇති, යන්න අර්ථවත් වෙයි. මෙම ඡේදයේදී කෘතියේ විවරණයට වැදගත් වචනයක් වන 'උප්පන්න' යන වචනය හමුවේ. එමනිසා උප්පන්න යන්නෙන් දැන් හටගෙන ඇති' යන අදහස ගම්‍ය වේ.

නාම ධර්මයක් නම් එහි උත්පාදක්ෂණයේදීත්, එනම් එය ගොඩ නැගෙමින් පවතින විටත්, එය දැන් ජීවමානව ඇති නිසා එයට උප්පන්න යැයි කිව යුතුය. නැති වෙමින් පවතින

අවස්ථාවේ හෙවත් භංගක්ෂණයේදීත් එය තවමත් නොනැසී පවතින නිසාත් එය තවමත් උප්පන්න ධර්මයකි.

නැතිවෙමින් පවතිනවා යන්නට යමක පාළියෙහි 'නිරුජ්ඣති' යන වචනය යෙදේ. පෙර සඳහන් කළ චිත්ත යමකයේම මෙසේ සඳහන් වෙයි.

"යං චිත්තං නිරුජ්ඣති තං චිත්තං උප්පන්නන්ති : ආමන්තා" "යං වා පන චිත්තං උප්පන්නං තං චිත්තං නිරුජ්ඣතීති : උප්පාදක්ඛණේ චිත්තං උප්පන්නං, නෝ ච තං චිත්තං නිරුජ්ඣති, භංගක්ඛණේ චිත්තං උප්පන්නං චේව නිරුජ්ඣතී ච" ඉහත මුල් පාලි පාඨයෙන් අදහස් වනුයේ

'යම් සිතක් නිරුද්ධ වෙමින් පවතී ද එවිටද එය උප්පන්න යැයි කිව හැකි බවයි.' මෙයින් පෙන්නුම් කරන්නේ 'නිරුජ්ඣති' යන්න සිදුවනුයේ භංගක්ෂණයේදී බවයි. දෙවැනි පාඨයෙන් ගම්‍ය වනුයේ යම් සිතක් උපදින අවස්ථාවේද එම සිත උප්පන්න හෙවත් වර්තමානයේ ඇති බවත් එය නැතිවෙමින් යන හෙවත් 'නිරුජ්ඣති' යැයි නොවන බවත්, භංගක්ෂණයේදී සිත උප්පන්න වන්නාසේම නැති වෙමින් යන බවයි.

මෙම සියලු තොරතුරු වලින් සිතක ආයුකාලය දෙකොටසකට බෙදා උත්පාදක්ෂණය හා භංගක්ෂණය ලෙසින් නිරූපණය වූ බව පැහැදිලිය. ඨිතික්ෂණයක් කියා දෙයක් දක්වා නැති බවද පැහැදිලිය.

ඛණය හෙවත් ක්ෂණය

ඉහත යමක පාලියේ නිතර හමුවන 'ඛණේ' යන පාලි වචනය සඳහා වඩාත් සුදුසු සිංහල අර්ථය 'අවස්ථාවේ' යැයි පෙනේ. එනම් 'උප්පාදක්ඛණේ ' යන්න පරිවර්තනය කළහොත් 'උපදින අවස්ථාවේ' යැයි කිව හැක. යම් ධර්මයක් මතුව ඒමට

සුදුසු වූ හේතුන්ගේ පහළවීම කියලා අර්ථයක් 'ඛණ' යන වචනය සඳහා ගැළපෙන බවක් පෙනෙනවා.

යමක පාලියෙ 'ඛණේ ' ලෙස මුත් ඛණය කියා සදහන් නොවේ. සැමවිටම ගතිකවය එම වචනය යොදා ඇත්තේ. නිශ්චල දෙයක් වශයෙන් නොවේ.

"ඛණෝ වෝ මා උපච්චගා" "උතුම් අවස්ථාව ඔබලා ඉක්ම නොයාවා" මෙතැනදී මනුස්ස ජීවිතයක් ලැබීම, බුද්ධ ශාසනයක් මුණගැසීම, ආදී හේතුන් උතුම් අවස්ථාව ලෙස සලකන්න පුළුවන්.

"ඛණාතීතා සෝචන්ති".

"අවස්ථාව මඟහැරුණු අය ශෝක කෙරෙත්" යනාදී පාලි පාඨ ද මීටම නිදසුන්ය.

නමුත් අටුවා යුගයේදීත් බොහෝ විට මෙකල්හිද මෙම 'ඛණ' යන වචනය බොහෝවිට භාවිත වනුයේ ඉතාම කුඩා කාලයක් ගැන අදහස් කිරීමටය.

මෙම සියුම් අර්ථ භේදය විදර්ශනා භාවනාව පැති දෙකකට යොමු කරනු ලබයි. ථේරවාද න්‍යාය ඔස්සේ අනිත්‍යතාවය දැකීමට උත්සාහ කරන කෙනෙකු මේ නිසා කාලය තුල ධර්මතාවයක භංගය දැකීමට උත්සුක වනු ඇත. ඒ නිසයි නාම-රූප ක්ෂණයක් ක්ෂණයක් පාසා බිඳී යන බව ථේරවාද අභිධර්මය උගත් බොහෝ දෙනෙක් පවසනවා අසන්නට ලැබෙනුයේ. නාමරූපවල ක්ෂණ භංගය දැකීම ඉතා වැදගත් ලෙස මේ අනුව ඉස්මතු වෙනවා.

නාම රූප ධර්මයන් බිඳී යාමට හේතුවක් අවශ්‍ය නොවන බවත් එය කාලය ගෙවී යාම තුල අනිවාර්යයෙන්ම ධර්මතාවක් ලෙසින් බිඳී යා යුතු බව ථේරවාද න්‍යාය තුල කියවෙනවා. සාමාන්‍යයෙන් මෙම කියමන් වලින් අදහස් වනුයේ හේතු නැතිවීමෙන් ධර්මයක නැති වී යාමක් නොව කාලය ගෙවී යාමෙන් සිදුවන භංගයකි. රූපවල ආයුකාලය චිත්තක්ෂණ

(17) යැයි ථේරවාදය තුළ සඳහන් වීම තුළම, සිත හා සෑම රූපයකම ආයුකාලයන් නිශ්චිත ධර්මතාවයකට යටත් වීමට සිදු වන බව පෙර දක්වන ලදී. එයිනුත් ගම්‍ය වනුයේ ථේරවාද න්‍යාය තුළ හේතු නැතිවී යාමෙන් ධර්මතාවයක නැතිවී යාම අපේක්ෂා කරනවාට වඩා කාලය ගෙවී යාමෙන් ධර්මතාවයක නැති වී යාම පැනවෙන බවයි.

හේතු නැතිවීමෙන් ධර්මයක් නැති වී යාම සන්තති වශයෙන් හෙවත් පරම්පරා වශයෙන් විද්‍යමාන වන්නක් බවයි ථේරවාදය තුළ කියවෙන්නේ. ක්ෂණයක් පාසා නාමරූප බිඳෙනනේ යැයි කී විට මේ ක්ෂණය යනු කුමක්දැයි ගැටළුවක් පැන නගී. ථේරවාද න්‍යායට අනුව ක්ෂණය යනු සිතක් පවත්නා කුඩා කාලයක් ලෙස බොහෝ විට පිළිතුරු ලැබේ. නමුත් එවිට සිතක් පවත්නා කාලයක් පාසා සිත බිඳී යනවා කවා වැනිය.

එක්තරා ආකාරයක චක්‍රීය අර්ථ දැක්වීමක් මෙතන පෙන්නුම් කරනවා. එනම් එකතැන කරකැවෙන අර්ථදැක්වීමක්. අමුතුවෙන් යමක් කියවුනේ නැති බවක් පෙන්නුම් කරනවා. හරියට සම්මාදිට්ඨිය කුමක්දැයි ඇසූ විට නුවණින් දැකීම යැයි කියා පිළිතුරු දීමත්, නුවණින් දැකීම යනු කුමක්දැයි ඇසූ විට සම්මාදිට්ඨිය කියා පිළිතුරු දීමත් වැනිය. මෙම කරුණු විදර්ශනාවට අතිශයින් වැදගත් නිසා ඉදිරියේදී තවදුරටත් විස්තර කිරීමට බලාපොරොත්තු වෙනවා.

සිතක ආයුකාලය බෙදිය යුතු ආකාරය ගැන පහත සඳහන් යමක පාඨයන් ගෙන්ද තවදුරටත් තහවුරු වේ.

"යං චිත්තං න උප්පජ්ජති තං චිත්තං න උප්පන්නන්ති : භංගක්ඛණේ චිත්තං න උප්පජ්ජති, නෝ ච තං චිත්තං න උප්පන්නං, අතීත අනාගත චිත්තං න චේව උප්පජ්ජති න ච උප්පන්නං"

මුලින්ම බුදුරජුන් විමසනුයේ "යම් සිතක් ඉපදෙමින් පවත්නේ නොවෙයිද, එය උප්පන්න නොවෙයිද" යන්නයි.

පිළිතුර - භංගවන අවස්ථාවේ සිත නූපදියි, නමුත් එවිට සිත උප්පන්න නොවූයේ නොවේ. අතීත අනාගත සිත උපදිනුයේ ද නොවෙයි, උප්පන්න ද නොවෙයි.”

සිතක ආයු කාලය සම්බන්ධව වෙනමම ඨිතික්ෂණයක් බුදුරජාණන් වහන්සේ අපේක්ෂා කරන්නේ නම් ඉහත විසර්ජනයේ දී “භංගවන අවස්ථාවේ මෙන්ම ඨිතික්ෂණයේදීත් සිත නූපදියි, නමුත් එවිට සිත උප්පන්න නොවූයේ නොවේ යැයි” සඳහන් කිරීමට තිබිණ. නමුත් එසේ කියා නැත.

ඒ නිසා සිතක ආයු කාලය සම්බන්ධයෙන් ගත් විට එහි උත්පාදක්‍ෂණයෙනුත් භංගක්‍ෂණයෙනුත් එම සිතෙහි සියලු පැවැත්ම සම්පූර්ණයෙන්ම නිරූපණය වන බවට අවසාන වශයෙන් දැක්වූ යමක පාලි පාඨයත් සමඟ බොහෝ සෙයින් පැහැදිලිය.

ඨීතිය හා ඨීතික්‍ෂණය

ඉහත විවරණයන්ගෙන් මානසික හෝ රූප ධර්මයන්ගේ පවත්නා බවක් හෙවත් ඨිතියක් නැතැයි කීමට අප අපේක්ෂා නොකරයි. **ඨිති** යන පාලි වචනයට ළඟින්ම යන සරල සිංහල වචනය **‘සිටි’** යනුයි. පවත්නා බව යැයි ද කිව හැක.

මේ බව තහවුරු කරන එක්තරා අර්ථදැක්වීමක් ධම්මසංග ණියෙදී හමුවේ. ඒ ජිවිතීන්ද්‍රිය නැමැති ධර්මතාවයට දෙන අර්ථකථනයේදී ය. යට දැක්වෙන්නේ එහි අරූප ජිවිතීන්ද්‍රිය සම්බන්ධව එහි දැක්වෙන අර්ථ කථනයයි.

“යෝ තේසං අරූපීනං ධම්මානං ආයු, ඨිති, යපනා, යාපනා, ඉරියනා, වත්තනා, පාලනා, ජීවිතං, ජීවිතීන්ද්‍රියං, ඉදං තස්මිං සමයේ ජිවිතීන්ද්‍රියං හෝති.” **(ධම්ම සංගණි - බු.ජ. - 32)**

බුද්ධ ජයන්ති මුද්‍රණයේ එහි පරිවර්තනය මෙසේය. "ඒ අරූපී ධර්මයන්ගේ යම් ආයුෂයක්, සිටීමක්, යපනයෙක්, යැපීමෙක්, ඉරියව් පැවැත්මෙක්, වර්තනයෙක්, පාලනයෙක්, ජීවිතයෙක්, ජීවිතීන්ද්‍රියක්, වේද මේ එසමයෙහි ජීවිතීන්ද්‍රිය වෙයි."

ජීවිතීන්ද්‍රිය චිත්තෝත්පාදයක චිත්ත චෛතසික සමඟ එක්ව යෙදෙන සහජාත ධර්මතාවයකි. එය සිතක ආයු කාලය නිරූපණය කරන ධර්මතාවයයි. ඉහත අර්ථ කථනයෙහි සිතක ආයුකාලයට සම්බන්ධ වචනයක් ලෙස 'ඨිති' යන්න යොදා ඇත පරිවර්තනයේ දී එය 'සිටීමක්' ලෙස ද දක්වා ඇත.

මෙයින් මතු වන වැදගත් කරුණක් වනුයේ, සිතක මුළු ආයුකාලය සඳහාම 'ඨිති' ලෙස යෙදිය හැකි බවය. සිතක ආයුකාලය යම්තාක් ද ඒ තාක් අරූපී ජීවිතීන්ද්‍රිය පවතින බැවිනි. මෙවිට ධර්මතාවයක ඨිතිය හෙවත් පවත්නා බව උත්පාදක්ෂණ හා භංගක්ෂණ දෙක තුලම නිරූපණය කළ හැකි නොවේදැයි අදහසක් මතුවේ.

එයට නිශ්චිත පිළිතුරක් සැපයීම් ඉදිරියේ එන විවරණයට කල්දමා නැවතත් යමකප්ප්‍රකරණය වෙතට අවධානය යොමු කරමු. අටුවාචාරීන් වන බුද්ධඝෝෂ තෙරුන් වහන්සේ ඉහත සඳහන් චිත්ත යමකයේ සිතක ආයුකාලය සම්බන්ධව සෘජුවම ඉදිරිපත් වන කරුණු නොදන්නවා නොවේ. උන්වහන්සේට හෝ උන්වහන්සේ පාදක කරගත් පුරාණ හෙළ අටුවාවේ ආචාර්යවරුන්ට හෝ සිතක ආයුකාලය සම්බන්ධයෙන් උත්පාදක්ෂණ හා භංගක්ෂණ අතර ඨිතික්ෂණයක් දැක්වීමට පසුබිම් වූයේ යමකප්ප්‍රකරණයේම එන කාරණා කිහිපයක් මුල් වීමෙන් යැයි පෙනේ.

ඨිතික්ෂණය පැනවුණු අයුරු

සංඛාර යමකයේ සමහර විසර්ජන විස්තර කිරීමට යාමේදීය මෙම ඨිතික්ෂණය ගැන අදහස ඉදිරිපත් කිරීමට

සිදුවනුයේ. සංඛාර යමකයේදී කායසංඛාර, වචීසංඛාර, චිත්තසංඛාර [2] ගැන සඳහන් වේ. කායසංඛාර ලෙස ආශ්වාසප්‍රාශ්වාසත්, වචීසංඛාර ලෙස විතක්ක විචාරත්, චිත්තසංඛාර ලෙස සංඥා වේදනාත්, එම යමකයට අදාලව දක්වා ඇත. මෙම ධර්මතා ත්‍රිත්වය සම්බන්ධයෙන් ඉපදීම හා නිරෝධ සංකලනය වන විවිධ ආකාරයන් එම යමකයේ දැක්වෙයි. මෙම ලිපියේ ප්‍රස්තුතයට අදාලව එහි පාඨ කීපයක් පහත දැක්වේ.

"යස්ස කායසංඛාරෝ උප්පජ්ජති තස්ස චිත්තසංඛාරෝ උප්පජ්ජති ඃ ආමන්තා"*

* බු.ජ. - යමක ප්‍රකරණය 02 (1) 14 පිට

තේරුම ඃ (යමෙකුට කායසංඛාර උපදී නම් ඔහුට චිත්ත සංඛාර උපදීද යත් ඃ එසේය)

"යස්ස කායසංඛාරෝ නිරුජ්ඣති තස්ස චිත්තසංඛාරෝ නිරුජ්ඣතීති ඃ ආමන්තා"*

* බු.ජ. 56 පිට/යමක 02 (1)

තේරුම ඃ (යමෙකුට කායසංඛාර නිරුද්ධ වෙත්ද ඔහුට චිත්තසංඛාර නිරෝධ වේද යත් ඃ එසේය)

"යස්ස කාය සංඛාරෝ උප්පජ්ජති තස්ස චිත්ත සංඛාරෝ නිරුජ්ඣතීති ඃ නෝ "

බු.ජ. 94 පිට/සංඛා යමක 02 (1)

තේරුම ඃ (යමෙකුට කායසංඛාර උපදින විට ඔහුට චිත්තසංඛාර නිරුද්ධ වේද යත් ඃ නැත) ඉහත යමකයේ එන පාලි පාඨ 03න් මුල් දෙකට අනුව චිත්තසමුට්ඨාන[3] රූපයක් වන ආශ්වාස ප්‍රාශ්වාස හටගන්නා සැමවිටම ඊට අනුයාත

[2, 3] **. අධෝලිපි බලන්න..**

චිත්තයද හටගනිමින් පවතින බවද, ආශ්වාස ප්‍රාශ්වාස නැතිවෙමින්, දුර්වල වෙමින් පවතින විට චිත්තයද නැතිවෙමින්, දුර්වල වෙමින් පවතින බව පෙන්නුම් කරයි. එනම් කායසංඛාරයේ උත්පාද හා භංගක්‍ෂණ ඊට අනුයාත චිත්තයාගේ උත්පාද හා භංගක්‍ෂණ සමඟ සමපාත වන බව දැක්වෙයි.

සංඛාර යමකයේ උත්පාද නිරෝධ වාරයේ එන අවසානයේ දැක්වූ පාලි පාඨයෙන්, ආශ්වාස ප්‍රාශ්වාස උපදිමින් පවතින කිසිවිටෙක කිසි සිතක් නිරුද්ධ නොවන බවද ගම්‍ය වේ. අනික් අතට මෙම උප්පාද නිරෝධ වාරයේ ඍජුවම දක්වා නැතත් (විසර්ජන සංෂිප්ත කර ඇති නිසා හෝ) සිත උපදින විට කායසංඛාර සැමවිටම නිරුද්ධ නොවන බවද ගම්‍ය වේ.

ධම්ම යමකයේ උප්පාද-නිරෝධ වාරයේ එන "යස්ස කුසලා ධම්මා උප්පජ්ජති තස්ස අබ්‍යාකථා ධම්මා නිරුජ්ඣතීති." **(බු.ජ. -760 පිට යමක 2-(1))** යන්නට ද "නැත" යන පිළිතුරෙන් එය තහවුරු වේ.

අබ්‍යාකත ධර්ම සංග්‍රහයට චිත්තසමුට්ඨාන රූපද ඇතුලත් වන බැවිනි.

ඉහත පාලි පාඨ තුන හතරෙහි දක්වන ලද කරුණු එසේ ඇතිවිට චිත්තසමුට්ඨාන රූපයක් වන ආශ්වාස ප්‍රාශ්වාසයෙහි ආයුකාලය චිත්තක්‍ෂණ 17 ලෙස ගතහොත් එක්තරා දෝෂයක් පැන නගී. රූපවල ආයුකාලය චිත්තක්‍ෂණ 17ක් යැයි අභිධර්ම අටුවාවෙහි දක්වා ඇත. අටුවාචාරීන් වහන්සේගේ පිළිගැනීම වූයේ චිත්තජ, ඍතුජ, කර්මජ, ආහාරජ යන සියළු ආකාරයේ රූප මෙම ධර්මතාවයට අනුගත බවයි.

ගැටළුව වනුයේ සිතක මෙන්ම රූප ධර්මතාවයන්ගේ ආයුකාලය ක්ෂණ දෙකකින් නිරූපණය කළහොත් එවිට කායසංඛාරයේ උත්පාදක්‍ෂණය සමඟ සිතෙහි භංගක්‍ෂණයත්,

තවත් විටෙක සිතෙහි උත්පාදක්ෂණයත් සමග කායසංඛාරයේ භංගක්ෂණයත් සමපාත වීමයි. කුමක් හෙයින්ද යත් රූපයක ආයුකාලය චිත්තක්ෂණ 17 වන විට චිත්තක්ෂණ 8.5ක් එහි උප්පාදක්ෂණය ලෙසිනුත් ඉතිරි 8.5 එහි භංගක්ෂණය ලෙසිනුත් දැක්වීමට සිදුවනු ඇත. (රූපයක ආයුකාලයෙන් උත්පාදක්ෂණයට හා භංගක්ෂණයට සමාන ආයු කාල ඇතැයි උපකල්පනය කළහොත්) මෙවිට පෙර සඳහන් කළ පාලි පාඨ සමග නොගැලපීමක් මතුවේ.

පහත ප්‍රස්ථාරයෙන් මෙම කරුණ තවදුරටත් පැහැදිලි වනු ඇත.

චිත්තවාර 17ක පෙළගැස්ම



ඉහත මුල් ප්‍රස්ථාරයෙන් චිත්ත ප්‍රවෘත්තියත්, පහළ ප්‍රස්ථාරයෙන් සලකා බලන ලද මුල් සිත සමග එකවිට හටගත් රූපයක, කාලය සමග වන විචලනයත් දැක්වේ. රූපයක ආයු කාලය චිත්තක්ෂණ 17ය යන උපකල්පනය මත ඉහත ප්‍රස්ථාර ඇඳ ඇත. පලමු සිතේ උත්පාදය සමග හටගන්නා ආශ්වාස-

ප්‍රශ්වාසය 17වන සිතේ භංගය සමඟ නිරුද්ධ වෙයි. එහිදී යමක පාලිය සමඟ කිසිදු පරස්පරයක් නැතිවූවත් ඉහත අඳුරු කර ඇති අවස්ථා පිරික්සන විට පැහැදිලිවම පරස්පර තත්වයක් මතුවේ.

උදාහරණයක් ලෙස 3 වැනි සිත නිරුද්ධ වෙමින් යනවිට තවමත් කායසංඛාර රූපය පවතිනුයේ ඉපදෙමින්ය. 11 වැනි සිත සැලකූවිට එය ඉපදෙමින් තිබෙන විට ආශ්වාස ප්‍රාස්වාස නිරුද්ධ වෙමින් පවතී.

මෙවිට පෙර සඳහන් කළ "යමෙකුට කායසංඛාර උපදින විට චිත්තසංඛාර නිරුද්ධ වෙමින් පවතීද ඃ නැත" යන විසර්ජනයට පටහැනි වේ. අනෙක් අතට සිත හටගනිමින් තිබෙන විට කායසංඛාර නිරුද්ධ වෙමින්ද තිබිය නොහැක.

මෙම පරස්පරයන් විසඳීමට යෝජනා කළහැකි උපකල්පිතයන් මෙසේය.

1- චිත්තසමුට්ඨාන රූපයක් වන ආශ්වාසප්‍රාශ්වාසය එය හටගන්නා සිතත් සමඟ බිඳීයන බව සැලකීම. (එවිට සිතක ආයුකාලයම එම රූපයේ ආයුකාලය බවට පත්වේ)
2- සිතකට වඩා ආයුෂ එයට ඇත්තේ යයි සළකන්නේ නම්, එය හටගත් සිතේ භංගක්‍ෂණය අවසානයේ එය අවසන් නොවී, ඊළග ඊළග සිතේ උත්පාදක්‍ෂණයේ එය බලවත් වෙමිනුත් භංගක්‍ෂණයේදී දුර්වල වෙමිනුත් පැවත පසුව යෙදෙන සිතක් අවසානයේ නැතිව යාම.

3- ආශ්වාසප්‍රාශ්වාසයේ උත්පාදක්‍ෂණයත්, භංගක්‍ෂණයත් අතර ගොඩනැගෙමින් හෝ දුර්වල වෙමින් පවත්නේ යැයි නොකිවයුතු, ඨිතික්‍ෂණයක් වැන්නක් උපකල්පනය කිරීම.

මෙම ආකාර 03 හැරෙන්නට යමක පාලිය හා සැසඳෙන විවරණයක් කිරීමට වෙන විකල්පයක් නොපෙනේ. මෙහි පළමුවෙනි විකල්පය සැලකූවිට එනම් චිත්තසමුට්ඨාන රූපවල ආයුකාලය සිතක ආයුකාලය හා සමාන ලෙස ගැනීමට සංඛාරයමකයේම ඇති කරුණු කිහිපයක් වඩාත් තුඩු දෙයි. මෙම කෘතියේ පසුව විග්‍රහවන එම කරුණු සැලකීමේදී ආශ්වාසප්‍රාශ්වාස වැනි සමහරක් චිත්තසමුට්ඨාන රූපවල ආයුකාලය සිතක ආයුකාලය සමඟ සම බවට වඩාත් කරුණු ඉස්මතු වේ.

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති යන චිත්තසමුට්ඨාන රූප හැරෙන්නට අනෙක් චිත්තසමුට්ඨාන රූප සිතකට වඩා වැඩි කාලයක් පැවතිය හැකි බවට පට්ඨානයේ කරුණු ඇති හෙයින් දෙවැනි විකල්පයද නොසළකාහැරිය හැක්කේ නොවේ.

දැන් අවසාන විකල්පය සැලකූවිට, එනම් උත්පාදක්ෂණ හා භංගක්ෂණ අතරට ඨිතික්ෂණයක් යෙදීමෙන් යමකයේ සමහර කරුණු සමඟ පරස්පරතාවය යම්දුරකට විසඳා ගත හැකිය. එනම් අතරමැද ඨිතික්ෂණයක් යෙදීමෙන් සිතේ උත්පාදක්ෂණය සමඟ කායසංඛාරයේ භංගක්ෂණය සමපාත වීමත්, සිතේ භංගක්ෂණය සමඟ කායසංඛාරයේ උත්පාදක්ෂණය සමපාත වීමත් වළක්වා ගත හැක. එම නිසාය අටුවාචාරීන් වහන්සේ හෝ ඊට පෙර යුගයේ සිටි ථේරවාද ආචාර්යවරු රූප සම්බන්ධව ඨිතික්ෂණයක අවශ්‍යතාවය මතුකළ බව හැඟෙනුයේ. පෙර සඳහන් කළ පඨම ආනන්ද සූත්‍රය හා සංඛත ලක්ෂණ සූත්‍රයන්හි කරුණු පෙළගැසී ඇති ආකාරය තේරුම්ගත් විදියද මීට තුඩුදුන් සාධක විය හැක.

රූප සම්බන්ධව ඨිතික්ෂණයක් පැනවූ පසු එය නාම ධර්ම සඳහා ද එනම් චිත්ත චෛතසික සඳහාද යෙදීමට සිදුවූ බවයි පෙනෙනුයේ. කුමක් හෙයින්ද යත් සංඛත ලක්ෂණ සූත්‍රයේ හා

පඨම ආනන්ද සූත්‍රයේ සඳහන් සංඛත ලක්ෂණ තුන සංස්කාරයක ආයුකාලයේ අවස්ථා භේද ලෙස එම ථේරවාද තෙරුණ් වහන්සේලා වටහාගෙන තිබීමත්, රූප සඳහා ඨිතික්ෂණය පැනවූ පසු නාම ධර්ම සඳහාත් එම සූත්‍රවල එම සංඛත ලක්ෂණ තුනම යොදා තිබීමත් නිසාය.

සංස්කාරයන්ගේ පැවත්ම පුරාවට දිවෙන පොදු ඨිතියක් වෙනුවට මෙලෙස උප්පාද හා භංගක්ෂණ අතර එම දෙකින්ම වෙන්වූ වෙනමම කාල පරාසයක් ඨිතික්ෂණය ලෙසින් ථේරවාදය තුල මෙලෙස යෝජනා වූ බවක් පෙනේ.

අභිධර්ම මූලටීකාචාර්ය ආනන්ද තෙරුන් වහන්සේ එලෙස වෙන්වූ ඨිතික්ෂණයක් නාමධර්ම සම්බන්ධයෙන් පිළි නොගත්තද එය උත්පාද හා භංගක්ෂණ වලින් නිරූපණය වන්නේ යැයි සැලකූ බවක්ද නොපෙනේ. එම හිමියන් ධර්මයන්ගේ පරම්පරා වශයෙන් පමණක් ඨිතියක් පැනවේ යයි අදහස් කළ බැවිනි.

සංඛත ලක්ෂණ තුන

දැන් පෙර සඳහන් කළ පඨම ආනන්ද සූත්‍රය හා ඒ ආශ්‍රිත සූත්‍ර ගැඹුරින් සලකා බලමු. මෙම සූත්‍ර කිහිපය බුදුදහමේ ඉතාමත්ම වැදගත් යැයි සැලකෙන සූත්‍රයන්ය. එම සූත්‍රයේත් සංඛත ලක්ෂණ සූත්‍රයේත් සංඛත ධර්මයන්ගේ ලක්ෂණ ලෙස " උප්පාදෝ පඤ්ඤායති, වයෝ පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති" ලෙස දක්වා ඇත. මෙම ලක්ෂණ තුනෙහි පෙළගැස්ම එම සූත්‍රවල යෙදී ඇති ආකාරය දෙස බලන විට පෙනීයන වැදගත් කරුණක් වනුයේ "ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති" යන්න උප්පාද හා වය අතරට නොව අගට සඳහන් කොට ඇති බවයි.

"ඨිතස්ස අඤ්ඤතත්තං" යන්න භාග්‍යවතුන් වහන්සේ මැදට යෙදුවා නම් එය අටුවාචාරීන් වහන්සේ දැක්වූ ආකාරය

සමඟ වඩාත් ගැළපේ. එනම් "උප්පාදෝ පඤ්ඤායති, වයෝ පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති" ලෙස නොව "උප්පාදෝ පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති, වයෝ පඤ්ඤායති" ලෙසය.

මීළගට සලකා බැලිය යුත්තේ "පඤ්ඤායති" යන වචනයයි. "පඤ්ඤායති" යන්නට පැනවෙයි, දක්නට ලැබෙයි, නුවණට හසුවෙයි, විද්‍යාමාන වෙයි, යනාදී අර්ථ දැක්විය හැක. බුදුරජුන් ආනන්ද හිමියන්ගෙන් "කුමක උත්පාදයක් පැනවේද? වයක් පැනවේද? සිටියහුගේ අන්‍යාකාරයක් පැනවේද? යන්න විමසූ විට එයට ආනන්ද තෙරුන් වහන්සේ පිළිතුරු දෙන ආකාරයට පෙනෙනුයේ එය මතකයෙන් දෙන පිළිතුරකට වඩා ප්‍රත්‍යක්‍ෂව දැනෙන, ප්‍රත්‍යක්‍ෂව දකින, ආර්ය ශ්‍රාවකයෙකු වශයෙන් වැටහෙන ධර්මතාවයක් පිළිබඳ දෙනු ලබන පිළිතුරක් ලෙසය. බුදුරජුන් මැනවි මැනවි කියා ප්‍රශංසා කළේද ආනන්ද තෙරුන් වහන්සේගේ මතක ශක්තියට බවක්ද නොපෙනේ.

ඉතා කෙටි කාලයක් පවත්නා සිතක උප්පාදක්‍ෂණ භංගක්‍ෂණවල හරියටම සීමා දැකීම, එනම් සිතක ආයුකාලයෙන් උත්පාදක්‍ෂණයට කොපමණ කාලයක් වැයවේද, භංගක්‍ෂණයට කොපමණද, ඨිතියට කොපමණද, එක සිතකට ක්‍ෂණ 3ක් තිබේද, එය දැක්කත් සෑම සිතකටම මෙලෙසම වේද? යනාදී කරුණු ශ්‍රාවකයෙකුට ප්‍රත්‍යක්‍ෂ කළ නොහැකිය. අනුමාන වශයෙන් දත හැකිය. සිතක උත්පාද හෝ භංගක්‍ෂණය සමඟ වෙනත් රූපමය ධර්මතාවයක උත්පාදය හෝ භංගක්‍ෂණ හරියටම සමපාත වන්නේ දැයි දැකීම ඊටත් වඩා අතිශයින් දුෂ්කරය.

සෝතාපන්න වීමට එවන් දෑ දැනගැනීම අත්‍යාවශ්‍ය නොවේ. එය සර්වඥ්‍ය විෂයය. ඕනෑම මාර්ගඵල ලාභියෙක් අනිත්‍යතාවය පිළිබඳ පොදු ධර්මාතාවයක් අවබෝධ කරනු ලබන්නේය. චිත්තක්‍ෂණය, ක්‍ෂණ මාත්‍ර සෑම මාර්ග ඵල ලාභියෙක්ම දකින්නේ යැයි කිව නොහැක.

ඉහත උද්‍ෘත කළ පඨම ආනන්ද සූත්‍රයට යාබදව ඇති දුතිය ආනන්ද සූත්‍රයේදී මීටම සම්බන්ධ තවත් වැදගත් කරුණක් මතුවේ. එම සූත්‍රයේ අර්ථය සැකෙවින් මෙලෙසය.

බුදුරජුන් ආනන්ද තෙරුන් වහන්සේගෙන් මෙසේ විචාරයි "ආනන්දය කුමන ධර්මයන්ගේ උත්පාදයක් පැනවුනේද? (අතීත වශයෙන්), වය පැනවුනේද?, සිටියහුගේ අන්‍යාකාරයක් පැනවුනේද?"

"කුමන ධර්මයන්ගේ උත්පාදයක් පැනවෙන්නේද? (අනාගත වශයෙන්) වය පැනවෙන්නේද? සිටියහුගේ අන්‍යාකාරයක් පැනවෙන්නේද?"

"ආනන්දය කුමන ධර්මයන්ගේ උත්පාදයක් පැනවෙයිද?, වය පැනවෙයිද?, සිටියහුගේ අන්‍යකාරයක් පැනවෙයිද? (වර්තමාන වශයෙන්) " යැයි මෙසේ බුදුරජුන් ආනන්ද තෙරුන් වහන්සේගෙන් සංස්කාරයන්ගේ සංඛත ලක්‍ෂණ පිළිබඳ තුන් කාලයටම අදාල කොට විචාළේය.

අතීත නාම-රූප සම්බන්ධයෙන් මෙම උත්පාද ආදී සංඛත ලක්‍ෂණ පැනවුණු බවත්, අනාගත නාම-රූප ධර්ම සම්බන්ධව සංඛත ලක්‍ෂණ පැනවීමට ඇති බවත් පැවසූ තෙරුන් වහන්සේ වර්තමානය සම්බන්ධව පැවසූ දෙය, මෙම කෘතියේ ප්‍රස්තුතයට ඉතා වැදගත් වන බැවින් එහි පාලියම යට දක්වනු ලැබේ.

"යං ඛෝ ආවුසෝ, රූපං ජාතං, පාතුභූතං, තස්ස උප්පාදෝ පඤ්ඤායති, වයෝ පඤ්ඤායති ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති, යා වේදනා .... පෙ.... යා සංඥා...යෝ සංඛාරෝ... යං විඤ්ඤාණං ජාතං පාතුභූතං, තස්ස උප්පාදෝ පඤ්ඤායති, වයෝ පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායතීති"

"යම් රූපයක් ජනිත වී ඇත්ද, පහළ වී ඇත්ද, එහි උත්පාදයක් පැනවෙයි, වය පැනවෙයි. සිටියහුගේ

අන්‍යාකාරයක් පැනවෙයි" යම් වේදනාවක්..... ආදි වශයෙන් අනෙකුත් නාම ධර්ම සඳහාද මෙලෙසම පිළිතුරු දි ඇත්තේය.

ඉහත පිළිතුරෙහි විශේෂයෙන් අවධානය යොමු කළ යුතු තැන වනුයේ හටගත්තාවූ පහළ වූ රූපයෙහිත්, වේදනා ආදියෙහිත් උත්පාදයක් පැනවෙන බව සඳහන් වීමයි. උත්පාද යන වචනයෙන් උත්පාදක්‍ෂණය අදහස් වන්නේ නම්, හටගත්තා වූ නාම රූපවල උත්පාදයක් පැනවේ යැයි කීම නොගැලපේ. එසේ වන්නේ නම් කිවයුතුව තිබුනේ උත්පාදයක් පැනවුනේ යැයි කියා (උප්පාදෝ පඤ්ඤායිත්ථ) අතීත ලෙසිනි. හටගත්තාවූ නාම-රූප උත්පාදක්‍ෂණය ඉක්මවා ඇතිබව පෙනෙන බැවිනි. තවද තෙරුන් වහන්සේට කියන්නට තිබුනේ "ඨිතස්ස අඤ්ඤතත්තං" පමණක් වර්තමාන වශයෙන් පැනවෙන බවකි. එම නිසා "උප්පාද" යන වචනයෙන් "උත්පාදක්‍ෂණය" නිරූපණය නොවන බවයි පෙනෙනුයේ.

එසේම වය යන වචනයෙන් භංගක්‍ෂණයද නිරූපණය නොවන බවයි පෙනෙනුයේ. තවද ඉහත පිළිතුරේ ආකාරයෙන් පැහැදිලි වනුයේ සංඛත ධර්මයක එහි ආයුකාලයෙහි ඕනෑම මොහොතක මෙම සංඛත ලක්‍ෂණ තුන පෙන්වන බවයි. එනම් නාම-රූප ධර්මතාවල උත්පාදක්‍ෂණයෙහිදී වේවා භංගක්‍ෂණයේදී වේවා මෙම සංඛත ලක්‍ෂණ එකවිට පෙන්නුම් කරන බවක් පෙනේ. එවැනි පොදු ධර්මතාවයක්ය මගඵල ලාභීන් අවබෝධ කරනු ලබන බවට පෙනෙනුයේ.

මීටම සම්බන්ධ තවත් සූත්‍ර පාඨයක් දැන් සලකා බලමු. මෙය සඳහන් වනුයේ සංයුක්ත නිකායේ උප්පාද සංයුක්තයේ චක්ඛු සූත්‍ර ආදියේය.

"යෝ භික්ඛවේ, චක්ඛුස්ස උප්පාදෝ, ඨිති, අභිනිබ්බත්ති, පාතුභාවෝ, දුක්ඛස්ස සෝ උප්පාදෝ රෝගානං ඨිති, ජරා

මරණස්ස පාතුභාවෝ, යෝ සෝතස්ස - පෙ - යෝ ඝානස්ස - පෙ..." (ස.නි /ඛන්ධ වර්ගය / බු.ජ 450 පිට)

"යම් මහණෙනි, ඇසෙහි උත්පාදයක්, පැවැත්මක්, උපතක්, පහළවීමක් වේද එය දුකෙහිම උත්පාදයයි, රෝග යන්ගේ පැවැත්මයි, ජරා මරණයෙහි පහළවීමයි. යම් කණෙහි...."

ඉහත සූත්‍රවල ඇස ආදි රූපවල උත්පාදයට පසුව 'ඨිති' යයි යොදා ඇත. කෙනෙකුට මෙහිලා උත්පාදයෙන් උත්පාදක්ෂණයත්, ඨිති යන්නෙන් ඨිතික්ෂණයත් හැඟවෙන්නේ යැයි අදහස් විය හැක. නමුත් එම සූත්‍රයේම ඊළඟට යොදා ඇති "අභිනිබ්බත්ති, පාතුභාවෝ" යන වචන වලින්ද හඟවනුයේ, ධර්මතාවයක උත්පත්තියක් පහළවීමක්ය. ඒනිසා ඨිති ලෙසින් අදහස් කරනුයේ උප්පාදය යමක් ද එය ඇතිවිටම ධර්මතාවයක පෙන්නුම් කරන ලක්ෂණයක් බව ප්‍රකට වේ. එනම් 'ඨිති' 'උප්පාද' ආදී ලක්ෂණ එකවිට පැනවෙන බවක් පෙන්නුම් කරයි. මෙම සූත්‍රයට පසුව එන සූත්‍ර පෙළෙහි නාම ධර්ම සඳහාද ඉහත අර්ථයම පෙන්නුම් කරයි.

මෙම සූත්‍ර වලින් මතුවන තවත් වැදගත් කරුණක් වනුයේ නාම-රූපවල උත්පාදය හා ඨිතිය ඇතිවිට එයම ජරා මරණයේ පහළවීමට සමාන යැයි බුදුරජුන් දක්වා ඇති බවයි.

මරණය අනුයාත වනුයේ වය ලක්ෂණයටය. "උත්පත්තියා සහේවේදං මරණං ආගතං සදා" යන පාඨයද මීටම අනුයාත බවක් පෙන්වයි. "උත්පත්තිය සමගමය සැමදා මරණය පැමිණෙනුයේ" යන්න එහි තේරුමයි. මේ සියළු කරුණු වලින් පෙනෙන්නේද උප්පාද, ඨිති, වය, ලක්ෂණ එකවිට පවතින බවයි.

සංඛත ලක්ඛණ සූත්‍රය හා පඨම ආනන්ද සූත්‍රයන්හි සඳහන් කරුණු විමසීමේදි ඉස්මතුවන තවත් වැදගත් කරුණක්

නම්, උප්පාද, වය ආදි සංඛත ලක්‍ෂණ ඒවායෙහි දක්වා ඇත්තේ සියළු නාම- රූප ධර්මයන්ට අදාල වන ලෙසය. එනම් සියලු සංස්කාරයන්ට අදාල වන ලෙසය. නමුත් යමක පාලියේ උත්පාදක්‍ෂණ හා භංගක්‍ෂණ දක්වා ඇත්තේ සියලු නාම ධර්ම සඳහාත්, රූප සම්බන්ධව ගත්විට චිත්තසමුට්ඨාන රූප සඳහාත් පමණි. සංඛාර යමකයෙහි චිත්තසමුට්ඨාන රූපයක් හෙවත් ආශ්වාසප්‍රාස්වාසයෙහි උත්පාදක්‍ෂණයක් හා භංගක්‍ෂණයක් ගැන දක්වා ඇත.

ආයතන යමක, ඉන්ද්‍රිය, ධම්ම, ස්කන්ධ යමක යනාදියෙහි කර්මජ රූප ගැන සඳහන් වුවත් එය සැමවිටම භවයක මුලදී, එනම් ප්‍රතිසන්ධියෙදි කර්මජ රූපවල හටගැනීමත්, මරණයේදී කර්මජ රූපවල නිරුද්ධ වීමත්, සඳහා සීමා කොට ඇත. නමුත් ඇස කණ ආදි කර්මජ රූපවල " චක්ඛුස්ස උප්පාදක්ඛණේ", "සෝතස්ස උප්පාදක්ඛණේ " ලෙසින් එනම් "ඇසේ උපදින අවස්ථාවේ, කණ උපදින අවස්ථාවේ" ලෙසින් දක්වා නොමැත.

චිත්තසමුට්ඨාන රූප ගැන ප්‍රවෘත්තියේදී (භවයේ අතරමැදදී), හටගැනීම නැතිවීම දක්වා තිබුණද, කර්මජ රූප ගැන ප්‍රවෘත්තියේ සඳහනක් නැති බවකි පෙන්නුම් කරනුයේ. ඇස ආදි කර්මජ රූපයක උත්පාදක්‍ෂණය යැයි දැක්වෙන්නේ නම්, යමක පාලි රීතියට අනුව එයින් අනෙක් අතට ගම්‍ය වනුයේ එයට භංගක්‍ෂණයකුත් ඇති බවත් උප්පාද හා භංගක්‍ෂණයෙන් එහි ආයු කාලය නිරූපණය වන බවත්ය. නමුත් තරමක් කල් පවතින කර්මජ රූපයක් සැලකූ විට එයට ආහාර ප්‍රත්‍යය, සිතෙන් ලැබෙන විප්පයුක්ත ප්‍රත්‍යය, පච්ඡාජාත ප්‍රත්‍යය ආදිය සැලකීමෙදී කාලයත් සමග කර්මජ රූපයේ බලවත් බවෙහි උච්චාවචනයන් සිදුවිය හැක. එනම් සත්වයෙකුගේ ප්‍රවෘත්ති කාලයේ කර්මජ රූප ස්වභාවයක බලවත් බව විටෙක අඩුවී පසුව නැවත වැඩිවිය හැක. චිත්තසමුට්ඨාන රූප මෙන් සැම විටම ක්‍රමයෙන් වැඩිවී

ක්‍රමයෙන් දුබල වනවා නොවේ. පහත ප්‍රස්ථාරයෙන් කර්මජ රූපයක, කාලය සමග විය හැකි විචලනයක් පෙන්නුම් කරයි.



ආහාර හා සෘතුසමුට්ඨාන රූපවලද මෙවන් විචලනයක් තිබිය හැක. එම නිසා ඒවා සම්බන්ධව උත්පාදක්ෂණ, භංගක්ෂණ ලෙස එහි ආයුකාලය දෙකොටසකට බෙදා, එසේ නැති නම් ඨිතිය සමග තුන් කොටසකට හෝ බෙදා කථා කිරීම නොගැළපෙන බවයි පෙනෙනුයේ.

මේ නිසා ශරීරස්ථක සියළු රූප සම්බන්ධයෙන් ගත්විට, වැඩි හරියකට උප්පාද හා භංගක්ෂණ ලෙස ඒවායේ ආයුෂ දෙකොටසකට බෙදා නිරූපණය කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවයි පෙනෙනුයේ. නමුත් ඇස, කණ, පුරුෂභාව, ඉත්ථිභාව ආදි කර්මජ රූප සත්ව ජීවිතයක ඉතාමත් වැදගත් රූපයෝය. එයින් සමහරක් විශේෂයෙන් අධ්‍යාත්මික වශයෙන් ගැණෙන රූපයෝ වෙති. රූපස්කන්ධය ගැන කථා කරද්දී ඒවා මඟ හැර, නොසලකා හැර කථා කිරීම සුදුසු නොවේ.

මෙම කරුණු වලිනුත් පෙනෙනුයේ රූපය සම්බන්ධයෙන් උප්පාද, වය, ඨිතස්ස අඤ්ඤතත්තං ලෙසින් යම් සංඛත ලක්ෂණයක් බුදුරජුන් වදාළේද ඒවා උත්පාද හා භංගක්ෂණ සඳහා අනුයුක්ත කිරීම යෝග්‍ය නොවන බවයි. කෙටියෙන් කිවහොත් සංඛත ලක්ඛණ සූත්‍ර ආදියෙහි දක්වන සංඛත ලක්ෂණ සියළු රූප සඳහා අනුයුක්ත වන විට උත්පාද

හා භංගක්ෂණ, රූප සම්බන්ධයෙන් ගත් කල චිත්තසමුට්ඨාන රූපවලට පමණක් අනුයුක්ත වන බව පෙනේ.

යමක පාලිය හදාරන්නන් සඳහා ප්‍රයෝජනවත් වනු පිණිස තවත් කරුණු කිහිපයක් මේ සමග සඳහන් කරනු කැමැත්තෙමි. යමක පාලිය හදාරන විට එහි ධම්ම යමක, සච්ච යමක, සංඛාර යමක ආදියේ විසර්ජන සඳහා කුමක් හෙයින් ඍතුජ ආහාරජ රූප නොගැනුනේ දැයි, අදාල කර නොගත්තේදැයි ගැටළුවක් පැනනගී.

එම රූපාකාර සත්වයෙකුගේ ජීවන පැවැත්මක, එම සත්වයාටම ආවේණික රූප යැයි කිව නොහැක. මිනිසෙකුගේ නම් ශරීරය තුල ජීවත්වන කෝටි ගණන් වූ ක්ෂුද්‍ර ජීවීන්ද ඒවාට අයිතිය කියනු ඇත. කර්මජ රූප මෙන් සත්වයාගේ ජීවිතයට ආවේණික ගතියක් ඒවායේ නැත. එසේම චිත්ත ක්‍රියාවලිය සමග අනුගත පැවැත්මක් එනම් සිතේ උත්පාදක්ෂණයත් සමග ඒවායේ උත්පාදක්ෂණයත්, භංගක්ෂණයත් සමග භංගයත් බොහෝ විට සමපාත නොවේ. අහඹු ලෙස සමපාත විය නොහැක්කේද නොවේ. ඇත්තෙන්ම ඒවායේ උත්පාදක්ෂණයක් හෝ භංගක්ෂණයක් ගැන කතාකිරීමම තේරුමක් නැත.

චිත්තසමුට්ඨාන රූප සිත සමග සමපාත වනුයේ එහි ජනක ප්‍රත්‍යය ලෙස ඒ ඒ සිත ක්‍රියාකරන බැවිනි. මෙසේ සමපාත නොවන විට ඒවාත් සලකාගෙන යමකයේ පාට සඳහා පිළිතුරු සැපයීමට ගියහොත් එම විසර්ජන අධිසංකීර්ණ වනු ඇත. යමක පාලියේ මූලික අරමුණ ධර්මතාවල අනිත්‍යතාවය ඉස්මතු කර දීම බැවින් මුත් අධිසංකීර්ණ තත්වයකට යෑම සඳහා නොවන බැවින්ද, එම රූපාකාර බුදුරජුන් විසර්ජනයන්හීදී නොසලකා ඇති බව පෙන්නුම් කරයි.

කර්මජ රූප සම්බන්ධයෙන් ගත්කල ඒවා යමක පාලියේ

විසර්ජන සඳහා සත්වයෙකුගේ ප්‍රවෘත්ති කාලය සඳහා නොග න්නට ඇත්තේ ද පෙර සඳහන් කළ ලෙස කාලය සමඟ රටාවකට නොයන පරිදි සිදුවන විචලනයත්, එසේ ඇති විට විසර්ජනයෙහි සිදුවන අධිසංකීර්ණත්වයත් නිසා බව පෙනේ.

ථේරවාදයේ බොහෝ ආචාර්යවරු, සංස්කාරයක උත්පාද වය ලක්ෂණ දෙක එකවිට පැවතිය හැකි යයි යන මතයට විරුද්ධ වූයේ ඒ තුලින් යම් පරස්පර බවක්, සංකර බවක් ඇතිවේ යයි සිතූ නිසාය. එනම් උත්පාද හා වය එකට සිදුවිය නොහැකිබවයි. එකට සදිුවනනේ නම් ධර්මයක් ගොඩනැගීමට, මතුව ඒමට, වය ලක්ෂණය විරුද්ධව ක්‍රියා කොට ධර්මයෙහි පැවැත්ම නසනු ඇතැයි එම ථේරවාද හිමිවරු සිතූහ.

චිත්තයමක පාලියේ සිතක උප්පාදක්ෂණය ඇතිවිට භංගක්ෂණය නොමැති බව සඳහන් විය. ධර්මයක් ගොඩනැංවෙමින් පවතින විටම එය භංග වෙමින් පවතින්නේ යැයි කීම නම් තේරුමක් නැත.

නමුත් ඇතැම් ථේරවාද ආචාර්යවරු, ධර්මතාවයක උප්පාදය සමඟ උත්පාදක්ෂණයත් වය ලක්ෂණය සමග භංගක්ෂණයත් පටලවා ගෙන ඇතිබව නම් මෙතනදී නොකියාම බැරිය.

උප්පාදය

එසේ නම් 'උප්පාද වය' යන්නෙන් කුමක් අදහස් වන්නේද? හේතු සමාවායෙන් යම් ධර්මයක විද්‍යමාන වීමත්, හේතුනැතිවී යාමෙන් ධර්මයක විද්‍යමාන නොවීමත්ය.

මේවාට සංඛත ලක්ෂණ යැයි කියනුයේම එම නිසාය. සංඛත යන වචනයේ තේරුම හේතුන්ගෙන් සකස් වූ යන්නයි.

"උප්පාදෝ" යන්නට හේතු සහයෝගයෙන් හටගැනීම යැයි ද කිව හැක. අනෙකට නිරෝධය යැයි ද කිව හැක. නිවනටද නිරෝධය යැයි කියති. ඒ හේතු නැතිවීමෙන් නූපදීම යන අර්ථයෙන්ය. එය වෙනත් අර්ථයකි.

ධර්මයක විද්‍යමාන වන බව එහි උත්පාදක්‍ෂණයේ මුල සිටම ඇතියකි. තේරුම් ගතයුතු කරුණ වන්නේ නාම-රූප ධර්මයක භංගක්‍ෂණය පුරාවටත් එයට හේතුන්ගේ උපකාරය ලැබෙන බවයි. භංගක්‍ෂණයේදීත් ධර්මය පච්චුප්පන්න බව පෙර පෙන්වා දෙන ලදී. එසේ නොමැතිව භංගක්‍ෂණයේ ආරම්භයේ සිට හේතුන්ගේ උපකාරය, සම්බන්ධය නැතිවී ගොස් අහසේ පාවෙන්නාක් මෙන් තිබී ටික වේලාවකට පසු නිරුද්ධ වනවා නොවේ. එනිසා භංගක්‍ෂණයේ අවසානය දක්වාම, නැතිවීමට ඉතාමත් ආසන්න අවස්ථාවේ පවා එම ධර්මයේ යම් හෝ පවතින බවක් වේද එසේ පවතිනුයේ හේතුන්ගෙනි.

එසේ ඇතිවිට නාම-රූප ධර්මයේ මුළු ආයුෂය පුරාවට එය හේතුන්ගෙන් පවතින බැවින් "උප්පාදො පඤ්ඤායති" 'උත්පාදයක් පැනවේ' යන කියමන අර්ථවත් වේ. එම ධර්මය අස්ථයට ගිය පසු, නැත්තටම නැතිවූ පසු කිව යුතු වන්නේ අතීත වශයෙන් සලකා, උත්පාදයක් පැනවුනේය. "උප්පාදෝ පඤ්ඤායිත්ථ" ලෙසිනි.

වය

වය ලක්‍ෂණය දැක්වීම මීට තරමක් අසීරුය. පෙර ධර්මයක විද්‍යමාන ස්වභාවයේ විචලනයන් දැක්වීමට ප්‍රස්ථාර සටහන් යොදා ගැනුනි. එම වක්‍රවල ඕනෑම ලක්‍ෂයකින් ධර්මයක විද්‍යමාන බව පෙන්වයි. නාම-රූප ධර්මයක නැති බව ප්‍රස්ථාරයේ කිසිම ලක්‍ෂයකින් පෙන්විය නොහැක. නමුත් ඒ ඒ නාම-රූප, ඒවාට ආවේණික හේතු නිරෝධයෙන්

විද්‍යමාන නොවීම, එම නාම හෝ රූපයට අදාල කරුණක් නිසා වය ලක්ෂණය නාම-රූප වලම ලක්ෂණයකි.

වය ලක්ෂණය සම්බන්ධව පෙර උදෘත කරන ලද දුතිය ආනන්ද සූත්‍රයේ එක්තරා කාරණයකට අවධානය යොමු කිරීම වැදගත්ය. එහි ජාත වූ පාතුභූත වූ (හටගත්, පහළ වූ) රූප වේදනා ආදී ධර්ම සඳහා "වයෝ පඤ්ඤායති" (වයක් පැනවේ) ලෙස දක්වා ඇත. 'වය' යන්නෙන් ඒකාන්තයෙන් ධර්මයක භංගක්ෂණයෙදී සිදුවන්නක් හෝ භංගක්ෂණය අවසන නැත්තට නැතිව යාම හෝ අදහස් කරන්නේ නම්, ධර්මයක් පවත්නා මොහොතේ ගත්කල එය අනාගතයේ විනාශ වන්නේ හෝ වය වන්නේ යැයි කිවයුතු වේ. එනම් "යං රූපං ජාතං පාතුභූතං තස්ස වයෝ පඤ්ඤායිස්සති " ලෙස ("යම් රූපයක් ජනිත වී ඇත්ද පහළ වී ඇත්ද එහි වය පැනවෙන්නේ යැයි") වය ලක්ෂණය අනාගත වශයෙන් කිව යුතුව තිබිණ. නමුත් එසේ සඳහන් වී නැත.

උප්පන්න ස්වභාවයේ පවතින ධර්මයක වර්තමාන වශයෙන් වය ලක්ෂණය විද්‍යමාන වන බවයි ආනන්ද තෙරුන් පැවසුවේ. මෙයින් පෙන්නුම් කරන්නේ වය ලක්ෂණයද ධර්මයක උප්පන්න අවස්ථාව පුරාවට දක්නට ලැබෙන බවයි. ධර්මයක් නැත්තටම නැතිව ගිය පසු එහි තවදුරටත් වය ලක්ෂණය නොපෙන්වයි. අතීත නාම-රූප සම්බන්ධව අනඳ හිමියන් පැවසුවේ ඒවායේ වය ලක්ෂණය පැනවුනේය (පඤ්ඤායිත්ථ) කියාය. (පඤ්ඤායති) කියා නොවේ.

මීටම සම්බන්ධ සතිපට්ඨාන සූත්‍ර පාඨයක් ද මතක් කරගැනීම වටී. එහිදී "සමුදය ධම්මානුපස්සී විහරති" "වය ධම්මානුපස්සී විහරති" ලෙස වෙන් වෙන්ව සඳහන් කළ භාග්‍යවතුන් වහන්සේ ඊට පසුව "සමුදයවය ධම්මානුපස්සී විහරති" යැයි එක්කොට සඳහන් කර ඇත. ඒ සංස්කාරයක සමුදය, වය ආදී ලක්ෂණ දෙකම එකවිට විදර්ශකයාට දැනෙන බැවිනි. ග්‍රහණය කළයුතු බැවිනි. එසේ නොවන්නට සමුදය ධම්මානුපස්සී හා වයධම්මානුපස්සී ලෙස වෙන් වෙන්ව කියා

තිබියදී නැවත එක්කොට කීමේ අවශ්‍යතාවයක් පැනනොනඟී.

ඉහත අර්ථයන් කැටිවන ලෙස අනිත්‍ය මෙනෙහි කිරීම සම්බන්ධ සරළ අවස්ථාවක් සලකා බලමු.

හේතුඵල දහම හා අනිත්‍යතාවය

උදාහරණයක් ලෙස කලකට පෙර මියගිය පුද්ගලයෙකුගේ, එකල ඔබ දැක ඇති ශරීරයේ අනිත්‍ය ස්වභාවය මෙනෙහි කරන ආකාරය සිතා බලමු. එවිට තමන්ට අරමුණු වනුයේ එම පුද්ගලයාගේ යම් අවස්ථාවක ජීවමාන වූ ශරීර ස්වභාවයයි. එම ශරීර ස්වභාවය සිහිපත් වන අවස්ථාවේ, එය පෙර නොතිබී හටගත්තක් බව වැටහේ නම්, එසේම එම ශරීර ස්වභාවය හේතු නිරෝධයෙන් නැතිවූ බවද වැටහේ නම්, එනම් එකම ශරීර ස්වභාවය හටගෙන තිබූ බවක්ද, නැතිවූ බවක්ද එකවිට වැටහේ නම් ඔබ මෙනෙහි කළ ආකාරය නිවැරදිය. එසේ වැටහීමට එම ශරීරස්ථක රූපවල උත්පාදක්ෂණ භංගක්ෂණ ආදිය ගැන කල්පනාවට ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් නොවේ.

එම ශරීර ස්වභාවයේ නිරෝධය පැනවුණේ එයට පසුබිම් වූ හේතුන්ගේම නිරෝධයෙනි. උදාහරණයක් ලෙස එකල ඔහුගේ හමේ පැහැය එයට පසුබිම් වූ සතර මහාභූත පදනමකය පැවතුනේ. එම සතර මහාභූතවල නිරෝධයෙන් එම පැහැය අස්ථයට ගියේය. ඔබ දැන් එම ශරීරයෙහි අනිත්‍ය ස්වභාවය මෙනෙහි කරන මොහොත වන විට එම ශරීරය සම්බන්ධ කිසිවක් නැත. එය නැතිවුණේ ඔබ ජීවත්වන ලෝකයෙන් නොවේ.

ඔබ දැන් ජීවත්වන ලෝකය අමුතුවෙන් සකස් වූවකි. එය අතීත ශරීරය තිබෙන විට නොපැවතුනේය. එදා සිට අද දක්වා, එම ශරීරයට පරිභාහිරව පැවතුන ලෝකය පැවතෙන්නේ නම්, එම අතීත ශරීරය මේ ලෝකයෙන් නැතිවුණා යැයි කිව හැක. නමුත් එසේ නොවන නිසා එම අතීත ශරීරය නැතිවුනේ කොහෙන්ද යැයි ඇසුවොත් එයට පිළිතුර වනුයේ එහි හේතු තිබුණ තාක් එය පැවතුන බවත්, එය එහි හේතු මතම පිහිටා සිටි බවත්, එම හේතුම එයට පිහිටා සිටීමට ස්ථානය වූ බවත්, එම නිසා එහි නැතිවී යාම පසුව සිදු වූවක් නොව එම ශරීරය සමගම සිදුවූවක් බවය. තිබුණ තැනම සිදුවූවක් බවය.

එනම් වය ලක්ෂණය එම ධර්මතාවය ඇති විටම දත හැක්කක් බවය. වර්තමානයේ දිස්වන මනුස්ස ශරීරයක් සැලකූ විට එහි කර්මජ, ඍතුජ, ආහාරජ, චිත්තජ රූප එකවිට පවතිනවා. සමහර රූප හටගනිමින් තියෙනවා. සමහර රූප දුර්වල වෙමින් තියෙන්න පුළුවන්. නමුත් සැවොම ඉපදුණ අවස්ථාවකයි තියෙන්නේ. එනම් උප්පන්න ස්වභාවයකයි. මේ උප්පන්නභාවය සලකාගෙන මුළු ශරීරයම ඒකත්වයෙන් විදර්ශකයාට ග්‍රහණය කරන්න පුළුවන්. මොන අවස්ථාවක් ගත්තත් (any state) ඒ අවස්ථාව, අස්ථයට යනවා කියන කාරණය ප්‍රත්‍යක්ෂ කරන්න පුළුවන්.

මේ විදියට ඕනෑම රූපයක්, පුටුවක්, ගෙයක් අවශ්‍ය නම් මහ පොළොවම අනිත්‍ය ලෙස දකින්න පුළුවන්. කෙළෙස් හටගත්තේ යම් රූපයක් යම් ආකාරයකට පිඬු කරලාද, අරමුණු කරගෙනද, ඒ විදියටම ඒ රූප පිඬුවම එකවර අනිත්‍ය ලෙස මෙනෙහි කරගන්න පුළුවන්.

ලොකු රූපයක් සත්‍ය වශයෙන් නෑ. ඒවා සම්මුති (පඤ්ඤත්ති) කියලා ඒ නිසා ඒවායේ අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීමක් අදාල නැත කියලා දෘෂ්ටියකට ආවොත්

හරිම අවාසනාවක්. ක්ෂණ භංග කොයි මට්ටමින් සියුම් වුනත් සමුදය වය දකින්න මේ විධියට කිසි බාධාවක් නෑ. සමුදය වය කියන්නේ යමක් යම් අවස්ථාවක හේතූන්ගෙන් විද්‍යමාන වීමත් ඒ අදාල හේතු නැතිවීමෙන් එය විද්‍යමාන නොවීමත්.

ඉහත 'අවස්ථාව' කියල අදහස් කළේ මෙම කෘතියේ මුලින් සඳහන් වුණු 'ඛණය' හෙවත් "ක්ෂණය" ගැන නොවෙයි. ධර්මතාවයක පිළිබිඹු වන ඕනෑම මට්ටමක් ගැනයි. හේතු නැතිවීමෙන් ධර්මතාවයක්, අස්ථයට යනවා නැතිව යනවා, කියලා කියනකොට කෙනෙක් අර "යනවා" කියපු වචනය ඔස්සේ ගිහින් කාලය පටලවා ගන්න පුළුවන්. දැන් මෙම කෘතියේ ඉතාම වැදගත්ම තැන වන හේතු ඵල සහ කාලය අතර පටලැවිල්ල ගැන විස්තර කරදීමට සුදුසු අවස්ථාව කියලා අප හිතනවා.

කාලය

එසේ නම් කාලය යනු කුමක්ද? කාලය පැනවෙන්නේ කෙසේද? නාම-රූප ධර්මතාවල පැවැත්ම තුළමය කාලය නිරූපණය වනුයේ. කාලය යාම නිසා අලුතෙන් නාම හෝ රූප ධර්ම හටගන්නවා නොව නාම-රූප ධර්මවල හටගැනීමත් පැවතීමත් නිසා කාලය පැනවෙනවා. කෙනෙකුට කලක් ගියා යැයි හැඟෙනුයේ අවට පරිසරයේ හෝ තම ශරීරයේ වෙනස්කම් දකින විටත් දැනෙන විටත් පරිසරය ගැන අවධානයක් නැති වුවද, නොයෙකුත් චිත්ත ධාරාවන්ගේ පැවැත්ම හා නැතිව යාම සිහිවන විටය.

ලෝකය නාම-රූප ධර්ම වලින් විස්තර කිරීම අභිධර්ම න්‍යායයි. ථේරවාද අභිධර්මය අනෙකුත් නිකායන්ගෙන් වෙනස්වන ප්‍රධාන සාධකය වූයේ අනන්‍ය වූ නාම-රූප ධර්මවල පැවැත්ම පිළිගන්නා බවයි. විවිධ නාම හා රූප ධර්ම ලෙසින්ද කුසල, අකුසල, අබ්‍යාකත ලෙසින්ද අනන්‍ය ධර්මයන්ගේ පැවැත්ම පිළිගන්නා බවයි. ථේරවාද අභිධර්මය

තුල එම අනන්‍ය ධර්ම ස්වභාවයන් සඳහා කියනුයේ පරමාර්ථ කියා ය.

අභිධර්ම පිටකය තුල හෝ වේවා ථේරවාදය තුල හෝ වේවා කාලය කියා පරමාර්ථයක් දක්වා නැත. එසේ ඇතිවිට කාලය ගෙවීයාම මත හටගත් ධර්මතාවයක වය ලක්ෂණය පැනවෙනුයේද, නැතිනම් හේතු නැතිවීමේන් වය ලක්ෂණය පැනවෙන්නේදැයි, එක්තරා දාර්ශනික ගැටළුවක් මතු වේ. ථේරවාදයට අනුව බොහෝ විට අසන්නට ලැබෙනුයේ මුලින් දැක්වූ ආකාරයයි.

යම් සිතක් හෝ රූපමය ධර්මයක් අරමුණු කොට එහි නැතිවී යාම ගැන කල්පනා කරන විට, කෙනෙකු එහි කාලය සමග ක්ෂය වීම හෝ නැතිවීම සිතන විට ඔහු කරනුයේ, එම ඉලක්ක කරන ධර්මයට පරිභාහිර නාම-රූප ලෝකය හෝ, අතීතයේ දැක දැනගෙන ඇති නාම-රූප ලෝකය හෝ, ඇසුරුකොට ගොඩනගාගත් කාලය නැමැති මිම්මෙන්, තමන් ඉලක්ක කරන නාම හෝ රූප ධර්මයන්ගේ විය හැකි විචලනයන් ගැන කල්පනා කිරීමය.

අනෙක් නාම-රූප ධර්මයන්ගේ පැවැත්ම හා වෙනස්වීම නිසාය ඉහත කාලය යැයි පනවාගත්තේ. මෙවිට අනෙක් නාම හා රූපයන්ගේ පැවැත්ම හෝ වෙනස්වීම ඔස්සේ තමන් අරමුණු කරන නාම හෝ රූප ධර්මයේ වෙනස්වීම හෝ භංගය උපකල්පනය කිරීමක්ය සිදුකර තිබෙනුයේ. ඉලක්ක කරන, අරමුණු කරන ධර්මතාවය එහි හේතු මත පවතින බැවින් එහි අනිත්‍යතාවය කුමක් හෙයින් අනිත් ධර්මයන්ගෙන් සලකාගන්නේ ද? අනෙක් ධර්ම දිහා බලාගෙන තමන් අරමුණු කරන නාම-හෝ රූප ධර්මය නැතිවීමට බලා සිටිනවාද?

ඉහත අනෙක් ධර්ම හෙවත් පරිභාහිර ධර්ම ලෙස අදහස් කළේ ඉලක්ක කරන ධර්මතාවයට කිසිත් ඍජු සම්බන්ධයක් නැති, එහි සහජාත හේතුන් හෝ නොවන ධර්මයි. පරිභාහිර

ධර්මයන් ද සම්පිණ්ඩනය කොට අනිත්‍ය ලෙස සම්මර්ෂණය කරන විට, සිහි කරන විට, මෙම ගැටළුව නිරාකරණය වනු ඇත. තුන්කාලයට අයත් දුර ලඟ වශයෙන් භේද වූ සියළු නාම රූප ධර්මයන් ත්‍රිලක්ෂණයට නගා සම්මර්ෂණය කළයුතුය. එවිට පරිබාහිර ධර්මයන් වැරදියට මඤ්ඤනා කොට ගොඩනගාගත් කාලය නැමති මිම්මෙන් තමන් ඉලක්ක කරන නාම හෝ රූප ධර්මයේ අනිත්‍ය බව සාවද්‍ය ලෙස මෙනෙහි වීම නවතිනු ඇත.

එනමුත් නාම රූප ධර්මයන් පවත්නා කාලයන් අතර සංසන්දනයක්, නොකළයුතු යැයි ඉහත විවරණයන්ගෙන් කිසි ලෙසකින්වත් අදහස් නොකෙරේ. එහිද ප්‍රායෝගික අර්ථයක් ඇත.

මලක පැහැය ගතහොත්, එය එහි සතර මහාභූත මත පිහිටා ඇත. එහි අනිත්‍යතාවය ඊට පරිබාහිර ධර්මතාවලින් කියනවාට වඩා එයත් සමඟ යෙදුණු එහි සතර මහාභූත නැමැති ප්‍රත්‍ය ධර්ම වලින් කල්පනා කිරීම යෝග්‍ය බවයි පෙනෙනුයේ.

ඉහත විස්තර කළ කාලය සම්බන්ධ කාරණය වෙනත් ආකාරයකින් ද තේරුම් ගත හැකිය. නොයෙකුත් ධර්ම හටගනුයේ හෝ නැතිවනුයේ එකම ලෝකයක් තුලින් නොවේ. පෙර අවස්ථාවක සඳහන් කළ පරිදි ටිකකට කලින් ඇති වූ සිතිවිලි ඊට පසු සිතකින් විදර්ශනාවට ලක් කරන විට හෝ පසු අවස්ථාවක ඒ ගැන කල්පනා කරන විට, එම මුල් සිත නැතිවූයේ පසු අවස්ථාවේ පවතින ලෝකයෙන් නොවේ. පසු අවස්ථාවේ සිත හටගත්තේද මුල් සිත තිබුණා වූ ලෝකයටද නොවේ.

ඒ ඒ ධර්ම පිහිටි ස්ථානය (ලෝකය) වූයේ ඒ ඒ ධර්මයන්ට අනන්‍ය හේතූන්ය. මෙසේ ඇති විට, එම හේතූන් සමග සබැඳුණු ධර්මයෙහි, එම සම්බන්ධය තුලින්ම අනිත්‍යතාවයක්, ක්ෂණ භංගයක් සොයාගන්නවා විනා සමස්ථ

ලෝකයක් ඇසුරු කරගෙන බිහිවන කාලය ඔස්සේ අනිත්‍යතාවය සෙවීමට යාම නිරර්ථක උත්සාහයකි.

සැවැත් නුවරදී භික්ෂුවක් බුදුරජාණන් වහනසේගෙන් අසන ලද පැනයකට භාග්‍යවතුන් වහන්සේ දුන් පිළිතුර මෙතනදී සිහිකර ගැනීමද වටී. සංයුක්ත නිකායේ ඛන්ධ වර්ගයේ ගෝමය පිණ්ඩය සූත්‍රයේදීය මෙම කාරණය හමුවනුයේ. එහිදී භික්ෂුව අසනුයේ,

"භාග්‍යවතුන් වහන්ස නිත්‍ය වූ සදාකාලික වූ එලෙසම පවතින්නා වූ ශාශ්වත දෙයකට සමවූ යම් රූපයක් වේදනාවක්..... විඤ්ඤාණයක් ඇත්තේද?" කියාය.

"ඊට පිළිතුරු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ, නිත්‍ය වූ ස්ථිර ලෙස පවත්නා වූ ශාශ්වත වූ එලෙසම පවතින කිසිදු රූප, වේදනා, සංඥා, ආදී ධර්මයක් නැති බව පැවසුවේය."

තවදුරටත් අර්ථය ඉස්මතු කරදීමට භාග්‍යවතුන් වහන්සේ පැවසූ ලද්දය කෘතියේ ප්‍රස්තුතයට මෙතනදී අදාල වනුයේ. "

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ගොම ස්වල්පයක් අතට ගෙන (වේලුනු ගොම වැටියක්) මහණ, මෙතරම් හෝ නිත්‍ය වූ ශාශ්වත වූ විපරිනාමයට පත් නොවන ආත්මභාව පටිලාභයක් නොවේ යැයි එම භික්ෂුවට වදාල සේක..."

නිත්‍ය දෙයක් ඇද්දැයි ඇසූවිට, ථේරවාදී අභිධර්මයට අනුව සිතන කෙනෙකු නම් බොහෝ විට මීට පිළිතුරු සපයනු ඇත්තේ ඉහත භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු දුන් ආකාරයට නොව, අසුරු සැනක් ගහන මොහොතක්වත් හෝ එයින් දසදහසෙන් පන්ගුවක්වත් කාලයක් පවතින කිසිදු නාමරූප ධර්මයක් නැතැයි කියාය. හෝ ක්ෂණයක් පාසා සියලු නාමරූප ධර්මයන් බිඳීයන්නේ යැයි කියාය.

නමුත් භාග්‍යවතුන් වහන්සේ එසේ කාලය ඔස්සේ නොවේ අනිත්‍යතාවය මතුකළේ. කාලය අතහැර දැමූ විට,

ධර්මතාවයක විචලනය දැක්වීමට සිදුවනුයේ එහි හේතුන් සමඟය. උදාහරණයක් ලෙස කායික සැප වේදනාව එහි ප්‍රධාන හේතුවක් වන ස්පර්ශය සමග විචලනය විය හැකි ආකාරයක් පහත ප්‍රස්ථාරයෙන් නිරූපණය කොට ඇත.



පෙර නොතිබී හටගත් වේදනාව නැවත මුලටම පැමිණේ.

එම වේදනාවට අදාල ස්පර්ශය ශූන්‍ය වන විට නැවතත් වේදනාව ශූන්‍ය වේ. යම් සේ ව්‍යායාම රෝලරයක ඇවිදින මිනිසෙකුගේ ගමන වැනිය. ඔහු කොතරම් ඇවිද්දත් එක තැනමය. එක්තරා ආකාරයකට සත්වයෙකුගේ මුළු සංසාර ජීවිතයම එකතැන කරකැවිල්ලකි. ඉදිරියට යාමක් නැත. බුදුරජාණන් වහන්සේ, ජීවන ගමනට සංසාරය යැයි කීවේ මේ නිසාද විය හැක.

ස්පර්ශයට අමතරව කායික සැප වේදනාවේ තවත් හේතු ලෙස කායායතනය, එහි ගැටෙන ආරම්මණය, සහජාත අනෙකුත් චිත්ත චෛතසික ධර්ම, අතීත කර්ම ශක්තිය, ආදිය දැක්විය හැක. බොහෝ හේතුන් සමඟ වේදනාව විචලනය වන ආකාරය ප්‍රස්ථාරයකින් පෙන්වීම දුෂ්කරය.

සැපවින්දනය හටගන්නා මොහොතේ එයට පාදක වන කායායතන රූපය දුබල හෝ ප්‍රබල වෙමින් තිබිය හැක. ඵොට්ඨබ්බාරම්මණයද (පඨවි, තේජෝ, හෝ වායෝ රූප ස්වභාවයක් ලෙසින්) ප්‍රබල හෝ දුබල වෙමින් පැවතිය හැක.

මෙම මොහොතට බලපාන අතීත කර්මශක්තියද ක්ෂය වෙමින්ය පවතිනුයේ. එම කුසල කර්මය සුබ වේදනාව හටගන්නා මොහොතේ විපාක දෙමින්ය පවතිනුයේ. මෙසේ විවිධ විචලනයන් ඇති ධර්ම සමායෝගයෙන් විවිධ අවස්ථාවල හටගන්නා විවිධ කායික සැප වින්දනයන්ගේ කෙසේ ආයුෂ සමවන්නේද? නොවේමය.

එකම චිත්තයක පවා උත්පාද හා භංගක්ෂණවල ආයුකාලයන් සමාන වීමටද කාරණයක් නොපෙනේ. සිතක ආයුෂය හරියටම දෙකට බෙදා දැක්වීමටද අවශ්‍යතාවයක් පැන නොනඟී. උත්පාදක්ෂණයේ ආයුෂය භංගක්ෂණයේ ආයුෂය සමඟ වෙනස්වුවද යමකප්ප්‍රකරණ පාලියේ ඇති බුද්ධ වචන සමඟ පරස්පරතාවයක් හට නොගනී. අභිධර්මයෙන් ඉදිරිපත්වන බුදු දහම නියතිවාදයක් යැයි නැගෙන චෝදනාවද එවිට ඉදිරිපත් නොවනු ඇත. යම් ධර්මයක පැවතීමෙහිලා එහි ප්‍රත්‍යයන්ගේ බලපෑම නොසලකා හැරීමක් ද සිදු නොවනු ඇත. බුදුදහම අකරිය වාදයක් දෙසට නැඹුරු වීමක්ද සිදු නොවනු ඇත.

ඉහත කාරණය නිරූපණය කිරීමට, තේරුම් ගැනීමේ පහසුව තකා කාලය සමඟ ප්‍රස්ථාරයෙන් දැක්වේ.



ඉහත උත්පාදක්ෂණයට, භංගක්ෂණයට වඩා වැඩි ආයුෂයක් දක්වා ඇත.

ප්‍රස්ථාරය මෙසේද විය හැක.



කායික වින්දනය හටගෙන ඇතිවිටම ආරම්මණය හා කායායතනය ක්‍රමයෙන් බලවත් වූවොත් සැප වේදනාව මියැදෙන්නට යන කාලය වැඩිවියද හැක.

"උප්පාදෝ පඤ්ඤායති" හා 'උප්පාදක්ඛණේ' යන පාලි වචනවල උප්පාදෝ හා උප්පාද ලෙසින් සමානත්වයක් දිස්වන නිසා කෙනෙකුට ඒවා එකම අර්ථයක් ගෙන දෙන වචන දෙකක් මෙන් වැටහීම සාධාරණය. භාග්‍යවතුන් වහන්සේ එසේ ළඟින් යන වචන යොදා ගන්නට ඇත්තේ උත්පාදක්‍ෂණයෙන් ධර්මයක් ගොඩනැගෙමින්, හටගනිමින් තිබීම නිරූපණය වන නිසා, උප්පාද යන සංඛත ලක්‍ෂණය ඒ අවස්ථාවෙන් වඩාත් ප්‍රකට වන නිසා විය යුතුය.

බුද්ධකාලයෙන් වසර 200කට පමණ පසු යුගයේ සම්පාදනය කළ කෘතියක් වන කථාවස්ථුපකරණයේ **"චිත්තඨිති "** කථාවේ භංගක්ඛණේ වෙනුවට වයක්ඛණේ යැයි මොග්ගලීපුත්තතිස්ස තෙරුන් වහන්සේ සඳහන් කරන්න ඇත්තේද, එම ක්‍ෂණයේදී වඩාත් වය ලක්‍ෂණය ප්‍රකට වන බැවිනි. එම කථාවස්ථුවේද පෙන්නුම් කරන්නේ සිතක

ආයුකාලය උප්පාදක්ඛණය හා වයක්ඛණය ලෙසින් දෙකොටසකින් නිරූපණය කර ඇති බවයි.

පරවාදීන්ගේ අදහස වූයේ සමහර සිතක් බොහෝ කල් පවත්නා බවයි. ධ්‍යාන සමාපත්තියකදී එක් සිතක් දිනයක් පුරාවට සිටිය හැකි බවයි. ඔවුන්ගේ එම මිත්‍යා අදහස මැඩ පැවැත්වීමට තෙරුන් වහන්සේ විමසනුයේ දවසෙන් අඩක් උප්පාදක්ඛණයද අනෙක් කොටස වයක්ඛණයද කියාය. කථාවස්ථුපකරණය සම්පාදනය කරන යුගය වන විටත් ක්ෂණ 03කින් (උප්පාද, ඨිති, භංගක්ෂණ ලෙසින්) නාම-රූප ධර්මයක ආයුකාලය නිරූපණය කිරීමක් නොවූ බවට එම කතාවෙන්ද ගම්‍ය වේ.

මේ කාලය හා චිත්තක්ෂණ ගැන කල්පනා කරන විට ඊට සම්බන්ධ දිව්‍ය ලෝකයේ වුණු අපූරු සිද්ධියක් තිබෙනවා. ධම්මපදයේ එන පතිපූජක කුමාරි වස්ථුවේදීයි මේ ගැන සඳහන් වනුයේ. දහමේ සඳහන් වෙනවා තව්තිසා දිව්‍ය ලෝකයට දවසක් ගතවෙන කොට මනුස්ස ලෝකේ අවුරුදු සීයක් ගතවෙනවා කියලා. ඒකෙන් අදහස් වෙන්නේ ඔවුන් එක දවසකදී අවුරුදු සීයක් පමණ කාලයක් සැප විඳිනවා කියන එක නෙවෙයි. ඔවුන්ට එම එක දවස අවුරුදු 100ක පමණ කාලයක් ලෙස දැනෙන්නේ නෑ.

තව්තිසා වැසි එක්තරා දිව්‍ය පුත්‍රයෙකුට හිටියා දිව්‍යාංගනාවක්. ඇය උදෑසන, උයනේ මල් කඩමින් ඉන්නකොට චුතවුනා. ඇය මිනිස් ලොව ඉපදුනා. වැඩිවියට පත්වී විවාහ වී දරුවන් කිහිප දෙනෙකුද හැදුවා. මේ අතරේ ඇය නැවත හිටපු දිව්‍ය ලෝකයට යන්නට පතාගෙන නොයෙකුත් පිංකම් සිද්ධ කළා. සිල් රැක්කා. මරණයෙන් පසු ඇය එදා මල් නෙළමින් සිටි උයනේම හවස් වරුවේ ඉපදුණා.

දිව්‍ය පුත්‍රයා අහනවා දවල වරුවේ දකින්නට සිටියේ නැහැ. කොහෙද ගියේ කියලා? ජාතිස්මරණ ඥාණයෙන් ඇය

දුන් පිළිතුර අහලා දිව්‍ය පුත්‍රයා මවිත වුනා. මනුස්ස ලෝකයේ එච්චර අඩු ආයුෂයක්ද තිබෙන්නේ කියා.

එතකොට දෙවියාට දැනිලා තියෙන්නේ වරුවක් විතර කාලයක් ගියා කියලා. එහෙම නැතුව එම දෙවියයි අනෙක් දිව්‍යාංගනාවොයි එම මල් උයනේ අවුරුදු 50ක් 60ක් ගතකළා නෙමෙයි. අවුරුදු 50 ක් මල් උයනක මොනවා බලන්නද? මෙතනින් පෙන්නුම් කරනවා ඒ ඒ ලෝකවල කාලය ගතවෙන විදිහේ වෙනසක් තියෙන බව. කාලය නාම-රූපවලින් නිරූපණය වන නිසා, නාම-රූපවල ආයුෂයන්හි ලෝක වශයෙන්ද වෙනසක් විද්‍යමාන වන බවයි පෙනෙන්නට තියෙන්නේ.

චිත්තවීථි අතරේ භවංග සිතුවිලි දෙවියන්ට වැඩි වත්ද කියලා කෙනෙකුට හිතෙන්න පුළුවන්. කෙනෙක් ගැඹුරු නින්දට ගියහම ඔහුට කාලය කොපමණ ගතවුනා දැයි, අවධි වුන විට කියන්නට හැකිවනුයේ අවට පරිසරයේ වෙනස්කම් හා ශරීරයේ නින්දට පෙර හා පසු වෙනස්වීම් සංසන්දනය කරලායි. එහෙම වෙනසක් නැත්නම් කොපමණ වේලා නිදාගත්තද කියා කියන්නට අපහසුයි.

ගැඹුරු නින්දේදී පවතින්නේ භවංග සිතුවිලි. නමුත් චිත්තවීථි අතරේ භවංග සිතුවිලි වැඩිවුණොත් වෙන ප්‍රශ්ණයක් මතුවෙනවා. දෙවියෝ දෙන්නෙක් අතරේ සන්නිවේදනය කරන්න ගියහම කෙනෙක් කථාකරලා පිළිතුරක් ගන්න ටිකක් වෙලා බලාගෙන ඉන්න වෙනවා. හැමෝටම එකම වේලාවේ භවංග සිත් හටනොගන්න නිසා.

ඨිතස්ස අඤ්ඤතත්තං

පෙර උත්පාද හා, වය ලක්‍ෂණ ගැන විස්තර විය. දැන් " ඨිතස්ස අඤ්ඤතත්තං" යන සංඛත ලක්‍ෂණය ගැන කිව හොත්

' **ඨිති** ' යන්නෙන් ධර්මතාවයක **'සිටිනා බව'** අදහස් වේ යැයි පෙර දක්වන ලදී. එසේ සිටිනා බව මුළු ආයුකාලය පුරාවටම පැනවිය හැකි බවද පෙන්වා දෙන ලදී. "ඨිතස්ස අඤ්ඤථත්තං" යන්නෙන් "සිටියහුගේ අන්‍යාකාරයක්" ලෙසින් පහළ වූ ධර්මතාවයක සතත වෙනස්වීම පෙන්නුම් කරයි. පහළ වූවාට පසු ඒකාකාරි ස්වභාවයක පැවත, පසුව බිඳීයනවා නොව පහළ වීමේ සිටම සතත වෙනස්වීමක් සිදුවන බවයි පෙන්නුම් කරනුයේ.



ඉහත 2 ප්‍රස්ථාරයේ සංඛත ධර්ම ලෙස විශේෂයෙන් අදහස් කරනුයේ චිත්ත චෛතසික හා චිත්තසමුට්ඨාන රූපයෝය. අනෙක් රූප සඳහා ක්‍රමානුකූල විචලනයක් අපේක්ෂා කළ නොහැකිය. තිරස් අක්ෂයෙන් කාලය කියා දැක්වූයේ තේරුම්ගැනීමේ පහසුව තකාය.

මේ නිසා නාම-රූප ධර්මතාවයක් සඳහා ඨිතියක් ඇතැයි පවසනවාට වඩා, වඩාත් සුදුසු සිටියහුගේ අන්‍යාකාරයක් ඇතැයි කීමය. කෙටි කාලයක් තුල හෝ වෙනස් නොවෙමින් ඒකාකාරී ලෙස, ධර්මයක් පවතින්නේ යැයි අදහස් කළ නොහේ. (පළමු ප්‍රස්ථාරයේ දැක්වූ අයුරින්). එසේ වුවහොත් එම ධර්මය දෙයක් බවට පත්වේ. එනම් "ඇත" යන අන්තයට සිත වැටේ. (අත්ථීති බෝ කච්චායන ඒකෝ අන්තෝ)

නමුත් ධර්මයක අනන්‍ය ස්වභාවයක් නැති බවක් මෙයින් අදහස් නොකෙරේ. උදාහරණයක් ලෙස එක් අවස්ථාවක හටගන්නා කායික දුක් වේදනාව සැලකුවහොත් එය

උත්පාදක්‍ෂණයේදී ක්‍රමයෙන් වැඩි වී, එනම් දුක් විඳින බව ක්‍රමයෙන් වැඩිවී, භංගක්‍ෂණයේ ආරම්භක අවස්ථාවේ උපරිමයට පැමිණ ඉන්පසු ක්‍රමයෙන් අඩු වේ. වැඩිවුනෙත්, අඩුවුනෙත් දුක් වේදනාත්මක ස්වභාවයමය.

තවත් නිදසුනක් ලෙස මෛත්‍රී සහගත කුසල සිතක් සැලකූ විට, එම සිතේ උත්පාද ක්‍ෂණයේදී එය ක්‍රමයෙන් වැඩි වී, එනම් යම් කෙනෙකු අරමුණු කොට හටගත්තේ නම්, එම පුද්ගලයා කෙරෙහි මෛත්‍රී සහගත බව ක්‍රමයෙන් බලවත් වී, උපරිමයකට ගොස් ඉන්පසු ක්‍රමයෙන් අඩුවී අවසානයේ විද්‍යාමාන වනබව සම්පූර්ණයෙන්ම නැතිව යයි. එයට ස්ථාවරව ඒකාකාරව සිටීමේ හැකියාවක් නැත. සෑම විටම එහි ප්‍රත්‍යය විචලනය වන නිසාය.

මේ සම්බන්ධව පුරාණ ථේරවාද ආචාර්යවරු අතර සාකච්ඡා වූ කරුණක් වූයේ "හටගත් ධර්මයම නැති වේද? නැතහොත් අනෙකක් හටගෙන අනෙකක් නැතිවේද යන්නයි. හටගත් ධර්මයම නැතිවේ යැයි කීමට අවශ්‍ය වූ නිසා සමහරෙක් උත්පාද හා භංගක්‍ෂණ අතර ඒකාකාරී ඨිතික්‍ෂණයක් කෙරෙහි වඩාත් නැඹුරු වූ බවක් පෙනේ.

පෙර සඳහන් කළ මෛත්‍රිය සම්බන්ධ නිදසුන සැලකීමේදි, බලවත් හෝ දුබල වෙමින් එම චිත්තය පවතින කාලය (අවස්ථාව) පුරාවට පැවතුනේ මෛත්‍රී සහගත ස්වභාවයක්ය, කුසල ස්වභාවයක්ය. උත්පාදක්‍ෂණයේදී පැනවෙන උප්පජ්ජති යන්නෙන් අදහස් වන්නේ මෛත්‍රී ස්වභාවයේ බලවත් වීම මිස එය සම්පූර්ණයෙන් හටගෙන නැති බවක් නොවේ. භංගක්‍ෂණය පුරාවටත් දුබල වෙමින් හෝ පවතිනුයේ මෛත්‍රී ස්වභාවයමය. මේ ආකාරයට අනෙකක් හටගෙන අනෙකක් නැති වුනා නොව, මෛත්‍රී ස්වභාවයේම හටගැනීමත් නැතිවීමත් පැනවුනේ යැයි කිව හැක.

එහි උප්පන්න අවස්ථාවට පෙරාතුව එය සර්වාකාරයෙන් නොතිබූ බැවින්ද, කුසල ධර්මයක් වන බැවින්ද, අලෝභය අමෝහය ආදී ඊටම ආවේණික සහජාත හේතු ඇති බැවින්ද, තවත් නොයෙකුත් අනන්‍ය වූ ලක්ෂණ ධරන බැවින්ද, එම මෛත්‍රී සහගත චෛතසික ස්වභාවය අනන්‍ය බවක් පෙන්නුම් කරයි. එම අනන්‍ය ස්වභාවයෙහිය උත්පාදයක් පැනවුනේ, වය පැනවුනේ, සිටියහුගේ අන්‍යාකාරයක් පැනවුනේ.

මෙසේ "ඨිතස්ස අඤ්ඤතත්තං" යන්න තේරුම් ගත් පසු වෙන් වූ ඨිතික්ෂණයක අවශ්‍යතාවය පැන නොනඟී. නමුත් රූප සඳහා ඨිතික්ෂණයක් නොගන්නේ නම් සංඛාර යමකයේ විසර්ජන සමඟ කෙසේ ගළපාගන්නේ දැයි ථේරවාද ආචාර්යවරුන්ට පැමිණි පෙර සඳහන් කළ ගැටළුව මතුවේ. එයට විසඳුමක් සංඛාර යමකයෙන්ම හමුවේ.

චිත්තසමුට්ඨාන රූපයක පැවැත්ම

චිත්තසමුට්ඨාන රූපයක් වන ආශ්වාස-ප්‍රාශ්වාස සෑම විටම සිත සමඟ හටගන්නා බවත් සිත සමඟම නැතිවී යන බවත් එම යමකයේ සඳහන් ව ඇත. එනම් අස්සාස පස්සාස යම් සිතක් සමඟ හටගන්නේද එම සිතේ උත්පාදක්ෂණය කායසංඛාරයේ උත්පාදක්ෂණය සමඟ සමපාත විය යුතුය. අනෙක් අතට කායසංඛාරයේ භංගක්ෂණය යම් සිතක භංගක්ෂණය සමඟ සමපාත විය යුතුය. නොඑසේ නම් යමක පාලියේ එන බුද්ධ වචනය සමඟ සෘජුවම විරුද්ධ වේ.

චිත්තසමුට්ඨාන රූපයක ආයුකාලයද චිත්තක්ෂණ 17 වියු යුතු යැයි (කායවිඤ්ඤත්ති, වචීවිඤ්ඤත්ති රූප හැරෙන්නට) ථේරවාද අභිධර්මයේ එන පූර්ව නිගමනය නිසාය තරමක ගැටළුවක් පැන නඟිනුයේ. කිසිම විටෙක සිතක උත්පාදක්ෂණයේදී කායසංඛාර නිරුද්ධ නොවන බවත්, සිතක භංගක්ෂණයේදී කායසංඛාර හටගනිමින් තිබිය නොහැකි වීමත් නිසාත්ය. සිතක බලපෑමෙන් නැඟීසිටින

හෙයින්ය යම් රූප ස්වභාවයකට චිත්තසමුට්ඨාන රූපයක් යැයි කියනුයේ.

ඉඳින් එම සිත භංගක්‍ෂණයේදී ක්‍රමයෙන් දුර්වල වී නැතිව යන විට, එම සිතේ ජනක ප්‍රත්‍යයෙන් නැගී සිටීමට උපකාරය ලද චිත්තසමුට්ඨාන රූපයද, ක්‍රමයෙන් දුර්වල වනු ඇත.

සිතකට වඩා ආයුෂ එයට ඇත්තේ යයි සළකන්නේ නම්, එය හටගත් සිතේ භංගක්‍ෂණය අවසානයේ එය අවසන් නොවී, ඊළග ඊළග සිතේ උත්පාදක්‍ෂණයේ එය බලවත් වෙමිනුත් භංගක්‍ෂණයන්හිදී දුර්වල වෙමිනුත් පැවත පසුව යෙදෙන සිතක් අවසානයේ නැතිව යනු ඇතැයිද සැළකිය හැක.

සිතක් සමග කායසංඛාරය 'උප්පජ්ජති' යැයි යෙදෙන විට එම සිතේ ආරම්භය සමග කායසංඛාරය පෙර නොතිබී හටගත්තායැයි සැලකීමේ අවශ්‍යතාවයක් නැත. පෙර සිතේ භංගක්‍ෂණයේදී දුර්වල වූ කායසංඛාරය ඊළග සිතේ උත්පාදක්‍ෂණයේදී බලවත් වෙමින් ශක්තිමත් වෙමින් පවත්නේ නම්, ඒතාක් යමක පාලියට පරස්පර නොවේ.

එසේම 'නිරුජ්ඣති' හෙවත් 'නිරුද්ධ වෙමින් පවතී' යන යමක පාලියේ සඳහන්වන වචනය වර්තමාන අර්ථයෙන් යෙදෙන නිසා, නැතිවුනා ලෙස අතීත අර්ථයක් ඉන් අදහස් නොවන නිසා, පෙර සිතේ භංගක්‍ෂණයේදී දුර්වල වූ කායසංඛාරය එම සිත සමග සම්පූර්ණයෙන්ම නැතිව ගියා යැයි සැලකීමේ අවශ්‍යතාවයක්ද නැත.

තවද පොදුවේ සියලු චිත්තසමුට්ඨාන රූපවල දක්නට ඇති විශේෂත්වයක් වනුයේ ඒවා කබලීකාර ආහාරයේ උපස්ථම්බනයක් නොලබන බවයි. චිත්තසමුට්ඨාන රූපයකට එය සැදුම්ලත් සතරමහාභූත පද්ධතියේ එකිනෙක අතිරින් ලැබෙන උපකාරය හැරෙන්නට බාහිර උපකාරයක් වශයෙන් ලැබෙනුයේ එය අනුගත වන්නා වූ සිතෙන්

ලැබෙන උපකාර පමණකි. සිත චිත්තසමුට්ඨාන රූපයනට විප්පයුක්ත, නිස්සය සහජාත, අත්ථි ආදි ප්‍රත්‍ය බලයන් ගෙන් උපකාර වේ.

උදාහරණයක් ලෙස රාග සිත් ධාරාවක් එක පෙළට හටගන්නා විට ඊට අනුයාතව ශරීරය තුල හටගත් සුවිශේෂි රූප ස්වභාවයක් වේද, එය ඒ ඒ රාග සිතේ උත්පාදක්ෂණයේදි බලවත් වෙමින්, භංගක්ෂණයේදි දූර්වල වෙමින් පැවත එම සිත් ධාරාවේ අවසාන රාග සිත සමග බිඳී යන්නේ යැයි සැළකිය හැක. මෙසේ ඇතිවිටද ඨිති ක්ෂණයක් උපකල්පනය කිරීමේ අවශ්‍යතාවයක් නැත.

නමුත් කර්මජ රූප බාහිර උපකාරයක් ලෙසින්, කබලීකාර ආහාරයේ උපස්ථම්බනයත්, අතීත කර්මයේ උපකාරයත්, සිතේ උපස්ථම්බනයත් ලබන බැවින්, එම සමහරක් හේතූන්ගේ විචලනය ඒකාකාර නොවන බැවින් ඒවාට ඉහත සඳහන් කළ පරිදි සිතට අනුයාත පැවැත්මක් නැත.

එනමුත් සංඛාරයමකයේ කරුණු යෙදී ඇති ආකාරය අනුව ආශ්වාස-ප්‍රාශ්වාස එක් චිත්තක්ෂණයක් පමණක් පවත්නේ ලෙසට ගතයුතු යැයි භාග්‍යවතුන් වහන්සේගේ අදහස වූයේ යැයි හැඟේ. සංඛාරයමකයේ මුල්ම කොටසේ පාඨයක් මෙසේය.

"යස්ස වා පන වචීසඞ්ඛාරෝ උප්පජ්ජති, තස්ස කායසඞ්ඛාරෝ උප්පජ්ජතීති : විනා අස්සාසපස්සාසේහි විතක්කවිචාරානං උප්පාදක්ඛණේ තේසං වචීසංඛාරෝ උප්පජ්ජති, නෝ ච තේසං කායසංඛාරෝ උප්පජ්ජති, පඨමජ්ඣානං සමාපන්නානං කාමාවචරානං අස්සාසපස්සාසානං උප්පාදක්ඛණේ තේසං වචීසඞ්ඛාරෝ ච උප්පජ්ජති, කායසඞ්ඛාරෝ ච උප්පජ්ජතී ''

තේරුම : '' තවද යමෙකුට වනාහි වාක්සංස්කාරය උපදී නම්, ඔහුට කායසංස්කාරය උපදීද යත් :

ආශ්වාසප්‍රාශ්වාසයෙන් තොරව විතක්කවිචාරයන් උපදනා කෙනෙහි, ඔහුට වාක්සංස්කාරය උපදී. ඔවුනට කායසංස්කාරය නොමඋපදී. කාමාවචරයෙහි ප්‍රථම ධ්‍යානයට සමවන්නහුට ආශ්වාසප්‍රාශ්වාසයන් උපදනා කෙනෙහි, වාක්සංස්කාරය ද උපදී, කායසංස්කාරයද උපදී. ''

ඉහත ''ආශ්වාසප්‍රාශ්වාසයෙන් තොරව විතක්කවිචාරයන් උපදනා කෙනෙහි'' යන පාඨයෙන් ආශ්වාසප්‍රාශ්වාස ක්‍රියාවලියක් පවත්නේ නම් විතක්කවිචාරයන් උපදනා විට එම උප්පාදක්ෂණයෙහි ආශ්වාසප්‍රාශ්වාසද උපදිමින් පවත්නේ යැයි ගම්‍ය වේ. මීටම සමාන්තර පාඨ බොහෝ සෙයින් සංඛාරයමකයේ දැකගත හැක.

තවද සංඛාරයමකයේ සමහර තැනක හමුවන ''අස්සාසපස්සාසානං උප්පාදක්ඛණේ , අස්සාසපස්සාසානං භංගක්ඛණේ '' යනාදී පාඨ වලින්ද ගම්‍ය වනුයේ ආශ්වාසප්‍රාශ්වාසයේ ආයුකාලය උප්පාදක්ෂණය හා භංගක්ෂණය යන ක්ෂණ දෙකින් පමණක් නිරූපණය වන බවයි. කුමක් හෙයින්ද යත්, පෙර සඳහන් කළ පරිදි ඇස කණ වැනි කර්මජ රූප සඳහා යමකපාලිය පුරාවට එවායේ උප්පාදක්ෂණ හෝ භංගක්ෂණ ගැන සඳහනක් නැති නිසාත් අතරමැද වෙනත් කාලපරාසයක් නැති බවට යමකපාලියේ තොරතුරු තුලින් තහවුරු වූ චිත්ත චෛතසික වලට පමණක් එසේ ක්ෂණ දෙකක් යොදා තිබීමත් නිසාය.

සංඛාර යමකයේ අනාගත වාරයේ එන පහත සඳහන් පාඨ පිරික්සා බැලීමෙන්ද යථෝක්ත කාරණය තවදුරටත් ගම්‍ය වේ.

"යස්ස වා පන චිත්තසඞ්ඛාරෝ උප්පජ්ජිස්සති, තස්ස කායසඞ්ඛාරෝ උප්පජ්ජිස්සති : යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරනාං පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති, රූපාවචරේ

අරූපාවචරේ පච්ඡිමභවිකානං, යේ ච රූපාවචරං අරූපාවචරං උප්පජ්ජිත්වා, පරිනිබ්බායිස්සන්ති තේසං චවන්තානං, තේසං චිත්ත සංඛාරෝ උප්පජ්ජිස්සති, නෝ ච තේසං කායසංඛාරෝ උප්පජ්ජිස්සති, ඉතරේසං තේසං චිත්ත සංඛාරෝ ච උප්පජ්ජිස්සති, කායසංඛාරෝ ච උප්පජ්ජිස්සති.”

යමකය ද්විතිය භාගය බු.ජ. 26 පිට

“තවද යමෙකුට චිත්තසංස්කාරය උපදින්නේ නම් ඔහුට කායසංස්කාරය උපදින්නේද (අනාගතයේ) යත් : යම් සිතකට අනතුරුව කාමාවචරයනට පශ්චිම චිත්තය උපදින්නේද, රූපාවචරයෙහි හා අරූපාවචරයෙහි පශ්චිම භවිකයනට ද, යම් කෙනෙක් රූපාවචරයෙහි හෝ අරූපාවචරයෙහි ඉපිද පිරිනිවෙන්නාහු නම් ඔවුන් චුත වන විට දැයි, ඔවුනට චිත්තසංස්කාරය (අනාගතයේ) උපදින්නේය, නමුත් ඔවුනට කායසංස්කාරය නොම උපදින්නේය, (අනාගතයේ) “සෙසු අයට චිත්තසංස්කාරයද උපදින්නේය කායසංස්කාරයද උපදින්නේය.”

ඉහත යමක පාඨයෙන් විමසනුයේ, කෙනෙකුට සංඥා වේදනා ලෙසින් අදහස් කරන චිත්තසංඛාර අනාගතයේ හටගන්නට ඇත්නම් ඔහුට කායසංඛාර අනාගතයේ හටගන්නට ඇත්තේදැයි කියාය. අනාගතයේ යැයි අදහස් කරනුයේ එක් ජීවිතයක පමණක් නොව සියළු සසර අනාගතයයි.

එම පාඨයට පිළිතුරු ලෙස, මුලින් එසේ නොවන අවස්ථා දක්වන භාග්‍යවතුන් වහන්සේ, කාමාවචරයේ වැඩවසන රහතන් වහන්සේ කෙනෙකුගේ චුති සිතට පෙර සිත සිටම ගත්කල, එයින් අනාගතයේ චිත්තසංඛාර හටගන්නේ නමුත් කායසංඛාර මතුවට හටනොගන්නේ යැයි

සඳහන් කරයි. එසේ විය හැක්කේ චුති සිත සමග කිසිවිටකත් කායසංඛාර හට නොගන්නේ නම්ය. මෙයින් ගම්‍ය වනුයේ රහතන් වහන්සේට පමණක් නොව අන් කවර සත්වයෙකුට වුවද චුති සිත හටගන්නා මොහොතේ චිත්තසමුට්ඨාන රූප හටනොගන්නා බවයි. මෙහි රහතන් වහන්සේ කෙනෙක් සම්බන්ධව පමණක් යොදා ඇත්තේ මතු භවයකදී පවා ආශ්වාස-ප්‍රාශ්වාස හටගැනීමට අවස්ථාවක් නැති බැවින්ය.

ඊළගට අනාගත නිරෝධ වාරයේ එන "යස්ස වා පන චිත්තසංඛාරෝ නිරුජ්ඣිස්සති තස්ස කායසංඛාරෝ නිරුජ්ඣිස්සතීති :" **යමකය-2 භාගය-බු.ජ.-62 පිට**

තවද යමෙකුට (අනාගතයේ) චිත්තසංඛාර නිරුද්ධ වන්නට ඇත්තේ නම් ඔහුට කායසංඛාර නිරුද්ධ වන්නට (අනාගතයේ) ඇත්තේ දැයි "යන පාඨයට එන විසර්ජනයේ කොටසක් ලෙස, කාමාවචර අවසන් සිතේ උත්පාදක්‍ෂණයේදීත්, ඊට පෙරාතුව සිතෙහි සිටත් ගත්කල, එයින් අනාගතයේ චිත්තසංඛාර නැතිවීමට ඇතිනමුත්, කායසංඛාර නැති නොවන්නේ යැයි (අනාගත වශයෙන්) දක්වා ඇත.

ඉහත පාඨය හා විසර්ජනයෙන් ගම්‍යවන එක් කරුණක් වනුයේ චුති සිතත් සමග ආස්වාස-ප්‍රාශ්වාස නිරුද්ධ නොවන බවයි. පෙර දක්වන ලද පාඨයෙන් චුති සිතේ උත්පාදක්‍ෂණය සමග චිත්තසමුට්ඨාන රූප හට නොගන්නා බවක්ද අවසානයේ දැක්වූ පාඨයෙන් චුති සිතේ භංගක්‍ෂණය සමග චිත්තසමුට්ඨාන රූප නැති නොවන බවක්ද ගම්‍ය වේ.

චිත්තසමුට්ඨාන රූපයක ආයුකාලය චිත්තක්‍ෂණ 17 ලෙස ගතහොත්, චුති සිතට චිත්ත වාර 17කට පෙරාතුව යම් සිතක් සමග හටගත් කායසංඛාරය චුති සිත සමග නිරුද්ධ විය යුතුය. චුති සිත සමග යම් චිත්තසමුට්ඨාන රූපයක් හට

නොගත්තත් (එම සිත දුර්වල බැවින්) ඊට පෙර සිතක් සමග හෝ හටගත් චිත්තසමුට්ඨාන රූපයක් චුති සිත සමග නිරුද්ධ විය නොහැක්කේ මන්දැයි ගැටළුවක් පැන නඟී.

මෙම යමක පාඨ තුලිනුත්, යමකප්ප්‍රකරණයේ ඇති අනෙක් බොහෝ කරුණු ඔස්සේත් බොහෝ දුරට මේ නිසා ගම්‍ය වනුයේ චිත්තසමුට්ඨාන රූපයක් වන කායසංස්කාරය , එය හටගත් සිත සමගම බිඳී යන බවයි. කායසංඛාරයේ පහළවීම, චුති සිතට චිත්තවාර 18 කටවත් පෙර සිටම නවතින්නට ඇතැයි කෙනෙක්ට තර්ක කළහැක. අටුවාව බලාගෙන පෙළ නිර්වචනය කිරීම නොව, පෙළට අනුව අටුවා සැකසීමයි කළයුත්තේ. ආචාර්ය මතයන්ට වඩා මෙතනදී පාලියම (බුද්ධ වචනයම) ප්‍රමාණවත් බවයි අපට හැඟෙනුයේ.

මෙසේ ඇතිවිට චිත්තසමුට්ඨාන රූප සඳහා ඨිතික්ෂණයක් පරිකල්පනය කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනඟී. චිත්තසමුට්ඨාන යන්නෙහි අරුත සිතෙන්ම තනිකරම රූප උපදිනවා නොව රූපයක මූලාරම්භයට යම් සිතක උපත මුල්වනවා යනුයි. යම් කිසි ශාරීරික රූප පද්ධතියක් ඇති තැනකම, යම් සිතක ඉපැද්ම මුල් වී, සිතක ශක්තිය උපකාර වී, අභිනව රූප ආකාර බිහිවේ. එවිට එය සිත සමග නැඟී සිටි රූප කලාපයක් ලෙස හැඳින්විය හැක. සිතත් සමග නැඟී සිටි අර්ථයෙන් (චිත්ත + සමග + උට්ඨාන) චිත්තසමුට්ඨාන යන වචනය වඩාත් ගැළපේ. සිතෙන්ම ජනිත කළ අර්ථයෙන් 'චිත්තජ' යන වචනය එතරම් නොගැළපේ.

ආස්වාස ප්‍රාස්වාස, චිත්තසමුට්ඨාන රූපයක් වූයේ කෙසේ දැයි මෙවිට සරලව තේරුම් ගත හැකි වනු ඇත. නැතහොත් බාහිර පරිසරයේ වායූන් (ඔක්සිජන්, නයිට්‍රජන් ආදි) කෙසේ සිතින් ජනනය කළේ දැයි පටලැවිල්ලක් වනු ඇත. එසේ ජනනය වන්නේ නම් වායුව නැති රික්තකයක දැමූ

සත්වයෙකුටත් හුස්ම ගැනීමට හැකි වනු ඇත. අරූප ලෝකයේ සත්වයෙකුගේ සිතිවිලි සමගත් රූප හටගනු ඇත.

සිත යම් රූප පද්ධතියකට බලපෑම සමගම, ශරීරයට අවශ්‍ය අදාල කෘත්‍ය උදෙසා නව රූප ආකෘතියක් බිහිවීම මෙයින් අදහස් කෙරේ. මෙලෙස සිතේ බලපෑමෙන් නව ආකෘතියක් බිහිවූ නිසා, එතැන සිට එම රූපයේ මූලාරම්භය සලකා ගතයුතු බවක් පෙනේ. සහජාත පච්චය යෙදෙන බැවිනි. සිතෙන් කායික රූප සඳහා පච්ඡාජාත ප්‍රත්‍යය යෙදෙන අවස්ථාවන්හිදී එම රූපයන් බලගන්වනවා විනා සිතෙන් එම රූපයේ ආකෘතිය වැඩි වෙනසකට භාජනය කරන බවක් නොපෙනේ.

මූලටීකා ආචාර්යයන් හා තවත් ථේරවාද ආචාර්යවරු සිත සම්බන්ධව ගත්කළ 'ඨිතියක්' පැනවිය නොහැකි යයි කීවේ චිත්තයමකය බලාගෙනය. ඊට අමතරව සිත වේගයෙන් හටගෙන බිඳෙන බැවින් එය සිටීමට කාලයක් නැතැයි එම තෙරුන් වහන්සේලා කල්පනා කළ බවක් පෙනේ. සිතක උත්පාදක්‍ෂණයේ හා භංගක්‍ෂණයේදී විද්‍යමාන වන උප්පන්න භාවයත්, එහි ජීවිතීන්ද්‍රිය සම්ප්‍රයෝගයෙන් පැනවෙන ආයුෂයත් සලකාගෙන චිත්තයාගේ සිටීමක් ඇතැයි කිව හැකි බව මග හැරීගිය අයුරක් පෙනේ.

සන්තති ඨිතිය

ඒ වෙනුවට සන්තති වශයෙන් "ඨිතස්ස අඤ්ඤතත්තං" යන්න හා ඨිතිය තේරුම් ගත යුතු බවයි මූලටීකා ආචාර්යයන් වහන්සේගේ අදහස වූයේ. උදාහරණයක් ලෙස පැය කිහිපයක් පැවතුන හිසරදයක් ගැන කල්පනා කළ හොත්, ඒ ඒ අවස්ථාවේ හටගත් කායික වේදනාත්මක සිත් බොහෝ ගණනක පැවැත්මය එසේ දිස්වූයේ. එම සමස්ථය දෙස බලා හිසරදයක පැවතුන බවක් 'ඨිතියක්' විද්‍යමාන වන බවක්, එහි

උච්චාවචනය (පැය කිහිපය පුරාවට) "ඨිතස්ස අඤ්ඤතත්තං" (සිටියහුගේ අන්‍යාකාරයක්) ලෙසිනුත් දැක්විය හැක්කේ නොවේදැයි එම තෙරුන් වහන්සේලාගේ අදහස විය.

නමුත් ථේරවාද න්‍යාය තුලම එම අදහසට ප්‍රතිරෝධයක් පැන නගී. චිත්ත සන්තතියක් යනු පරමාර්ථයක් නොව පඤ්ඤත්තියක් යැයි ථේරවාදයේ සැලකෙන නිසාය. සංඛත ලක්‍ෂණ සූත්‍රවල "ඨිතස්ස අඤ්ඤතත්තං" ලෙසින් දක්වා ඇත්තේ සංඛතයක හෙවත් පරමාර්ථයක ලක්ෂණයන්ය. එනම් කෙනෙකුගේ දෘෂ්ටි කෝණය හෝ සිතෙන් ගොතු කරගන්නා ආකාරය අනුව නාම-රූපවල පැනවෙන ලක්ෂණයක් නොව එහි හටගත් ස්වභාවයෙන්ම ඇති ලක්‍ෂණයන්ය, සංඛත ලක්‍ෂණ යන්නෙන් අදහස් කරනුයේ.

නාම-රූප ධර්මවල අනිත්‍යතාවය සලකන විට විශේෂයෙන් සැලකිය යුතු එක්තරා වචනයක් ධර්මසංගණීප්‍රකරණයෙන් මුණ ගැසෙනවා. චිත්ත චෛතසික ධර්මයන්ගේ හා කර්මජ රූපයන් සම්බන්ධව ඒවාටම අනන්‍ය වූ සුවිශේෂී ලක්‍ෂණයක් ලෙස, 'ආයුෂය' කියා දෙයක් අර්ථ දක්වා තිබෙනවා. එහි විශේෂත්වය වනුයේ ඍතුජ, ආහාරජ හා චිත්තසමුට්ඨාන රූප සඳහා එළෙස දක්වා නොතිබීමයි. සාමාන්‍යයෙන් ආයුෂ යන වචනයෙන් නාම-රූප ධර්මතාවයක පවත්නා මුළු කාලය නිරූපණය වන බැවින් මෙම ආයුෂය යන ලක්‍ෂණය කර්මජ රූප හැරෙන්නට අනෙකුත් රූප සඳහා නොදක්වන ලද්දේ මන්දැයි එක්තරා ප්‍රෙහෙලිකා තත්වයක් පැන නගිනවා.

ධර්මසංගණියේ මෙම ආයු යන වචනය තැන් දෙකකදී හමුවේ. එනම් අරූප හා රූප ජීවිතීන්ද්‍රිය අර්ථ දැක්වෙන අවස්ථාවලයි. රූප ජීවිතීන්ද්‍රියේ අර්ථ දැක්වීම මෙලෙසය.

"යං තේසං රූපීනං ධම්මානං ආයු, ඨිති, යපනා, යාපනා, ඉරීයනා, වත්තනා, පාලනා, ජීවිතං, ජීවිතින්ද්‍රියං, ඉදං තං රූපං

ජීවිතින්ද්‍රියං"

ධම්මසංගණී-බු.ජ-300 පිට රූපකාණ්ඩය

තේරුම : "යම් එම රූපී ධර්මයන්ගේ ආයුෂයෙක්, සිටීමෙක්, යැපීමෙක්, යැපෙන බවක්, ඉරීයනයක්, පැවැත්මෙක්, පාලනයෙක්, ජීවිතයෙක් ජීවිත ඉන්ද්‍රියක් වේද මේ ඒ ජීවිත ඉන්ද්‍රිය රූපයයි".

අරූපී හෙවත් චිත්ත චෛතසික සඳහාද අරූපී ජීවිත ඉන්ද්‍රිය අර්ථ දක්වා ඇත්තේත් ඉහත ආකාරයටමය. වෙනසකට ඇත්තේ "යං තේසං රූපීනං" වෙනුවට "යෝ තේසං අරූපීනං" ලෙස දක්වා තිබීමයි.

රූප ජීවිත ඉන්ද්‍රිය අර්ථ දැක්වීමේදි, එය සියළු රූප ආකාර වලට අදාල වන්නාක් මෙන් පෙනුනද, පට්ඨානයේ පච්චය නිද්දේස වාරයේ ඉන්ද්‍රිය ප්‍රත්‍යය අර්ථ දැක්වීමේදි "රූප ජීවිතින්ද්‍රියං කටත්තා රූපානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ" යන පාලි වැකි වලින් මෙම රූප ජීවිතින්ද්‍රිය කර්මජ රූප සමග සහජාතාව පවතින ධර්මතාවයක් බව පෙන්නුම් කරයි.

අරූපී ධර්මයක හෝ කර්මජ රූපයක හෝ නොනැසී රැඳී සිටීමක් (ඨිති), පැවැත්ම අල්ලාගෙන සිටීමක් (යපනා, යාපනා), පැවැත්මක් (වත්තනා), තරමක් දුරට හෝ ඇදියාමක් (ඉරීයනා), පාලනය වීමක් (පාලනා), ජීවයක් (ජීවිතං), යනාදි ලක්‍ෂණයන් විද්‍යාමාන වන බව මින් පෙන්නුම් කරයි. එම අර්ථ දැක්වීමේදි මුලින්ම දක්වා ඇත්තේ 'ආයු' යන වචනය බැවින් ඉහත නිර්දේශ කරන ලද වචනාර්ථ වලට සමාන අර්ථයක් ආයු යන්නෙන් පෙන්නුම් කරයි.

ථේරවාද අභිධර්ම න්‍යායට අනුව මෙතනදි එක්තරා ගැටළුවක් මතුවේ. කර්මජ රූපවල මෙන්ම අනෙකුත් සියළු රූපාකාරවලද, ආයුෂය චිත්තක්‍ෂණ 17 යැයි දැක්වෙන නිසාත්,

ඒ සැමටම උප්පාද, ඨිති, භංග වශයෙන් වෙන්වූ ස්වායත්ත ක්ෂණ 3ක් දැක්වෙන නිසාත්, කුමක් හෙයින් අනෙක් රූපවලට ආයුෂයක් කියා දෙයක් පනවා නැත්තේ දැයි ගැටළුවක් මතුවේ. මෙම කරුණ ථේරවාද අභිධර්ම ග්‍රන්ථවල (අටුවාටීකා ආදියෙහි) සාකච්ඡා වූ බවක්ද නොදක්නා ලදී. දැනට කිවහැක්කේ ථේරවාද ක්ෂණ භංග ආකෘතිය සමග මෙම තොරතුර ගැලපී නොයන බැවින්, විස්තර කළ නොහැකි බැවින් එය නොසලකා හැර ඇති බවයි.

නාම ධර්ම හා කර්මජ රූපවලට සීමාවූ ආයුෂය

මෙම කාරණය පිළිබඳ සර්වාකාරයෙන් විවරණයක් කිරීමට අප සමත් නොවූවත් පාඨකයන්ට සෑහීමකට පත්විය හැකි පිළිතුරක් ඉදිරිපත් කිරීමට උත්සාහ කරමි. මෙම වෙනස විද්‍යමාන වනුයේ යම් ධර්මයක් හටගැනීමට උපකාර වන ප්‍රත්‍යයන්ගේ සුවිශේෂී බවක් නිසාය. නාම-රූප ධර්මයක් හටගැන්වීමටත්, හටගත් ධර්මයේ පැවැත්මටත් බලපාන ප්‍රත්‍ය ආකාර දෙවර්ගයක් ගැන මෙතැනදී අවධානය යොමු කළ යුතුය.

1. එක් වර්ගයක් නම් : යම් ධර්මයක් සමග සහජාතව හටගන්නා ධර්මයන්ගෙන් ඊට ලැබෙන උපකාරයන්ය.

2. අනෙක් ආකාරය නම් : යම් ධර්මතාවයකට පූර්වයේ තිබී නැතිවී ගිය ධර්මයන්ගෙන් ලැබෙන උපකාරයන්ය.

පළමු ආකාරයට උදාහරණයක් ලෙස වේදනාව යන නාම-ධර්මය ගතහොත්, ඊට සහජාතව පහළ වන ස්පර්ශය, විඤ්ඤාණය, සංඥාව, චේතනාව ආදියෙන් ඊට ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, අත්ථි, අවිගත, නිස්සය, සම්පයුක්ත ආදි ප්‍රත්‍යෝපකාරයන් සැලකිය හැක. දෙවැනි ආකාරය ලෙස, එම වේදනාවට පෙර චිත්ත චෛතසික වලින් ලැබුණු සමනන්තර, අනන්තර ප්‍රත්‍යය ද්වයත්, එම වේදනාව

හටගත්තේ විපාක සිතක නම්, නානක්‍ෂණික කර්ම පත්‍යයත්, උපනිශ්‍රය හා විටෙක ආසේවන ප්‍රත්‍ය ආදියත් සැලකිය හැකිය.

මෙම දෙවැනි ආකාරයේ සමනන්තර, අනන්තර හා කර්ම ප්‍රත්‍යය ආදිය සැලකූ විට ඒවායින් එම වේදනාව හටගැන්වීමේලා එක්තරා මූලික තල්ලුවක් දෙන බවක් පෙනේ. එම සමනන්තර ආදි පූර්වයෙන් ලැබුණු ප්‍රත්‍යය බලයන් චිත්තයේ දැනටමත් ගැබ්වී ඇති බවක් පෙනෙන බැවින්, එම චිත්තය හෝ චෛතසිකය දෙස බලා, එනම් උප්පන්නව පවතින ඕනෑම අවස්ථාවක එය දෙස බලා එය කලක් පැවතීමේ ශක්‍යතාවය, ජීවත් වීමේ හැකියාව ගැන නිගමනයක් කළ හැකි බවක් පෙනේ.

තවද එම උපකාරක බලයේ සීමාසහිත බවක්ද පෙන්නුම් කරයි. එම තල්ලුවේ සීමා සහිත බව නිසා එම වේදනා සහගත චිත්තය ආරම්භයේදිම එම චිත්තයේ ආයුෂය ගැන යම් පුරෝකථනයක් කළහැකි බවක් පෙනේ. පෙර සිතෙන් ලැබුණු සමනන්තර-අනන්තර ප්‍රත්‍යය බලය පෙර සිතේ බලවත් බව මත තීරණය වනු ඇත.

පළමු කාණ්ඩය යටතේ දැක්වූ සහජාත ධර්මයන් තුලින් එකිනෙකට ලැබෙන ප්‍රත්‍ය උපකාරයන් මත එම චිත්තයේ ආයුෂයේ විචලනයන් ඇතිවිය හැකි වුවද, සමනන්තර අනන්තර ප්‍රත්‍යයන්ගෙන් ලැබුණු මුල් තල්ලුව ඔස්සේ ලැබුණු ආයුෂය, තරමක් ඉදිරියට හෝ පසුපසට ඇදදමන බවක් මිස, එවායින් ආයුෂයෙහි විශාල වෙනසක් නොකරන බවයි පෙනෙනුයේ. අරූප ජීවිතීන්ද්‍රිය හෙවත් සිතක ආයුෂය විදහා දැක්වෙන චෛතසිකයේ පැවැත්ම සම්බන්ධව ඉහත ප්‍රත්‍යය කාණ්ඩ දෙකේ බලපෑම මෙලෙස තේරුම් ගතයුතු බව පෙනේ.

පෙර චිත්ත චෛතසික වලින් මතු චිත්ත චෛතසික සඳහා ලැබෙන ආසේවන, උපනිශ්‍රය ආදි ප්‍රත්‍යය, එම පසු

චිත්තයේ ආකාරය කුසල, අකුසල, අබ්‍යාකත ලෙසින් සකස් කිරීමට මුල් වන නමුත් සමනන්තර ආදි ප්‍රත්‍යය මෙන් ආයුෂය තීරණය කිරීමෙහිලා එතරම් බලපෑමක් නොකරන බවයි පෙනෙනුයේ.

මනෝ විඤ්ඤාණයක් නම් එයට පාදක වූ වස්ථු රූපයේ ප්‍රබල දුබල බව හා එම සිත පවතින අවස්ථාවේ, එහි බලවත් බවේ විචලනයන් මතද සිතෙහි ආයුෂය විචලනය වනු ඇත. නමුත් සමනන්තර-අනන්තර ප්‍රත්‍යයන්ගෙන් ලැබුණු උපකාරයෙහි යම් සීමාවක් පවතින නිසා සහජාත උපකාරක බලයෙහි එසේ සීමාවක් නොපැනවෙන නිසාත් මෙසේ චිත්ත චෛතසිකයන්ගේ ආයුෂය යම් පූර්ව සීමාවකට යටත්ව විචලනය වන බව පෙනේ.

පූර්ව සිතෙන් ලැබෙන සමනන්තර, අනන්තර ප්‍රත්‍යය බල ශක්තිය විවිධ වන නිසාත්, අතීත කුසලාකුසල කර්මයක් බලපාන්නේ නම් එහි ප්‍රබල දුබල බවත්, වස්ථු රූපයේ මට්ටමත්, සහජාත චිත්ත චෛතසිකයන්ගේ ආකාරයත් (අලෝභ අද්වේශ ආදි හේතු ධර්ම ඇති නැති බව යනාදිය) මත මෙසේ සමස්ථ චිත්තයේ ආයුෂය, යම් සීමාවකට යටත්ව විචලනය වන බවක් පෙන්නුම් කරයි.

යම් සේ බෝලයක් උඩ දැමූ විට, එය අතහරින විට එයට දුන් වේගය අනුව එය කොතෙක් දුරට ඉහළට යන්නේ දැයි කිවහැකි වන්නාක් මෙනි. ගුරුත්වාකර්ෂණයේ ප්‍රබල දුබල බව, වායු ගෝලයේ ඝනත්වය ආදිය එය යන උස විචලනය කරනු ඇත.

මේ නිසා සිත යම් අවස්ථාවක පවතින විට එනම් උත්පාදක්ෂණයේ යම් අවස්ථාවක හෝ භංගක්ෂණයේ යම් අවස්ථාවක හෝ පවතින විට එහි ආයුෂය සම්බන්ධව යම්කිසි පුරෝකථනයක් කළ හැකි බවක් පෙනේ. මෙසේ එම සමනන්තර ආදි පූර්වයෙන් ලැබුණු ප්‍රත්‍යය බලයන් චිත්තයේ

දැනටමත් ගැබ්වී ඇති බවක් පෙන්නුම් කරයි. එබැවින් එම චිත්තය හෝ චෛතසිකය දෙස බලා එනම් උප්පන්නව පවතින ඕනෑම අවස්ථාවක එය දෙස බලා එය කලක් පැවතීමේ ශක්‍යතාවය, ජීවත් වීමේ හැකියාව ගැන නිගමනයක් කළ හැකි බවක් පෙනේ.

මෙලෙසම කර්මජ රූප සම්බන්ධයෙන් ගත්විට, ඒවා පූර්ව කර්ම ශක්තිය සමග ඍජු සම්බන්ධයක් ඇති බැවින් එහි ආයුෂය ගැන යම් පුරෝකථනයක් කළහැකි බවක් දිස්වේ. වයසක පුද්ගලයෙකුගේ ඇස, කණ, වස්තු රූපය ආදි කර්මජ රූප ඉලක්ක කොට එයට වැඩි ආයුෂ නැතැයි කිවහැකි තත්වයක් තිබේ. අනෙක් අතට ළමයෙකුගේ ඇසක් ගැන, වැඩි ආයුෂ ඇති බවක් පෙන්වා දිය හැක.

නමුත් අරූපි ධර්ම මෙන් නොව රූපී ධර්ම සඳහා යාබද රූපවලින් උපකාර හෝ බාධා ඇතිවිය හැකි බැවින්, ආයුෂ බොහෝ තිබුණද ඊට පෙරාතුව කර්මජ රූප සිඳී යා හැකිය. හේතු ඵල න්‍යායට අනුව ධර්මයක් ගැන කල්පනා කරන විට, කෙනෙකු හේතුන්ට වඩාත් බර දුන්නොත්, ඵලයේ අනන්‍යතාවය මඟහැරී යනු ඇත. ඵලයත් අනෙකකට හේතුවක් වන බැවින්ද, මෙම හේතුඵල තුලින් මුළු ලෝකයම නිරූපණය වන බැවින්ද, හේතුඵල ධර්මයන්ගේ අනන්‍ය බවක්, ස්වකීය බවක්, එහි ස්වභාවය ධරන බවක්, පෙන්නුම් කරයි. හේතුව ශරීරය ලෙස ගත් විට, හේතුන්ට මූලිකත්වය දි කල්පනා කළ හොත්, ඵලය හෙවනැල්ලක් මෙන් වැටහිය හැක, සැබෑවට නැතියක් මෙන් වැටහිය හැක.

ධර්මයක ඇතත්තා වූ මෙම අනන්‍ය සව්භාවයටත් එහාගිය ශක්‍යතාවයක්, එහි ආයුෂය යන්නෙන් අදහස් වෙයි.

සත්ව ශරීරයන්ට සම්බන්ධ නැති බාහිර සතර මහාභූත පද්ධතීන්ගෙන් සැදුම්ලත් ගස්, ගල්, රසායන ද්‍රව්‍ය ආදියත්,

ශරීරස්ථක ඍතුජ රූපයනුත් ගත්කළ, ඒවායේ ප්‍රත්‍ය ධර්මයන් සැලකීමේදි ඉහත පළමු කාණ්ඩය යටතේ සඳහන් කළ ප්‍රත්‍යාකාරයන්ය, ඒවා සඳහා අදාල වනුයේ.

පට්ඨානයේ නය ක්‍රමය අනුව පෙනෙනුයේ ඒවාට පෙර හටගත් ධර්මයක උපකාරය නොලැබෙන බවයි. සහජාත ධර්මයන්ගේ උපකාරය මත ඒවායේ පැවැත්ම සිදුවේ. ශරීරස්ථක ඍතුජ රූපයක් නම් එයට පසුව හටගත් චිත්ත චෛතසික ධර්මයන්ගෙන් පච්ඡාජාත, විප්පයුත්ත ආදි ප්‍රත්‍යය උපකාරයෝ ද විටෙක ලැබෙනු ඇත. කෙසේ නමුත් ඒවාට අතීත රූපධර්මයන්ගේ උපකාරයක් ලැබෙන බවක් පට්ඨානයේ දක්වා නැත.

ථේරවාද අභිධර්මය තුල රූප කලාපයක ඨීතියට පැමිණි තේජෝ ධාතුවෙන් ඊට යාබදව රූප කලාප ගොඩනගන බවට මතයක් තිබුණද, එවන් ආකාරයක් අභිධර්ම පිටකයේ දක්වා නොමැති අතර, එය පට්ඨානයේ නය ක්‍රමයට සම්පූර්ණයෙන්ම පටහැනිය. ඒ සම්බන්ධව විස්තරයක් හා බාහිර සතර මහාභූත සකස් වන ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමක් අප විසින් සැකසූ "මුල් බුදු සමය සොයා ගත්තෙමි" කෘතියේ පිටු අංක 86-94 දක්වා කොටසින් දැනගත හැක.

සහජාත හේතූන් මත පමණක් පවතින පඨවි ආපෝ තේජෝ වැනි ධර්මයක ආයුෂය කියා දෙයක් පැනවිය නොහැක. අතීත ප්‍රත්‍යයකින් එහි ගැබ්වූ ශක්‍යතාවක්, ඒ තුලින් මතුවන (ඉදිරියට) පැවතීමේ හැකියාවක්, එහි විද්‍යමාන නොවේ. උප්පාද, වය ආදි සංඛත ලක්ෂණ පෙන්වුවද, ආයුෂය කියා දෙයක් පැනවිය නොහැකිය. උත්පාද, වය ලක්ෂණ පෙන්වනුයේ හේතූන් ඇති නැති බව අනුවය. ආයුෂයෙන් පෙන්නුම් කරනුයේ ධර්මයක එය තුල ගැබ්වූ ශක්තියක් තුලින් ඉදිරියට පැවැත්මේ ශක්‍යතාවයය.

සරලව කීවොත් පාශාණ, ජලය හෝ රසායන ද්‍රව්‍යයක ඇති රූප ස්වභාවයක් දෙස බලා එය පරණ වී ඇත කියා හෝ තව මෙතරම් කාලයකින් විනාශ වනු ඇතැයි හෝ කිව නොහැක. වතුර අයිස් බවටද, පරිවර්තනය කළ හැක. අයිස් වතුර බවටද පරිවර්තනය කළ හැක. නමුත් වයස්ගත ශරීරයක් තරුණ ශරීරයක් බවට පරිවර්තනය කළ නොහැක. වයස්ගත ශරීරයේ කර්මජ රූපත්, අන් රූපවලට ඒවායේ බලපෑමත් (පරම්පරා වශයෙන් හෝ) ඇති නිසාය එසේ සිදුවනුයේ.

ආහාරජ රූපයනටත් කියන්නට සිදුවනුයේ ඍතුජ රූපයන් සඳහා කී දේමය.

චිත්තසමුට්ඨාන රූප සම්බන්ධයෙන් මෙය කෙසේදැයි කෙනෙකුට ගැටළුවක් මතුවීමට පුළුවන. ඒවා සඳහා උත්පාදක්‍ෂණ හා භංගක්‍ෂණ බුදුරජුන් අර්ථ දක්වා ඇතැයි පෙර දක්වන ලදි. නමුත් කුමක් හෙයින් එම රූප සම්බන්ධව ආයුෂ කියා දෙයක් නොපනවන්නේද?

ආයුෂය යැයි කීවේ යම් ධර්මයක ගැබ් වී ඇති සේ පෙනෙන, එම ධර්මතාවය ඉදිරියට ගෙන යා හැකි, එය තුලම ඇති එක්තරා හැකියාවකි. චිත්තසමුට්ඨාන රූපයකට ඊට පෙරාතුව තිබූ රූපයකින් තල්ලුවක් ලැබුණේ නැත. චිත්තය නිසා චිත්තසමුට්ඨාන රූපයේ පැවැත්ම තීරණය වූවා මිස, පැවැත්ම සීමා වූවා මිස, එම රූපය ඇතුලාන්තයේ පඨවි තේජෝ, වායෝ ආදි ධාතුන්හි ගැබ්වූ හැකියාවක් නිසා එය ඉදිරියට ඇදියනවා (ඉරීයනා) නොවේ. අදාල චිත්තයේ පැවැත්ම මත එම රූපයේ පවත්නා කාලය කෙටි හෝ දිගුවන බවයි පෙනෙනුයේ. මේ නිසා චිත්තයක් සමග නැඟී සිටි පඨවි ආදි ධාතුවක ලක්‍ෂණයක් ලෙස ආයුෂ කියා දෙයක් පැනවිය නොහැකි බවයි පෙනෙනුයේ.

බුදු කෙනෙක් හැර වෙන කෙනෙක් අභිධර්මය සැකසුවානම් කර්මජ රූප හැර අනෙක් රූප සඳහාත් ආයුෂය

කියා දෙයක් පනවන්නට තිබුණා. අභිධර්මය බුද්ධ භාසිතයක්ම යැයි පිළිබිඹුවන කාරණා තමයි මෙවන් දෑ. මෙම අර්ථ දැක්වීම් ඔස්සේ බුද්ධ ඥාණය කෙතරම් සියුම්ව විහිදී යන්නට ඇත්දැයි අපට අදහසක් ගන්නට පුළුවන්.

ජරතාව

මෙම කාරණාවලට සම්බන්ධව ධර්මයන්ගේ විපරිණාමය ගැන කථා කරන විට නිතර අහන්ට ලැබෙන වචනයක් තමයි ජරතාව හෙවත් ජරා කියන වචනය. අර්ථකථා හා ටීකාවල (ථේරවාදය තුල) අදහස් කළ 'ඨිතික්ෂණයට' අනුයාත කොට එය දක්වනු ලැබෙනවා. නාම-රූප ධර්මයක් එහි භංගයට අභිමුඛව යන්නා වූ අවස්ථාව ඨිතිය ලෙස අර්ථ දක්වා, එසේ හෙයින් ධර්මතාවයක් පරිපාකයට යන අවස්ථාව ලෙසින් එය ජරතාව ලෙස නිරූපණය කෙරෙනවා. බුද්ධ ජයන්ති පරිවර්තනයේ "ඨිතස්ස අඤ්ඤතත්තං" යනාදි සූත්‍ර පාඨ යෙදෙන තැන්වල වරහන් ඇතුලේ ජරා කියලා යොදලා තියෙන්නේ ඒ නිසයි. විටෙක ජරාව කියල සෘජුවම පරිවර්තනය සිද්ධ වෙනවා.

මෙම ජරා කියන වචනය ධම්මසංගණියේ යෙදෙන තැනක් තියෙනවා. ඒ රූපකාණ්ඩයේ ජරතා රූපය අර්ථ දැක්වෙන තැනයි.

"කතමං තං රූපං, රූපස්ස ජරතා?"

යා රූපස්ස ජරා, ජීරණතා, ඛන්ඩිච්චං, පාලිච්චං, වලිත්තතචා, ආයුනෝ සංහානි, ඉන්ද්‍රියානං පරිපාකෝ, ඉදං තං රූපං රූපස්ස ජරතා"

"කුමක්ද මේ රූපයාගේ (ශරීරයේ) ජරතාව ? යම් මෙම රූපයෙහි (ශරීරයෙහි) ජරා බවක්, ජීරණය වූ බවක්, කැඩුණු බවක්, පැසුණු බවක් (කෙස් ආදිය), සම රැලි වැටීමක්, ආයුස

ගෙවීයාමක්, ඉන්ද්‍රියන්ගේ පරිපාකයක්, මෙයයි. රූපයාගේ (ශරීරයේ) ජරතාව."

මෙතන ඉස්මතු වන කරුණක් නම් සත්ව ශරීර සම්බන්ධව පමණක් ජරතාවක් අදහස් කරන බව. ශාක ගැන සඳහනක් නෑ. අද පර්යේෂණ මගින් පෙන්වලා තියෙනවා ගස් වයසට යනවා වගේ පෙනුනාට ශාක සෛල විකසනය වන වේගය කාලයත් සමග අඩුවක් පෙන්නුම් කරන්නෑ කියලා. විශාල ගස්වල වැඩීම නවතින්නේ සමහරවිට එතරම් උඩට ජලය ඇදියාමේ අපහසුතා නිසා. වෙනත් භෞතික බාධක නිසා.

ගසක පලතුරක් ඉදුනාම මනුස්සයන්ට හොඳ වුනාට පණුවාට වැදගත් වෙන්නේ පලතුර කුණුවූ විටයි. කෙනෙකුට ජරාව මෙන් පෙනෙන දෙය වෙනත් සතෙකුට ආරම්භයක්.

නමුත් කර්මජ රූපවල දෘෂ්ටි කෝණය අනුව නෙවෙයි පරිපාකය පැනවෙන්නේ. දැන් කෙසෙල් ගසක කැණ එන කාලයට ගස වේලිලා මරණයට පත්වීම ඇත්තෙන්ම ජරතාව නොවෙයි. ඒ ඒ කාලයට නොයෙකුත් උත්තේජනයන් සමග රූප ක්‍රියාවලි සැකසී ඇති ආකාරයන් නිසා, පරිණාමය වී ඇති ආකාරය නිසාය එසේ දිස්වනුයේ. එසේ පරිණාමය වීම තුලින් එහි ඵලයේ කාර්යක්ෂම බවක් ඇතිවීම නිසා මිනිසුන් එම ගස පවත්වා ගෙන යාමට පොළඹවනවා. ඒ තුලින් එහි පරිසරයේ පැවැත්ම තහවුරු වෙනවා.

රූප ජීවිතීන්ද්‍රිය අර්ථ දක්වද්දි එහි ආයු කියලා වචනයක් තිබුණා. ජරතා රූපය අර්ථ දැක්වීමේදි එහි "ආයුනෝ සංහානි" (ආයුෂයාගේ ගෙවීයාමක්) කියලා තිබුණා. මෙයින් පෙනෙනවා මේ දෙක අතර යම් සම්බන්ධයක් තිබෙන බව.

මෙම ජරතා රූපයත් උපාදාය රූපයක්. ඒ කියන්නේ සතර මහාභූත ඇසුරු කොටයි පවතින්නේ. යමෙක් රූප කලාප භංගයට අභිමුඛව යන අවස්ථාව රූපයේ ජරාව කියලා

ගතහොත්. එවිට එය සතරමහා භූතයන්ගේ උපාදාය රූපයකට වඩා කාලයේ උපාදාය රූපයක් බවට පත්වෙනවා.

වෙනස්වීම හොඳ අතටත් සිදුවන නිසාත්, ධර්මයක උත්පාදක්‍ෂණයේදී එය බලවත් වෙමින් පවතින විටත් සිටියහුගේ අන්‍යාකාරයක් දිස්වන නිසාත්, ජරතා රූපය අර්ථ දැක්වීමේදී එහි නිර්දේශිත වචනයක් ලෙසවත් 'අඤ්ඤතත්තං' කියා සඳහන් නොවීමත්, රූපවලට මිස 'නාමස්ස ජරතා' කියා අර්ථකතනයක් ධර්මසංගණියෙහි නැති නිසාත්, "ඨිතස්ස අඤ්ඤතත්තං" යන්නට ජරාව කියා යෙදිම නම් සුදුසු නැති බවයි පෙනෙන්න තියෙන්නේ.

අනෙක් අතට බුදුරජාණන් වහන්සේට අවශ්‍ය වූයේ සත්ව ශරීරයක කර්මජ රූපවල ආයුෂ ගෙවීයාමෙන් දිස්වන කලකිරීමට හේතුවන සුවිශේෂී රූප ස්වභාවයක් මතුකොට දැක්වීමට නම් කියා ඇති ආකාරයට හැරෙන්නට වෙන කුමක් කියන්නද?. ඒ නිසා ජරතාව යන්නෙන් සියළු නාම හා රූප ධර්මවලට උපකල්පනය කළ ඨිතික්‍ෂණයක් දැක්වීමට ගිය හොත් ප්‍රායෝගික අර්ථයන් මගහැරී යා හැකිද වනවා. රූප අනවශ්‍ය ලෙස සියුම් කළහොත් ප්‍රායෝගික විපස්සනා අර්ථය මගහැරෙනවා.

අනිත්‍යතාවය හා වෙනස්වීම

අනිත්‍යතාවය ගැන දැක්වීමට "වෙනස්වීම" යන වචනය බෞද්ධ සමාජය තුල නිතර ව්‍යවහාර කෙරෙනවා. " අඤ්ඤත්තතං" යන පාලි වචනාර්ථයද වෙනස්වීම යන්නට බොහෝ සමාන බවක් පෙන්නුම් කරනවා. මෙම වෙනස්වීම සම්බන්ධව බෞද්ධ සමාජයේ ඇති එක්තරා දුර්මතයක් ගැන නොකියාම බැරිය.

බොහෝ විට බෞද්ධයන් පරිසරයේ අන්‍යාකාරයක් දකින විට, නැතිනම් කෙනෙකුගේ ශරීරය බොහෝ සෙයින් වෙනස්ව ඇතිසේ දකින කොට මෙහෙම කියනවා.

"බලන්න බුදුරජාණන් වහන්සේගේ වචනය කොතරම් සත්‍යයද, මේ ලෝකේ සියල්ලම වෙනස් වෙනවනේ, වෙනස් නොවන කිසි දෙයක් නැනේ, මේ ඔක්කොම අනිත්‍යයයි, මේ මනුස්සයාගේ ඉස්සර තිබුණ පෙනුම දැන් නැහැනේ"

ඔය කථාවට ධර්මය භාගෙට ඉගෙනගත් අතිපණ්ඩිතයන් කියන්නේ මෙහෙමයි.

"ඔය වෙනස්වීම කාටත් පෙනෙනවනේ, ඕක කියන්න බුදු කෙනෙක් ලෝකෙට පහළ වෙන්න ඕනායෑ, ඔහොම දැක්කයි කියලා නිවන් දකින්න බෑ. සියුම්ව අනිත්‍යතාවය දකින්න ඕනා. පරමාර්ථ වශයෙන් අනිත්‍යතාවය දකින්න ඕනා."

ඔය ආකාරයට කියලා අරමුලින් අනිත්‍යතාවය ගැන කියපු කථාව අවප්‍රමාණය කරනවා. ඇත්තෙන්ම කියන්න තිබුණේ අනෙකක්. දැන් පුද්ගලයෙකු වෙනස්වෙලා ඔහුගේ ශරීර ස්වභාවය වෙනස්වෙලා කියනකොට, ඒ සඳහා කිවයුත්තේ එම වෙනස්වීම සිහිකරගත් බවෙහි, වරදක් නැති බවත්ය. හොඳ දෙයක් බවත්ය. එම පුද්ගලයා සම්බන්ධ අනෙකුත් ධර්මවලත් අනිත්‍යතාවය සිහිකරගන්නා ලෙසත්ය.

යමෙකුට, පුද්ගලයෙකු වෙනස් වී ඇතැයි දැනෙන්නේ (ශරීරය සම්බන්ධව ගත්කල), ඒ පුද්ගලයා සම්බන්ධව ඔහුට සිහිවන නාම-රූප ධර්ම සමුදායෙන්, කොටසක් එම පුද්ගලයා ලෙස ගොනුකරගන්නා අතරෙහි තවත් කොටසක නැතිවී යාම දකින විටදිය. එම නිසා එම පුද්ගලයා ලෙස ගොනු කරගත් නාම රූප ධර්ම ටිකත් අනිත්‍ය ලෙස මෙනෙහි කරන්නටය උපදෙස් දියයුත්තේ.

අනිත්‍යාවය ගැන, ධර්මයන්ගේ බිඳියාම ගැන සැලකීමේදි බොහෝ දෙනා කථාවන එක්තරා විදර්ශන ඥාණ කිහිපයක් ඇත. එනම් උදයවය ඥාණය හා භංගානුපස්සනා ඥාණයයි. පටිසම්භිදාමග්ගයෙහිය මේවා ගැන විස්තර වශයෙන් සඳහන් වනුයේ.

උදයවය ඥාණය

වර්තමානයේ හටගෙන ඇති, ජීවිතය සම්බන්ධ ධර්මතාවයන්හි උදය වය දැකීම, මෙම ඥාණයයි. උදය වය ඥාණය යැයි කියන විට කෙනෙකුට මතක්වනුයේ නාම-රූප ධර්ම වේගයෙන් බිඳියන අයුරක් දක්නා බවකි. නමුත් එම ඥාණ නිර්දේශයේ සඳහන් වනුයේ අනෙකකි. එහිදි රූපස්කන්ධය, වේදනා, සංඥා, සංඛාර හා විඥ්ඥාණස්කන්ධය යන ස්කන්ධ පහේ උදය හා වය පනස් ආකාරයකට සලකා බැලේ.

"අවිජ්ජා සමුදයා රූප සමුදයෝති පච්චය සමුදයට්ඨේන රූපක්ඛන්ධස්ස උදයං පස්සති, තණ්හා සමුදයා රූප සමුදයෝති, පච්චය සමුදයට්ඨේන රූපක්ඛන්ධස්ස උදයං පස්සති , කම්ම සමුදයා රූප සමුදයෝති, පච්චය....., "ආහාර සමුදයා.... උදයං පස්සති"

නිබ්බත්ති ලක්ඛණං පස්සන්තෝපි රූපක්ඛන්ධස්ස උදයං පස්සති. රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තෝ ඉමානි පංචලක්ඛණානි පස්සති"

අවිද්‍යා සමුදයෙන් රූප සමුදය වන බවත්, එසේම තණ්හාව, කර්මය හා ආහාර සමුදය වීමෙන් රූප සමුදය වන බවත්, යන සතර ආකාරයක් මුලින් දක්වා ඇත. මෙම සතර ආකාරයේ ප්‍රත්‍යය සමුදය වීම (සහයෝගයෙන් උදාපත් වීම) යන අර්ථයෙන් රූපයේ සමුදය ලක්ෂණය දකින බව දක්වා ඇත. මීට අමතරව නිබ්බත්ත ලක්ෂණය දකන්හටුත්;

(හටගැනගීම් ලක්‍ෂණය) රූපස්ඛන්ධයාගේ උදය දක්නේ යැයි දක්වා ඇත.

මෙසේ මෙම පස් ආකාරයෙන් රූපස්ඛන්ධයාගේ උදය දක්නේ යැයි සඳහන් වේ. රූපයේ වය ලක්‍ෂණය දැක්වීමට ඉහත ආකාර 05ට සමගාමී ආකාර 05ක් දක්වා ඇත. අවිද්‍යා, තණ්හා ආදි ප්‍රත්‍යය නිරෝධයෙන් ඵලය වන රූපස්කන්ධය නිරෝධ වන බව දකිමින් වය ලක්‍ෂණය ප්‍රකට වන බවත්, විපරිණාමය දකිමින්ද වය ලක්‍ෂණය ප්‍රකටවන බවත් දක්වා ඇත.

"අවිජ්ජා නිරෝධා රූප නිරෝධෝති පච්චය නිරෝධට්ඨේන රූපක්ඛන්ධස්ස වයං පස්සති, තණ්හා නිරෝධා රූප නිරෝධෝති, පච්චය නිරෝධට්ඨේන රූපක්ඛන්ධස්ස වයං පස්සති , කම්ම නිරෝධා රූප නිරෝධෝති, පච්චය.....,
"ආහාර නිරෝධා ... වයං පස්සති"

විපරිණාම ලක්ඛණං පස්සන්තෝපි රූපක්ඛන්ධස්ස වයං පස්සති. රූපක්ඛන්ධස්ස වයං පස්සන්තෝ ඉමානි පංචලක්ඛණානි පස්සති"

මෙසේ ආකාර 10කින් උදය වය දක්නා බව පෙන්වා දී තිබේ. වේදනා සංඥා, සංඛාර ස්කන්ධයන්ගේත් මෙලෙසම ආකාර 10 බැගින් උදය-වය දක්නේ යැයි සඳහන් වේ. වෙනසකට ඇත්තේ "ආහාර සමුදයා" වෙනුවට "ඵස්ස සමුදයා" ලෙස යොදා තිබීමයි. විඤ්ඤාණ ස්කන්ධය සඳහා එතැන 'නාම-රූප සමුදයා විඤ්ඤාණ සමුදයෝ ' ලෙස යොදා ඇත.

සියලු ආකාර සැලකූ විට 50ස් ආකාරයක් දක්වා ඇත. මෙයින් 40ස් ආකාරයක්ම ප්‍රත්‍යය, ප්‍රත්‍යෝත්පන්න සම්බන්ධය සැලකීම, තුලින් උදය වය දක්නා බවක්ය දක්වා තිබෙනුයේ.

නිබ්බත්ති ලක්ඛණය හා විපරිණාම ලක්ඛණය දැකීම යන්නෙන් අදහස් වනුයේ කුමක්දැයි පමණකි දැන් ගැටළුව වනුයේ. බුද්ධ ජයන්ති පරිවර්තනයේ නිබ්බත්ති යන වචනයට ("අද්ධා-සන්තති-ඛණ) වශයෙන්" ලෙස අර්ථයක් යෝජනාකර ඇත. පාලියේ නැති එම අර්ථය පරිවර්තනයේදි ආවේ පටිසම්භිදාමග්ග අට්ඨකථාවෙනි. මෙම කෘතියේ මෙතෙක් ආ විවරණය අනුව, එවන් අර්ථකථනයක් පරිවර්තනයට පැමිණි ආකාරය පාඨකයන්ට සිතාගත හැකියයි ද සිතමි.

ඉහත 'අද්ධා' ලෙසින් අදහස් කළේ භව පරියාපන්නව එනම් සත්වයෙකුගේ එක භවයක් පුරාම පවතින රූප ඒකත්වයෙන් ගෙන (විශේෂයෙන් කර්මජ රූප) එහි උදය වය දක්නා බවකි. ඛණ ලෙසින් අදහස් කළේ ක්ෂණ මාත්‍ර වූ කුඩා කාල වශයෙනි.

නිබ්බත්ති යන්නෙහි සරළ අදහස හටගැනීම, මතුව ඒම යන්නයි. පෙර සංයුක්ත නිකායේ, ස්කන්ධ වර්ගයේ, උප්පාද සංයුක්තයේ ඨිති, අභිනිබ්බත්ති යන වචන සමාන්තරව යෙදෙන ආකාරය උපුටා දක්වන ලදි. යමක් 'සිටීද' එය හටගත් දෙයකි. යමක් හටගනීද එය වෙනස් වෙමින් හෝ සිටී. මේ නිසා අප යෝජනා කරනුයේ "පෙර නොතිබී හේතුන්ගෙන් හටගත් බව" මෙම නිබ්බත්ති යන වචනාර්ථයට සුදුසු බවයි.

විදර්ශනා කිරීමේදි සමහර කෙනෙක් තමන්ට අරමුණු වන නාම-රූප ධර්මතා මේ මේ හේතුන්ගෙන් හටගත්තේ යැයි නිශ්චිතව, එම නාම-රූප ධර්මවලට සුවිශේෂී හේතු දකිමින් සටින අවස්ථාද ඇත.

සමහර විටක නිශ්චිත වශයෙන් සුවිශේෂී හේතුන් නොදකින නමුත් සතිමත් බව හා ඤාණය ඔස්සේ මෙය යම් හෝ හේතුවක ඵලයක් යැයි වටහා ගන්නා අවස්ථා ද ඇත. පෙර නොතිබී හටගත් බවද දැනගනී. එවන් අර්ථයක්ය මෙතනදි දිස්වනුයේ.

විපරිණාමය

දැන් ඒ ඒ ස්කන්ධයන්ගේ විපරිණාමය දකින විට වය ලක්ෂණය දක්නේ යැයි යමක් කීවේද එය විග්‍රහ කිරීමට කාලයයි. මෙතනදී ළඟින් යන වචන 03ක අර්ථ සැසඳිය යුතුය. ඨිතස්ස අඤ්ඤතත්තං, වෙනස්වීම හා විපරිණාමය යන වචන ඉතා ළඟින් යන අර්ථ සහිතය.

නාම-රූප ධර්මයක, එහි පවත්නා කාලය තුල උච්චාවචනයන් වීම 'ඨිතස්ස අඤ්ඤතත්තං' යන්නයි. උත්පාදක්ෂණයේදී සිත ගොඩනැගෙමින්, බලවත් වෙමින් පවතින විටත් වෙනස්වීමක් විචලනයක් දිස්වන නමුත්, කෙනෙකුට එයින් වය ලක්ෂණය ප්‍රකට නොවේ. නාම ධර්මය තව තවත් ස්ථාවර වන බැවිනි. නාම-රූප ධර්මයන් දුර්වල වෙමින් පවතින බව දකින විට හෝ එය නැත්තටම නැතිවී ඇති බව දකින විට වය ලක්ෂණය ප්‍රකට වේ.

උදාහරණයක් ලෙස මළ සිරුරක් දකින විට හෝ සිහිවන විට, සජීවි ශරීරයක නැතිවී යාම ප්‍රකට වේ. වය ලක්ෂණය ප්‍රකට වේ. මෙසේ විපරීත වූ, විපරිණාමයට ලක්වූ ශරීරයක් දකින විට, එයට සම්බන්ධව පැවති සජීවි ශරීරයක හෝ 'අන්වයේ ඤාණය ඔස්සේ' වෙනත් සජීවි ශරීරයක් ගැන හෝ වය ලක්ෂණය ප්‍රකට කරගත හැක.

දැන් මළ සිරුර, සජීවි ශරීරයේ "ඨිතස්ස අඤ්ඤතත්තං" අවස්ථාව නොවේ. ඨිතස්ස අඤ්ඤතත්තං කියන එක පැනවෙන්නේ ඒ ඒ ධර්ම ස්වභාවයටය. සංඛත ලක්ෂණ 3 සජීවි ශරීරයටත්, මළ සිරුරටත් වෙන වෙනම පැනවෙනවා. සජීවි ශරීරයක් සැම විටම කුණු වී ගිය මළ සිරුරක් බවට පත්නොවේ. කෙනෙක් මැරුණු විගසම පුච්චලා දාන්න පුළුවන්.

මේ නිසා විපරිණාමය හෝ වෙනස්වීම යන වචන නාම-රූප ධර්ම සමූහයක් හෝ සන්තතියක් අපේක්ෂා කොට භාවිතා වන බවත්, භාවිතා කළහැකි බවත්, "ඨිතස්ස අඤ්ඤතත්තං" යන්න ඒ ඒ නාම-රූප ධර්මයට සුවිශේෂි ලෙස යෙදිය යුතු බවකුත් පෙනේ.

නවසීවථික භාවනාවේ බුදුරජාණන් වහන්සේ මළ සිරුරක විවිධ අවස්ථා දක්වන්නට හේතුවූ එක් කරුණක් ලෙස පෙනෙන්නේ, ඒ ඒ අවස්ථා නැති වන බව දැක්වීමට. ඒ ඒ රූප ස්වභාවයෝ අස්ථි, නහර, මස් ආදි අවස්ථා නැතිවන බව දැක්වීමට. එය ඒත්තු ගැන්වීමට. අවස්ථා නවයට වෙන වෙනම සමුදය වය දක්වලා තියෙනවා. ඇත්තෙන්ම එතන කායානුපස්සනා නවයක් දැක්වෙනවා. මෙතනට කාලය පටලවා ගන්න අවශ්‍ය නෑ. කාලය පටලවා ගත්ත නිසයි, අර බුදුරජාණන් වහන්සේ පෙන්වපු අනිත්‍යතාව මදි වුණේ. එවිට කායානුපස්සනාව විශ්වාසයෙන් වඩන්න බැරිවෙනවා.

සමහර අයට වය ලක්‍ෂණය සිතට නංවලා දෙන්න නවසීවථිකයේ යාබද අවස්ථා 2ක් කීවාම, ඒ කියන්නේ ඉදිමුණු ශරීරය ගැන කියලා ඊට පසු මස්නැති ඇටසැකිල්ල සමග නහර ඇති අවස්ථාව ගැන කීවාම, ඒ අය අහනවා " ඒක සම්මුති වශයෙන් අනිත්‍ය දැකීමක් නේද? අපට පරමාර්ථ වශයෙන් අනිත්‍ය දකින හැටි කියලා දෙන්න කියලා"

ඒ කථා ඔක්කොම ථේරවාද අභිධර්මයේ එන ක්‍ෂණ භංග කථාවේ හා සම්මුති පරමාර්ථ කථාවේ පටලැවිලි. පරමාර්ථ සම්මුති කථාවෙන් එන පටලැවිල්ල ලිහාග න්න ඊට වඩා අමාරුයි. අප විසින් සම්පාදනය කළ "අභිධර්මය නොවන අභිධර්මය" ග්‍රන්ථයේත් මුල් බුදු සමය සොයාගත්තේමි" යන ග්‍රන්ථයේත් ඒ ගැන විස්තර තිබෙනවා.

උදය වය ඤාණයේ ක්‍ෂණ භංග ගැන සඳහනක් නැති නම් භංගානුපස්සනා ඤාණයේ කෙසේ දැයි අවධානය යොමු කළයුතු වනවා.

භංගානුපස්සනා ඤාණය

පටිසම්භිදා පාලියෙහිය මේ ගැන විස්තර සඳහන් වනුයේ. එහි භංගානුපස්සනා ඤාණ නිර්දේශය යටතේ මෙසේ සඳහන් වේ.

"රූපාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති, තං ආරම්මණං පටිසංඛා තස්ස චිත්තස්ස භංගං අනුපස්සති"

"වේදනාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති, ... පෙ... සංඥාරම්මණතා...පෙ... සංඛාරාරම්මණතා.... පෙ... විඤ්ඤාණාරම්මණතා..... පෙ... චක්ඛාරම්මණතා..... පෙ... ජරාමරණාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති, තං ආරම්මණං පටිසංඛා තස්ස චිත්තස්ස භංගං අනුපස්සති"

"අනුපස්සතීති කතං අනුපස්සතීති : අනිච්චතෝ අනුපස්සති, නො නිච්චතෝ දුක්ඛතෝ අනුපස්සති නො සුඛතෝ...... පෙ... නො ආදියති."

මෙම භංගානුපස්සනා යනුවෙන් අදහස් කරන්නේ වර්තමාන නාම ධර්මයන් වේගයෙන් බිඳියෑමක් කෙරෙහි යෝගාවචරයෙකු දැනුවත් වෙමින්, අවධානය පවත්වන අවස්ථාවක් යැයි බොහෝ දෙනා කල්පනා කරති. නමුත් එයද එසේම නොවේ.

භංගානුපස්සනාව ගැන තේරුම් ගැනීමට එය නොවන්නේ කුමක්දැයි වටහාගැනීම පහසුවක් වනු ඇත. මුලින්ම කිවයුත්තේ මෙම අනුපස්සනාව නාම ධර්ම සඳහා පමණක් අදාල බවයි. රූපවල භංගයක් ගැන පටිසම්භිදාවේ භංගානුපස්සනා නිර්දේශයේ සඳහනක් නැත.

ඉහත පාලියේ සඳහන් වූයේ "රූප ආරම්මණයක් ඔස්සේ සිතක් හටගෙන බිඳෙන බවත්, එම අරමුණ සලකා බලා (නුවණින්), එය ඔස්සේ හටගත් සිතෙහි බිඳියාම දකින බවයි. මීළඟට වේදනා සංඥා ආදි නාම ධර්මත් ඇස, කණ ආදි ආයතනත් අරමුණු කොට හටගන්නා සිත් ගැනත් එසේම දක්වා ඇත.

සිත සමග එහි ආරම්මණයත්, එම සිතේ බිඳියාමක් ගැනත් මෙම ඤාණයට සම්බන්ධව කියවෙන නිසා, ආරම්මණයේ අනිත්‍යතාවය දකිමින්, එම අරමුණේ වෙනස්වීම හෝ බිඳියාමෙන් එම සිත බිඳියන්නේ යැයි සමහරෙක් සිතති.

ආරම්මණයේ අනිත්‍යාතාවය, එම සිතේ බිඳියාමට බලපානුයේ පච්චුප්පන්න හෙවත් වර්තමාන ආරම්මණ ගන්නා සිත් ආකාර සමහරක් සඳහා පමණි. උදාහරණයක් ලෙස ශබ්දය අරමුණු කරගත් සෝතවිඤ්ඤාණයක් ගතහොත්, එම ශබ්දයේ බිඳියාම හෝ ක්ෂය වීම සෝතවිඤ්ඤාණයේ බිඳියාමට බලපානු ඇත.

නමුත් අතීත ධර්මයක් අරමුණු කරගත් සිතක භංගයට, එම අරමුණේ අනිත්‍යතාවය අදාල නැත. එම අරමුණ කවදා හෝ හටගෙන නැති වූ බව, එය දැන් ආරම්මණය කරන සිතේ භංගයට සෘජුව බල නොපායි. එම අතීත ධර්මය කොහොමටත් දැන් නැත. එය දැන් නැති වුවත් වර්තමාන සිතෙන් එය තිබුණාවූ ආකාරය ආවර්ජනය කිරීමක්, සිහිපත් කිරීමක්ය සිදු කරනුයේ. වර්තමාන සිත බිඳෙනුයේ එයට පෙර සිතෙන් ලැබුණා වූ සමනන්තර අනන්තර ආදි ප්‍රත්‍යය ශක්තීන්ගේ දුර්වල වීමත්, සහජාත හේතූන් ගේ දුර්වල වීමත්, විටෙක වස්තු රූපයේ දුර්වල වීමත් ආදිය නිසාය.

ඕනෑම සිතක් හටගැනීමට පට්ඨාන නය ක්‍රමයට අනුව ආරම්මණ ප්‍රත්‍යයක අවශ්‍යතාවය අනිවාර්යය. නමුත් අතීත, අනාගත ආදි ධර්ම අරමුණු කරන සිතකට, එය පවත්නා

කාලය තුල එයට ලැබෙන ආරම්මණ ප්‍රත්‍යයේ විකලත්වයක්, ආරම්මණයේ අනිත්‍යතාවය නිසා පැන නොනැගේ.

අනාගතය අරමුණු කරන සිතකටත් මෙසේමය. අනාගතයේ හටගන්නට ඇති ධර්මයන් බිඳෙන්නේ අනාගතයේය. එම අනාගත ධර්මයේ අනිත්‍යතාව, එය දැන් අරමුණු කරන සිතේ භංගයට කිසිලෙසකින් වත් බල නොපායි.

මෙම භංගානුපස්සනාවට අදාලව සිහි කරනු ලබනුයේ වර්තමාන ආරම්මණ සහිත සිත් පමණක් විය හැකි දැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන. ඉහත උදෘත පාලියේ විඤ්ඤාණ, වේදනා, සංඥා ආදි චිත්ත චෛතසික ධර්මයන් ද අරමුණු ලෙස දක්වා තිබේ. තම සන්තානයේ හටගත් නාම ධර්ම අරමුණු කළ හැක්කේ අතීත හෝ අනාගත වශයෙන් පමණි. වර්තමාන සිතින් එම සිතම දැකිය නොහැක. පිහියෙන් එම පිහියම කැපිය නොහැක්කාක් මෙනි.

තවද ධ්‍යාන සිත් වලින් ගන්නා බොහෝ අරමුණුත් සැබෑවට හට නොගන්නා, තුන්කාලයට අදාල නොවන ධර්ම නිසාත්, එම ධ්‍යාන සිත්වල භංගයට එම ආරම්මණයේ අනිත්‍යතාවයක් අදාල නොවේ.

භංගානුපස්සනාවේදි පෙර හටගෙන නැතිව ගිය ඕනෑම ආකාරයේ සිතක බිඳියාම දැකීම අපේක්ෂා කරන නිසාත්, චක්ඛුවිඤ්ඤාණ, සෝතවිඤ්ඤාණ ආදි පච්චුප්පන්න ආරම්මණ ගන්නා සිත් ආකාර කිහිපයක පමණක් භංගය දැකීමකට සීමා නොවන නිසාත්, ආරම්මණයේ අනිත්‍යතාවය ඔස්සේ, එම ආරම්මණය ගන්නා සිතේ භංගය දැකීමක් මෙයින් අදහස් නොවන බව මින් පැහැදිලිය.

සමහර පාරිසරික රූප නැතිවීයාම නිසා, ඒවා ඔස්සේ අනාගතයේ හටගැනීමට තිබූ චිත්ත චෛතසිකවල අනුත්පාද නිරෝධයක් සිදුවේ. එසේ වන බව මෙනෙහි කිරීම, හටගත්

සිතක භංගය දැකීමක් නොව අනුත්පාද නිරෝධයක් දැකීමය. සන්තති නිරෝධයක් දැකීමය.

එසේ නම් ඉහත ඤාණ නිර්දේශයේ "ආරම්මණං පටිසංඛා" ලෙස ආරම්මණය සලකා බලා (නුවණින්) ලෙස කුමක් අදහස් වනුයේද?

ඕනෑම චිත්ත චෛතසිකයක් ආරම්මණයෙන් තොරව විග්‍රහ කළ නොහැකිය. ආරම්මණය විභාවනය වූ ආකාරයමය විඤ්ඤාණය වනුයේ. ආරම්මණය ඔස්සේ ආපස්සට බලා, එම ආරම්මණය ගත් චිත්ත, චෛතසික ප්‍රකට කරගත හැකිය.

උදාහරණයක් ලෙස ටිකකට කලින් හටගෙන නැතිව ගිය චක්ඛුවිඤ්ඤාණයක භංගය සලකා බලන විට එම චක්ඛුවිඤ්ඤාණය හෙවත් පෙනුණු බවෙහි අනිත්‍යතාවය මතුකරගැනීමට පෙරාතුව එම විඤ්ඤාණයේ ආකාරය සිහි විය යුතුය. කුමන ආකාරයේ පෙනුණු බවක් පැවතියේ දැයි නැවත දැනුවත් විය යුතුය. එම පෙනුණු බව ඊට සුවිශේෂී වූ රූපාරම්මණයෙන් තොරව කිසිසේත් විස්තර කළ නොහැක. එය ගැන දැනුවත් වූ බවම චක්ඛුවිඤ්ඤාණය නිසාය.

ඊට යාබද සිත් කිහිපය යනුද, එම වර්ණ රූපය නොයෙකුත් වස්තු ලෙසින් හෝ ගොනුකරගන්නා බවමය. එම චක්ඛුවිඤ්ඤාණයේ ආකාරය ගැන දැනුවත් වීම හා සිහිපත් වීම මතය, එහි අනිත්‍යතාවය දැකගත හැකි වනුයේ.

ආරම්මණ ප්‍රභේදය හා ඒ තුලින් චිත්ත චෛතසික මතුකරගන්නා ආකාරය විදර්ශනාවට ඉතා වැදගත් වන බැවින් එය පිළිබඳ විස්තරාත්මක අවබෝධයක් ලබාගැනීමට උනන්දු වන ලෙස ආරාධනා කරමි.

ආරම්මණ ග්‍රහණය අදාල වනුයේ නාම ධර්ම සඳහා පමණි. ඒ නිසා රූපවල බිඳීමක් ගැන භංගානුපස්සනා ඤාණ නිර්දේශයේ සඳහන් කිරීමේ අදාලත්වයක් නැත.

ඉතාම ආසන්න අවස්ථාවක (මොහොතකට පෙර) බිඳුණු සිතක් වේවා, බොහෝ කලකට පෙර තිබූ සිතක් ගැන හෝ වේවා, මෙම අනුපස්සනාවට අදාලය. නමුත් ආසන්න සිත් වර්තමානයේ සන්තානයේ පවතින කෙළෙස්වලට වඩාත් සම්බන්ධ බැවින්, ඒවායේ භංගය නිතර මෙනෙහි කිරීම වැදගත්ය.

තත්පරයකදි සිත් කෝටිගණනක් හටගෙන නැතිවන බවට සමහර ථේරවාද ආචාර්ය මතයක් ඇත. එයින් එකක් විශිෂ්ට ඤාණයෙන් අරමුණු කොට භංගය දැකීමක් මෙම ඤාණය සම්බන්ධව කිසිසේත් අදහස් නොවන බව නම් කිව යුතුය. එසේ වන්නේ වුවද එය බුද්ධ විෂය මිස ශ්‍රාවක විෂය නොවේ. කොතරම් වේගයෙන් බිඳුණත් සිතක ස්වභාවය යෝගා වචරයෙකුට අරමුණු කර ගත හැකිය. එහි උප්පන්නභාවය සලකාගෙන ඉන්පසු එහි වය ලක්‍ෂණය දැකීමය මෙයින් අදහස් කරනුයේ. බලා සිටිත්දි අතීත සිතක් කිසි විටෙකත් බිඳෙන්නේ නැත. එය වර්තමාන සිත පවතින ලෝකයෙන් අතුරුදහන් වූවාද නොවේ. නැති නොවුනාද නොවේ.

ආසන්නයේ සිතිවිලි දෙස බලන විට, දැන් ඇති දෙයක් දෙස අවධානය යොමු කරනවාක් මෙන් යෝගාවචරයකුට වැටහිය හැක. පෙර තිබුණාවූ දැන් නැති දෙයක් ගැන අනුපස්සනා කරන බව ප්‍රගුණ යෝගාවචරයා දැනගත යුතුය.

සන්තතියක අනිත්‍යතාවය

උදය-වය ඤාණයත්, භංගානුපස්සනා ඤාණයත් මෙසේ විග්‍රහ වන විට, එසේම ක්‍ෂණය යනුවෙන් කුඩා කාල පරාසයක් අදහස් නොකරන විට කෙනෙකුට ප්‍රශ්ණයක් මතුවිය හැක. විශේෂයෙන් රූප සම්බන්ධයෙන් ගත් විට, බොහෝ දෙනා අසා තිබෙන්නේ එක් තැනක දිස්වන රූපයක් ඒ ආකාරයෙන්ම බොහෝ වෙලාවක් දිස්වනුයේ, නැවත නැවත

එකම ආකාරයේ රූප එතැන එතැනම හටගන්නා නිසා යැයි කියාය. එනම් රූප සන්තතියක පැවැත්ම නිසා එසේ දිස්වන බවය. සංතති ආකාරයේ රූපවල පැවැත්මක් නැතුවා නොවේ. බුදු හිමියන් ද "රූපස්ස සන්තති" ලෙසින් එවන් කරුණක් සඳහන් කොට ඇත.* (ධර්මසංගණිප්‍රකරණය-රූපකාණ්ඩය)

විදුලි බල්බයකින් පිටවන ආලෝකයේ තත්පරයකට 50ස් වරක් පමණ ගැස්මක් ඇත. (සංඛ්‍යාතයක්) නමුත් එකදිගට එය දැල්වී තිබෙන්නේ මෙන් පෙනේ. එනමුත් එම ආලෝකයේ අනිත්‍යතාවය ගැන අවධානය යොමුකරන විට විදර්ශනා යෝගියෙකුට අවශ්‍ය වනුයේ, එම ගැස්මේ ප්‍රමාණය දැනීම නොව, ඕනෑම මොහොතක දිස්වන වර්ණය, හේතූන්ගෙන් පවතින්නාක් ලෙස දැකීමත්, එම වර්ණය දෙයක් කරනොගෙන එය ස්වාභාවයක් ලෙස දැකීමත්ය.

"රූපං භික්ඛවේ අනිච්චං, යෝපි හේතු යෝපි පච්චයෝ, රූපස්ස උප්පාදාය, සෝපි අනිච්චෝ, අනිච්ච සම්භූතං භික්ඛවේ රූපං කුතෝ නිච්චං භවිස්සති ''
(සහේතු අනිච්ච සූත්‍රය, ස.නි. ඛන්ධ වග්ග)

"මහණෙනි, රූපය අනිත්‍යයි. රූපය ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍ය වේද, එයද අනිත්‍යයි. අනිත්‍ය දෙයකින් හටගත් රූපය මහණෙනි කෙලෙස නිත්‍ය වන්නේද?"

සමහර රූප ඉතා කෙටි කාලයක් පවත්නා බව, එනම් එකම විදියට දිස්වනුයේ සන්තතියක පැවැත්ම නිසා යැයි වටහා ගැනීම එක්තරා ආකාරයකට රූප පිළිබඳ කලකිරීමක් ඇතිකරගැනීමට ප්‍රයෝජනවත්ය. ප්‍රායෝගික අර්ථයක් ඇත. නමුත් මගඵල ලැබීමට සපිරිය යුතු අනිවාර්ය සාධාණයක් නොවේ. වෛද්‍ය විද්‍යාත්මක හා ඉලෙක්ට්‍රොනික විද්‍යාවන්හීදි නම් විශේෂයෙන් එම දැනුම ප්‍රයෝජනවත්ය.

ක්ෂණයක් පාසා ධර්මයන් නොබිඳී ක්ෂණ දෙකක් පාසා බිඳුනොත් බුදුන් වහන්සේ වදාළ ධර්ම න්‍යායන්ට එය ගැටළුවක් වේද. ක්ෂණය කොතරම් ලොකු වූ විටද බුදුදහම අසත්‍ය වනුයේ ?

ථේරවාද ධර්ම ඇඳුතුව

මෙතෙක් සඳහන් කළ කරුණු සම්පිණ්ඩනය කොට ථේරවාද අභිධර්මය තුල එකට ඇදෙමින් ධර්ම න්‍යායන් ව්‍යාප්ත වූ ආකාරය කොටු සටහනක් මගින් පහත දක්වා ඇත. නාම-රූප ධර්මයන්ගේ ආයුෂය නිශ්චිත කොට සැලකීමත්, ක්‍ෂණය යනුවෙන් කුඩා අංශුමාත්‍ර කාලයක් අදහස් කරගැනීමත් මුල්කරගෙන ත්‍රිපිටක අභිධර්මයේ දක්නට නොලැබෙන නොයෙකුත් ධර්ම සිද්ධාන්ත බිහිවූ ආකාරය එය තුලින්ද පැහැදිලි වනු ඇත.

83 ථේරවාද ක්ෂණ භංග න්‍යායේ කාලානුරූප ව්‍යාප්තිය පිළිබඳ දළ රූප සටහන



ථේරවාද ක්ෂණ භංග න්‍යායේ කාලානුරූප ව්‍යාප්තිය පිළිබඳ දළ රූප සටහන



ඉහත නාම රූපවල ආයුෂය නිශ්චිත කිරීමේ සිට ඨිතික්‍ෂණයක් බිහිවීමත්, පසුව එම ක්‍ෂණත්‍රය සංඛත ලක්‍ෂණයන් සඳහා අනුයාත කිරීමත්, මේ සියළු කරුණු නිසා අනිත්‍ය මෙනෙහි කිරීම අධිසංකීර්ණ, ප්‍රායෝගික නොවන තත්වයකට යොමු වූ අයුරුත් වටහාගන්න. ථේරවාද අභධර්මයේ එන පරමාර්ථ සම්මුති කථාවත් මේ සඳහා බලපෑවේය.

තවද මෙම කෘතියෙහි පෙන්වා දුන් පරිදි එවිට අභිධර්ම පෙළත්, නොයෙකුත් සූත්‍ර දේශනා සමගත් බොහෝ සෙයින් නොගැලපීම් මතුවිය. චිත්ත හා සංඛාර යමකය සමගද, ප්‍රථම ආනන්ද සූත්‍රය හා සංඛත ලක්‍ෂණ සූත්‍රයන් සමගත් විශේෂයෙන් බොහෝ පරස්පරතා ඇතිවය. නාමරූපවල ආයු කාලය නිශ්චිත ලෙස සැලකීම හෝ එසේ නොසැලකීම එතරම් වැදගත් කාරණයක් ලෙස මුලින් නොපෙනුනත් මෙම කෘතියෙන් ඉදිරිපත් වු කරුණු මනාව අධ්‍යයනය කිරීමෙන් එය විපස්සනාව සම්බන්ධ මූලික සිද්ධාන්තයන් වෙත කොතරම් බලපෑමක් කරන්නේදැයි වටහා ගතයුතුව ඇත.

"ඛණය හෙවත් ක්‍ෂණය අර්ථ දක්වන ආකාරය ද විපස්සනාවේ මූලික ආකල්පයන් කෙරෙහි දැඩි බලපෑමක් සිදු කරන බවද පෙන්වා දෙන ලදි. මෙසේ නොයෙක් අතට සම්බන්ධයක් ඇති නාම-රූප ධර්මවල ආයුකාලය නිශ්චිත වීම වැනි විශ්වීය ධර්මතාවයක් බුදුරජුන් අභිධර්මය දේශනා කරද්දි, සඳහන් කළ යුතුම කාරණයක් බව, බුද්ධිමත් පාඨකයෙකුට සරළ තර්ක බුද්ධිය තුලින් පෙනෙනවා ඇති. එය සත්‍යය නම් බුදුරජුන් අටුවා මගින් එය ලොවට ඉදිරිපත් නොකරනු ඇත.

සෘජුවම ධර්මසංගණියේ රූපකාණ්ඩය ආරම්භයේදි, ඒකක කාණ්ඩයේදි "සබ්බේ රූපා සත්තරස චිත්තක්ඛණිකා" (සියලු රූපයනට චිත්තක්‍ෂණ 17ක් ආයු ඇත) ලෙසින් ඉදිරිපත්

කරනු ඇත. මෙතරම් සරළ තර්කයක් මගින් අභියෝගයට ලක්විය හැකි කාරණයක්ව තිබියදිත්, පුරාණ ථේරවාද ආචාර්යවරු එය ත්‍රිපිටක අභිධර්මයෙහි අන්තර්ගත කිරීමට තරම් පටු නොවීම ගැන එම තෙරුන් වහන්සේලාට ප්‍රශංසා කළ යුතුය.

නාම රූපවල ආයුකාලය නිශ්චිත ලෙස සැලකීම එක්තරා ආකාරයකට ප්‍රායෝගික ජීවන අත්දැකීම් සමග ගළපා ගැනීමේදිද ගැටළුවක් පැන නගී. පැය ගණනක හිසරදයක් පවතින විට, සිදුවී ඇත්තේ දුක්ඛ සහගත කායවිඤ්ඤාණය නැවත නැවතත් හටගැනීමය. පට්ඨාන නය ක්‍රමයට අනුව දුක්ඛ සහගත කායවිඤ්ඤාණයට පෙරාතුවක්, පසුවත් පහළ වන සිත් උපෙක්ෂා සහගතය. එම සිතට පෙරාතුව හටගන්නා පංචද්දවාරාවර්ජන සිතත්, පසුව එන සම්පටිච්ඡන, සංතීරණ, වොත්ථපන ආදි සිතුත්, උපෙක්ෂා සහගතය. පංචද්වාරාවර්ජනයට පෙරාතුව එන භවංග සිත් ඇති විටත් ඇත්තේ උපේක්ෂා සහගත බවක් හෝ සෝමනස්ස සහගත බවකි.

මෙවන් සිත් දාමයක් නැවත නැවත චක්‍රීයව සිදුවීමය, පැය ගණනක හිසරදයක් ලෙසින් දිස්වනුයේ (අතරමැද වෙනත් චිත්ත වීථි නැතුවා නොවේ) එසේ ඇතිවිට සෑම සිතකම ආයු කාලය සමාන ලෙස ගතහොත්, උපේක්ෂා සහගත සිත් වැඩි නිසා, වැඩි කාලයක් කැක්කුම තිබුණා ලෙස නොව, උපෙක්ෂා වින්දනයක ජීවිතය පැවතුණු බව ප්‍රකට විය යුතුය. නමුත් එය එසේ නොවේ. අතීත කර්ම ශක්තියෙන් මෙහෙයවන ලදුව දුක්ඛ සහගත කායවිඤ්ඤාණය වැඩි කාලයක් පවත්නා බව, වැඩි ආයුෂයක් දරන බව උපකල්පනය කළ හොත් (අනෙක් යාබද සිත්වලට වඩා) මෙම ගැටළුව නිරාකරණය වනු ඇත.

අවිනිශ්චිත කරුණු

ඇත්තෙන්ම අටුවා ටීකාවල රූපයක ආයුකාලය සම්බන්ධයෙන් ගත්කළ පොදු එකඟතාවයක් නැත. විවිධ මත තිබෙනවා. පුරාණ හෙළ අටුවාවේ තිබුණා යැයි සඳහන් වෙන්නේ 16ක් කියලා. බුද්ධඝෝෂ හිමියන් යමකප්ප්‍රකරණයේ කාරණයක් ඉදිරිපත් කරළා එය 17ක් විය යුතුයි කියල අදහසක් ඉදිරිපත් කළා. නැවත අභිධර්ම මූලටීකාවේ මෙය 16ක් විය යුතු බවට තර්කයක් ඉදිරිපත් වුණා.

මේ වගේ අවිනිශ්චිත කරුණු මත තමන්ව සසරින් එතෙර කරවන විදර්ශනා භාවනාවේ පදනම් තබාගැනමී බුදුධීගොචර නෑ. ත්‍රිපිටකයේ ඇති නිශ්චිත කරුණු මතම විදර්ශනාවෙ පදනම් ගොඩනගා ගතයුතු බවයි අපගේ අදහස.

බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂ කිහිපයකට පසු බිහි වූ නොයෙකුත් නිකායන් අතරින් අභිධර්ම කාරණා ගැන ථේරවාදයට අමතරව වඩාත් උනන්දුවක් දැක්වූයේ " සර්වස්ථිවාදි" නිකායයි. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව භාරතයේ සිටි කනිෂ්ක[3] රජතුමාගේ කාලයේ මෙම සරවස්ථි වාදින්ගේ අදහස් වඩාත් ව්‍යාප්තව පැවතුන බවක් පෙනේ. කථාවස්ථුපකරණයේද ඔවුන්ගේ අදහස් වලට විරුද්ධව කරුණු දක්වා ඇති බැවින් තෙවන ධර්මසංගායණාව පැවති අවදිය වන විටත් එම නිකාය බිහිවූ තිබූ බවක් පෙනේ.

ඔවුන්ගේ නාම-රූප ධර්ම සම්බන්ධ විග්‍රහයන් තුලද රූපයක ආයුකාලය චිත්තක්ෂණ මෙපමණැයි කියා හෝ ථේරවාදයේ දැක්වෙන කාරණයට ළඟින් හෝ නෑකම් කියවෙන කරුණක් නොදක්නා ලදි. බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂ දෙකකට පසු යුගයේ සම්පාදනය වූ

[3] . **අධෝලිපි බලන්න.**

කථාවස්ථුපකරණයේද නාම-රූප සම්බන්ධ නොයෙකුත් අන්තර් සම්බන්ධතා දැක්වෙන කිසි තැනෙක එවන් කරුණක් නොදක්නා ලදි. මේ සියළු කරුණු අනුව පෙනෙුයේ මෙම ථේරවාද අභිධර්මයට සුවිශේෂී වූ විග්‍රහයන්, ලංකාවේ අනුරාධපුර යුගයේ හෙළ අටුවා ඇඳුරු පරපුර තුල බිහිවූ ධර්ම න්‍යායන් බවයි.

ථේරවාද අභිධර්මය තුල චිත්ත වීථියක ජවන සතක් යායුතු බව දක්වා ඇත. චක්ඛුද්වාරික චිත්තවීථියක් නම් එහි භවංග උපච්ඡේදයේ සිට පංචද්දවාරාවර්ජන, චක්ඛුවිඤ්ඤාණ, ආදි සිත්පෙළ ගණනය කළහොත් ජවන් 07ට පසුව පැමිණිය හැකි තදාරම්මණ සිත් 02ත් සමග චිත්ත වාර 15ක් ලැබේ. මෙම සියලු සිත් සඳහා එකම රූපාරම්මණයක් (භවංග උපච්ඡේදය හැරෙන්නට) ඉලක්ක වූවා යැයි යමෙක් උපකල්පනය කළහොත්, එම රූපාරම්මණයට අවම ලෙසින් චිත්ත වාර 15කට වඩා වැඩි පැවැත්මක් තිබිය යුතුය.

හෙළ අටුවා යුගයේදි වර්ණ රූපයක ආයුකාලය එම නිසා අවම වශයෙන් චිත්තක්ෂණ 16ක් වත් විය යුතු යැයි මතයක් බිහිවන්නට ඇත. පසු යුගයකදි එම අවම යන්න හැලී ගොස් එය නිශ්චිත වශයෙන් 16 ලෙස ගැණුනා විය හැක. පසුව පෙර සඳහන් කළ පරිදි අටුවාචාරීන් වහන්සේ එය 17ක් විය යුතු බවට ඉදිරිපත් කළ මතය ස්ථාපනය වූවා විය හැක. එසේ නැත්නම් රූපයක ආයුකාලය චිත්තක්ෂණ 16-17 යන්න මුලින් බිහිවී එය සමග සැසඳීමට චිත්ත විථියක උපරිම වශයෙන් ජවන් 7ක් විය යුතු යැයි කාරණයක් මතුවූවා විය හැක.

ථේරවාද අභිධර්මයේ ඉහත දුර්වලතා පෙන්නුම් කළද, එම අටුවා ටීකා වලින් ඉදිරිපත්වන දැනුම් පද්ධතියේ වටිනාකම අමතක නොකළ යුතුය. අද කාලයේ ථේරවාදය

හැරෙන්නට විශේෂයෙන් අන්තර් ජාලය තුල විපස්සනාව ගැන ඉදිරිපත්වන විවරණ බොහෝ විට ව්‍යාකූලය. ඊටත් වඩා අවුල් ජාලයකි. බොහෝ දෙනා විඤ්ඤාණවාදයට හෝ ශූන්‍යතාවාදයට හසුව තිබේ. සමහරුන් ඒවා ථේරවාදය යැයි සිතා අධ්‍යයනය කරති. කුසලාකුසල වශයෙන් භේද වූ අනන්‍ය වූ ධර්මවල පැවැත්ම පිළිගන්නා බව ථේරවාද අභිධර්මයේ මූලික ලක්ෂණයකි.

සියල්ල මායාවක්, බොරුවක්, සියල්ල සාපේක්ෂ යැයි කියවෙන කිසිත් හරයක් නැති, ක්‍රමානුකූල ප්‍රතිපදාවක් ඉදිරිපත් නොවන විවරණ සැලකූ විට ථේරවාදය ඊට වඩා ක්‍රමවත්ය. එමනිසා ථේරවාද අභිධර්මයේ මෙම දුර්වලතා මගහරවාගෙන ඉදිරියට යා හැකි නම් අගනේය. නැතිනම් ත්‍රිපිටක අභිධර්මය පදනම් කරගෙන අභිධර්මය හැදෑරීම කළ යුතුය.

යෝජනා

මෙම කෘතිය තුලින් ස්ථාපනය කිරීමට කරුණු දැක්වූ මූලික කාරණා මෙසේය.

1. චිත්ත චෛතසික හා චිත්තසමුට්ඨාන රූප සඳහා පමණක් උත්පාදක්ෂණ හා භංගක්ෂණ වශයෙන් ඒවායේ පවත්නා බව දෙකොටසකින් නිරූපණය කිරීම.

2. එම උත්පාදක්ෂණය හා භංගක්ෂණයට අමතරව ඨිතික්ෂණයක අවශ්‍යතාවයක් මතු නොවීම.

3. අනිත්‍ය මෙනෙහි කිරීමේදි කුඩා ක්ෂණ මාත්‍ර වූ කාලයක් ගැන අවධානය යොමු කිරීම තේරුමක් නැති බව වටහා ගැනීම.

4. ධර්මයක උප්පන්න බව සලකාගෙන එහි අනිත්‍යතාවය මෙනෙහි කළයුතු බව වටහා ගැනීම.

5. හේතු ඵල න්‍යායට අනුගතව අනිත්‍ය මෙනෙහි කිරීම.

6. සංඛත ලක්ෂණ තුන ශ්‍රාවකයෙකු විසින් ප්‍රායෝගිකව දැකිය යුතු දෙයක් බව තේරුම් ගැනීම.

7. කාලය ගෙවීයාමෙන් නොව හේතු නිරෝධයෙන් ධර්මතාවයක නිරෝධය අපේක්ෂා කිරීම.

8. සිතක හා රූපයක ආයුකාලය නිශ්චිත නොකිරීම.

9. ඒ තුලින් අභිධර්මය නියති වාදයකට ගණිත ක්‍රමයකට නැඹුරු වීම වැළැක්වීමත් බුදුදහම අකිරිය වාදයකට යෑම නැවැත් වීමත්ය.

10. ධර්මතාවයක, පවත්නා කාලය තුල සිදුවන විචලනයන් ජරාව ලෙසින් අර්ථ නොදැක්වීම.

මෙලෙස ගත්විට ත්‍රිපිටකයේ කිසිදු තැනකට නොගැලපමීක් හෝ ' පරසප්රතාවයක ' නොදකනා ලදි. ප්‍යොයොග්කි විපස්සනා මාර්ගයක් එළි පෙහෙලි වන බව පෙනේ.

අධෝලිපි

1. ථේරවාද අභිධර්මය තුල චිත්තයක ආයුකාලය කුඩා ක්ෂණ 03කින් නිරූපණය වන විට, චිත්ත වාර 17ක් සඳහා කුඩ ක්ෂණ 51 ක් ලැබේ. රූපයක උත්පාදක්ෂණය හා භංගක්ෂණය සඳහා කුඩා ක්ෂණ 02ක් වැය වන විට ඉතිරි ක්ෂණ 49, ඨිතික්ෂණයේ ආයු කාලය ලෙස ථේරවාදය තුල සැළකේ. එනම් චිත්තක්ෂණ වශයෙන් ගත්විට 16ක් පමණ වේ.

(16×3 =48)

2 . සංඛාර

සංඛාර යන වචනය ත්‍රිපිටකය තුල මූලිකව අර්ථ දෙයාකාරයකින් යෙදේ.

1 . අන්‍ය ධර්මයන් සකස් කිරීමට, හටගැන්වීමට හේතුවන ධර්ම

2 . එසේ හේතූන්ගෙන් සකස් වූ ධර්ම, එනම් ඵල ධර්ම

හේතුවන ධර්ම සැළකූවිට, චේතනාව නැමති ධර්මතාවය මූලිකත්වයක් උසුලන බැවින්, ඊට සංඛාර යන වචනය නිතර ව්‍යවහාර කෙරේ. හේතූන්ගෙන් සකස් වූ ධර්ම යන අරුත් දීමට අභිසංඛත සංඛාර යන වචනය යෙදේ.

සංඥා, වේදනා චිත්ත සංඛාර ලෙස යොදා තිබෙන්නේ ඉහත සඳහන් අර්ථ දෙයාකාරයටම වෙනස්වය. නමුත් පළමු ආකාරයට වඩාත් සමීප අර්ථවත්ය. සිත සමඟ යෙදුණු, ඊට ප්‍රතිබද්ධ වුණු ධර්ම යන අරුතින්ය. සංඛාර යන වචනය ත්‍රිපිටකයේ යෙදෙන තැන අනුව එහි අර්ථ ගත යුතුය.

3 . චිත්තසමුට්ඨාන රූප

සියළු රූප, සතර මහාභූතත් උපාදාය රූපත් ලෙසින් දොකොටසකට බෙදනු ලැබේ. තවද රූප සකස් වීමේ සුවිශේෂී හේතු සළකාගෙන සියළු රූපාකාර සතර ආකාරයකට වර්ගීකරණය කළහැක.

1 . කර්මජ රූප
2 . චිත්තසමුට්ඨාන රූප
3 . ඍතුජ රූප
4 . ආහාරජ රූප

1. කර්මජ රූපඃ- අතීත කර්ම ශක්තියේ බලපෑමෙන් නැගී සිටින රූප කර්මජ රූප නම් වේ. ඇස කණ ආදි කර්මජ රූප ඊට උදාහරණයි.

2. චිත්තසමුට්ඨාන රූපඃ- සත්වයෙකුගේ ඒ ඒ සිත සමග නැගී සිටින රූප චිත්තසමුට්ඨාන රූප යැයි කියවේ. ඊට චිත්තජ රූප කියාද ව්‍යවහාර කරයි.

චේතනාත්මකව අඟපසඟ සෙළවීමේදී ඒ ඒ සිතට අනුරූපව, ශරීර ඉරියව් පැවැත්වීමට රුකුල් දෙන ලෙස, ශරීරයේ නොයෙක් තැන මෙම ආකාරයේ රූප හටගනී. බිය වූ විට හදවතේ ගැස්ම වැඩිවීම, තරහ ගිය විට ඇඟ වෙව්ලීම, රාග සිතුවිලි අනුව නොයෙකුත් හෝමෝන ක්‍රියාවලි ආරම්භ වීම යනාදිය චිත්තසමුට්ඨාන රූප ප්‍රකට වන තවත් අවස්ථාවන්ය. හුස්ම වැටීම හෙවත් ආශ්වාස-ප්‍රශ්වාස ක්‍රියාවලියද එළෙසම සිත ඇතිවිටම හටගන්නකි. එනිසා ආස්වාස - ප්‍රාස්වාස හෙවත් කායසංඛාර චිත්තසමුට්ඨාන රූපයක් යැයි කියනු ලැබේ.

පරණ දැක පුරුදු රූප නැවත සිහිවන විට, අමරුණු වන විට සමහර කෙනෙක් චිත්ත රූප පෙනෙනවා, චිත්ත රූපයක් සිතට ආවා යැයි කියනු අසන්නට ලැබේ. එය චිත්තජ රූපයක් නොවේ. එය ආරම්මණ මාත්‍රයක් පමණී. චිත්තසමුට්ඨාන රූප යනු සැබෑවටම නැඟී සිටින, සැබෑවටම හටගන්නා රූප ස්වභාවයකි.

4 . කනිෂ්ක රජතුමාගේ රාජකාලය ක්‍රි.ව. පළමු සියවසට දිවයයි.

ක්ෂණ භංග දැකීම, ථේරවාදය හා විපස්සනාව

බෙල්ලන්විල ධම්මානන්ද හිමි

බොහෝවිට බෞද්ධයන් පරිසරයේ අන්‍යාකාරයක් දකින විට, නැතිනම් කෙනෙකුගේ ශරීරය බොහෝ සෙයින් වෙනස්ව ඇතිසේ දකින කොට මෙහෙම කියනවා.

"බලන්න බුදුරජාණන් වහන්සේගේ වචනය කොතරම් සත්‍යයද, මේ ලෝකේ සියල්ලම වෙනස් වෙනවනේ, වෙනස් නොවන කිසි දෙයක් නෑනේ, මේ ඔක්කොම අනිත්‍යයයි, මේ මනුස්සයාගේ ඉස්සර තිබුණ පෙනුම දැන් නැහැනේ"

ඔය කථාවට අතිපණ්ඩිත අභිධාර්මිකයන් කියන්නේ මෙහෙමයි.

"ඔය වෙනස්වීම කාටත් පෙනෙනවනේ, ඕක කියන්න බුදු කෙනෙක් ලෝකෙට පහළ වෙන්න ඕනායෑ, ඔහොම දැක්කයි කියලා නිවන් දකින්න බෑ. සියුම්ව අනිත්‍යතාවය දකින්න ඕනා. පරමාර්ථ වශයෙන් අනිත්‍යතාවය දකින්න ඕනා."

ඔය ආකාරයට කියලා අර මුලින් අනිත්‍යතාවය ගැන කියපු කථාව අවප්‍රමාණය කරනවා. ඇත්තෙන්ම කියන්න තිබුණේ අනෙකක්.

ISBN 978-624-93161-0-2

9 786249 316102